ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව

2018 වර්ෂය සඳහා
වාර්ෂික වාර්තාව සහ ගිණුම්

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

දැක්ම

ගංවතුරින් තොර පරිසර හිතකාමී පරිසරයක් සහ දූෂණයෙන් තොර ජලාශ ඇතිකිරීමේ සහ කළමනාකරණය කිරීමේ ප්‍රමුඛයා වීම.

මෙහෙවර

ඉහළ අභිප්‍රේරණයක් සහිත ශ්‍රම බලකායක් මඟින් විශිෂ්ඨ කාර්ය සාධනයක් අත් පත් කර ගැනීමෙන්,

- ජලාපවහනය වැඩිදියුණු කිරීමේ සහ කළමනාකරණය කිරීමේ ගංවතුර කළමනාකරණ කාර්යයන්, ජලාපවහන උපදේශන කාර්යයන් සහ පහත් බිම් කළමනාකරණ කටයුතු;

- යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, ගොඩකිරීමේ කාර්යයන් තුළින් ස්වයං තිරසාරත්වය සාක්ෂාත් කර ගැනීම සහ පවත්නා වත්කම්වලින් සහ නව ව්‍යාපාර අවස්ථාවලින් උපරිම ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීම

සඳහා ඉංජිනේරු හා කළමනාකරණ සේවා සැපයීම.

පටුන

	පිටු අංකය
සභාපතිවරයාගේ පණිවුඩය	1
සංයුක්ත තොරතුරු	3
අධ්‍යක්ෂ මණ්ඩලය	4
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම	5
සංවිධාන ව්‍යුහය	6
මෙහෙයුම් සමාලෝචනය	7
මූල්‍ය සමාලෝචනය	75
අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව	76
විගණකාධිපති වාර්තාව 2018	78
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය	97
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය	98
හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය	99
මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය	100
වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති	101
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	106
සංස්ථාවේ මූල්‍ය විශේෂතා	117

සභාපතිවරයාගේ පණිවුඩය

හිතවත් පාර්ශවකරුවනි,

2018 මූල්‍ය වර්ෂය ශ්‍රීලඉගොසංස සඳහා තවත් සාර්ථක වසරක් වන අතර සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද ගිණුම් ඉදිරිපත් කිරීමට ලැබීම මට මහත් සතුටකි. ගරු පාඨලී චම්පික රණවක අමාත්‍යතුමා විසින් ලබාදුන් මඟ පෙන්වීම හා උපාය මාර්ගික නායකත්වය යටතේ අහිතකර බාහිර තත්ත්වයන් හමුවේ නොසැලී සිටීමට සංස්ථාවට හැකියාව ලැබුණු අතර විවිධාකාරයෙන් වැඩිදියුණුවට පත් විය. සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව විසින් සිදු කරන ලද මෙහෙයුම්වලදී මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දැක්ම වන " ජනතාවගේ ආර්ථික හා අධ්‍යාත්මික යහ පැවැත්ම හා ස්වභාව ධර්මයට අනුකූලව ජීවත්වීම තහවුරු කරනු ලබන තිරසර නාගරික ජීවිතයක්" සපුරා ගැනීම සමඟ මැනවින් ගැලපුණු බව මම විශ්වාස කරමි. 2018 මූල්‍ය වර්ෂය සංස්ථාවට සාර්ථක වර්ෂයක් වූ බව සඳහන් කිරීමට කැමති වන අතර ඉතා හොඳින් ඉටු කළ කාර්යය වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට, ශ්‍රීලඉගොසංස ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට සහ අනෙකුත් කාර්ය මණ්ඩලයට මම සුබ පතමි.

වර්ෂාවසානයේදී සංස්ථාවේ මුළු පිරිවැටුම රු. මිලියන 7,097ක්ද බදු පසු ලාභය රු. මිලියන 1,148ක්ද වූ අතර මුළු වත්කම් ප්‍රමාණය රු. මිලියන 17,502ක් දක්වා වැඩි විය. ශ්‍රීලඉගොංස එහි වසර 50 ක ඉතිහාසය තුළ බදු පසු ඉහළම ලාභය 2018 වර්ෂයේදී අත්කර ගෙන ඇති බව ආඩම්බරයෙන් යුතුව ප්‍රකාශ කර සිටිමි.මෙම මූල්‍ය වර්ධනය සඳහා බොහෝදුරට දුර දක්නා කළමනාකාරිත්වය සහ ශක්තිමත් මූල්‍ය විනය හේතු වී තිබේ. වර්ෂය තුළදී සැලකිය යුතු අභියෝගයන්ට සංස්ථාවට මුහුණ දීමට සිදු වූ අතර ඒවා ප්‍රවේශමෙන් කළමනාකරණය කිරීමෙන් වත්මන් ප්‍රගතිය සාක්ෂාත් කර ගැනීමට හැකි විය.

රු. මිලියන 1,873ක මුළු පිරිවැටුමක් සහ කියුබ් 269,147ක විකුණුම් ධාරිතාවයක් සමඟින් විශාලතම ආදායම් දායකත්වය වෙරළබඩ වැලි විකිණීමෙන් සහ සම්බන්ධිත ආදායම්වලින් වාර්තා විය. වෙරළබඩ වැලි සේදීමේ සහ හැලීමේ යන්ත්‍රාගාරයක් සහ වෙරළබඩ වැලි බෑග් ඇසිරීමේ යන්ත්‍රාගාරයක් මුතුරාජවෙල ප්‍රදේශයේ පිහිටුවීම සඳහා කටයුතු කරමින් පවතී. මීලඟ වර්ෂයේදී මෙය යථාර්තයක් වනු ඇත. ගංඟා වැලිවල ලක්ෂණවලට සමාන නමුත් ගංගා වැලිවලට තරඟකාරී වාසියක් ලබා දිය හැකි වෙරළබඩ වැලි සාපේක්ෂව ඉතා අඩු මුදලකට වෙළඳපොළට ලබා දීමට මෙමඟින් හැකියාව ලැබෙනු ඇත. ඉදිකිරීම් කර්මාන්තයට අඛණ්ඩව වෙරළබඩ වැලි සැපයීම සහතික කිරීම සඳහා, මුතුරාජවෙල තොග ගබඩාවට වෙරළබඩ වැලි කැණීම සහ පොම්ප කිරීම සඳහා ජාත්‍යන්තර කැණීම් කොන්ත්‍රාත්කරුවෙකුට කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කරන ලදී.

පෝර්ට් සිටි ව්‍යාපෘතියේ සාර්ථකත්වය මත බස්නාහිර කලාපීය මහානගර සැලැස්ම යටතේ මැරයින් සිටි ව්‍යාපෘතියට සමගාමීව කොල්ලුපිටිය දෙහිවල දක්වා මුහුදු තීරය ගොඩකිරීම ක්‍රියාත්මක කිරීමේ සංකල්පයක් ඇති විය. ශ්‍රීලඉගොසංස නව ව්‍යාපාර අංශයකට පිවිසීමට මෙය හොඳ අවස්ථාවක් ලෙස සලකනු ලැබීය. පෙර නොවූ විරූ මෙම මුලපිරීම ශ්‍රීලඉගොසංස සුවිශේෂී ක්‍රියාකාරකමක් වනු ඇති අතර මෙම ව්‍යාපෘතිය කර්මාන්ත විශේෂඥයෙකු සමඟ හවුල් ව්‍යාපාරයක් ලෙස ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

දුෂ්කර හා කාලය වැයවන කාර්යයක් වන ජාත්‍යන්තර කොන්ත්‍රාත්කරුවන් බාහිරින් ලබා නොගෙන ශ්‍රීලඉගොසංස හි සෘජු මැදිහත්වීම යටතේ වෙරළබඩ වැලි කැණීම් හා පොම්ප කිරීම සඳහා ට්‍රේලිං සක්ෂන් හොපර් ඩ්‍රජෙර් (TSHD) යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා කටයුතු ආරම්භ කරන ලදී. මෙමඟින් රට තුළ විදේශ විනිමය රඳවා ගැනීමට හැකිවන අතරම වැලි කැණීමේ පිරිවැය සැලකිය යුතු ලෙස අඩු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මුතුරාජවෙල ප්‍රදේශයේ නිදන්ගත ගංවතුර තත්ත්වය අවම කිරීමේ අරමුණින් නව මුහුදු පිටවානක් වන දික්ඕවිට ගංවතුර ගේට්ටුව ආරම්භ කරන ලදී. කැළණි ගඟේ ඉහළ ජල මට්ටම්වලදී පැලියගොඩ ප්‍රදේශයේ ගංවතුර තත්ත්වය සමනය කිරීම සඳහා සැලසුම් සහ ගොඩනැගීමේ ව්‍යාපෘතියක් ලෙස ඔලියමුල්ල පොම්පාගාරය ආරම්භ කරන ලදී.

සමාලෝචිත වර්ෂය තුළදී, 2013 වර්ෂයේදී ආරම්භ කරන ලද වේරස් ගඟ වැසි ජල අපවහන හා පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට අදාළ කාර්යයන්ගෙන් 65% ක් සම්පූර්ණ කිරීමට ශ්‍රීලඉගොංස හැකි විය. මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ අදාළ ද්‍රෝණියේ ප්‍රධාන වශයෙන් තුගේගොඩ, රත්නපිටිය සහ බොරලැස්ගමුව යන ප්‍රදේශවල ගංවතුරට ඔරොත්තු දෙන පරිසරයක් නිර්මාණය කිරීමයි. මීට අමතරව, ජල පෙරටු විනෝදාත්මක ක්‍රියාකාරකම්, අත්තිඩිය කුරුළු පරාදීසය පුනරුත්ථාපනය කිරීම, ජලයෙන් ඇතිවන රෝග වළක්වා ගැනීම සහ බෙල්ලන්විල වගුරු බිම ආරක්ෂා කිරීම වැනි පරිසරය හා බැඳුනු අංගයන් මෙම ව්‍යාපෘතිය පාරිසරික වශයෙන් තිරසාර එකක් බවට

පත් කර ඇත. 2018 වර්ෂය තුළ ව්‍යාපෘති පිරිවැය රු. මිලියන 1,018 කි. තවද මෙම ව්‍යාපෘතිය ඌන උපයෝජිත වගුරු බිම් ජනප්‍රිය පොදු විනෝදාත්මක අවකාශයන් බවට පරිවර්තනය කළේය. "කෙලිමඬල" යනු එවැනි එක් පරිවර්තනයක් වන අතර එය විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා කැප වූ ශ්‍රී ලංකාවේ ප්‍රථම ළමා උද්‍යානය බවට පත්විය

මහා භාණ්ඩාගාර ප්‍රදාන යටතේ පනතේ වගකීම් ඉටු කිරීම සඳහා සංස්ථාව විසින් සඳහා රු. මිලියන 1,348ක පිරිවැයකට කොළඹ කලාපය හා ඒ අවට ඇළ මාර්ග නඩත්තු කිරීමේ සහ රටේ බොහෝ ප්‍රදේශවල පරිසරය වැඩිදියුණු කිරීමේ කාර්යයන් සිදු කර ඇත.

මීතොටමුල්ල ව්‍යසනයෙන් පසු කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා ශ්‍රීලඉගොංස විසින් මෙහෙයවනු ලබන කෙරවලපිටියේ පිහිටි අපද්‍රව්‍ය කළමනාකරණ උද්‍යානය, සේවය සපයා ඇත. අපද්‍රව්‍ය කළමනාකරණය ශ්‍රීලඉගොංස වේ ප්‍රධාන විෂයයක් නොවූවත්, ජාතික ගැටලුවක් විද්‍යාත්මකව විසඳීමට මෙම මැදිහත්වීම දායක වී තිබේ. ජෛව හායනයට ලක්විය හැකි ඝන අපද්‍රව්‍ය වලින් කොම්පෝස්ට් පොහොර මෙට්‍රික් ටොන් 936.3 ක් නිෂ්පාදනය කිරීමට අපද්‍රව්‍ය උද්‍යානයට හැකි විය.

බස්නාහිර කලාපයේ මහානගර සැලසුම් ව්‍යාපෘතිය යටතේ නගරබද මාර්ග තදබදය අවම කිරීම සඳහා අභ්‍යන්තර ජල ප්‍රවාහන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

දිවයිනෙහි වාණිජ අගනගරයේ ගංවතුරට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ශාන්ත සෙබස්තියන් උතුරු දියගුළු පොම්පාගාරය ඉදිකිරීම ආරම්භ කිරීම සංස්ථාව ලත් සුවිශේෂී ජයග්‍රහණයකි.

ඇතිවිය හැකි ගංවතුර තත්ත්වයන් තත්‍ය කාලීන පදනමින් අධීක්ෂණය කිරීමට සහ පුරෝකථනය කිරීමට හැකි සහ ගංවතුර හානි අවම කිරීම සඳහා ගේට්ටු සහ පොම්පාගාර වැනි පාලන ව්‍යුහයන් සමඟින් කළමනාකරණය කිරීමට හැකි තථ්‍ය කාල ඒකාබද්ධ ගංවතුර කළමනාකරණ පද්ධතියක් (RTC) සැපයීම සහ ස්ථාපනය කරමින් පැවතීම තවත් වැදගත් ප්‍රධාන මැදිහත්වීමකි.

ශ්‍රී ලංකාවේ වාණිජ අගනුවර වන කොළඹ නාගරික සංවර්ධනයේ ඉහළම මට්ටම සහ නාගරීකරණය හා සම්බන්ධ අභියෝගයන් නිදර්ශනය කරයි. නාවල, කිරිමණ්ඩල මාවතෙහි මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් යෝජනා කරමින් මෙම ගැටළුව දීර්ඝ කාලීන තිරසර ව්‍යාපෘතියක් සමඟ විසඳීමට මෙම සංස්ථාව මූලිකත්වය ගෙන තිබේ.

තවද, අගනගරයට ආසන්න මධ්‍යම ආදායම් නිවාස ගැටලුව විසඳීම සඳහා සංස්ථාව ඉල්ලුම් සමීක්ෂණයක් සම්පූර්ණ කර ඇති අතර රාගම යෝජිත මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘතියක් සඳහා නිවාස වර්ග හඳුනාගෙන ඇත.

විශේෂ සටහනක් ලෙස සංස්ථාවේ අනුබද්ධ සමාගම්වල ක්‍රියාකාරිත්වය සඳහන් කිරීමට කැමැත්තෙමි. මේ වනවිට සංස්ථාව යටතේ අනුබද්ධිත සමාගම් දෙකක් ඇත, ඒවා නම් "ඉඩම් ගොඩකිරීම් සහ සංවර්ධන සමාගම (REDECO ජනප්‍රියව ඇති) සහ "LRDC සර්විසස් (පෞද්) සමාගම " යි. සංස්ථාවට සේවා සපයන්නෙකු ලෙස වෙරළබඩ වැලි විකිණීමේ ව්‍යාපාරයට පිවිසීම වැනි ක්‍රියාකාරකම් මගින් හුදෙක් ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදකයෙකු වීමට වඩා 2018 වර්ෂය තුළදී REDECO සිය සේවා කළඹට වැඩි සේවාවක් එක් කිරීමට පියවර ගෙන තිබේ. දිනකට කියුබ 1,000 ක් ලබා දීමේ ධාරිතාවය සමඟින් මුතුරාජවෙල සේදීමේ සහ හැලීමේ යන්ත්‍රාගාරයක් පිහිටුවීම සහ වැලි බෑග් වෙළඳපොළට හඳුන්වාදීම මෙම වසර තුළ කැපී පෙනේ. මෙම අවශ්‍යතාවය සපුරාලීම සඳහා වර්ග අඩි 50,000 කට වඩා වැඩි භූමි ප්‍රමාණයක් සහිත පෙර-පිරිසැකසූ යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීම මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතී

LRDC සර්විසස් (පෞද්.) සමාගම ද 2018 වර්ෂය තුළ සැලකිය යුතු කාර්ය සාධනයක් ලබා ඇත. 2017 ට සාපේක්ෂව 21% ක වර්ධනයක් පෙන්නුම් කරමින් 2018 වර්ෂය සඳහා එහි පිරිවැටුම රු. මිලියන 2,004 ක් විය. සීසීටීවී ආරක්ෂක කැමරා පද්ධති හඳුන්වාදීම, දේශීය හා චීන සමාගම් සඳහා මිනිස්බල සැපයුම් කොන්ත්‍රාත්තු, සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම සහ සමාගම උපායමාර්ගික සැලැස්මකට පෙළගැස්වීම වැනි දෑ 2018 වසර තුළ ලත් කැපී පෙනෙන ජයග්‍රහණ විය.

වර්ෂය තුළදී ලබා දෙන ලද ඔවුන්ගේ වටිනා මගපෙන්වීම හා දායකත්වය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට හා කළමනාකාරිත්වයට ස්තුති කරමින් අවසන් කිරීමට මම කැමැත්තෙමි. අපගේ සේවකයින්ට සහ විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන පාර්ශවකරුවන්ටද මම ස්තුතිවන්ත වන අතර ඔවුන්ගේ කැපවීම නොවන්නට වත්මන් කාර්ය සාධනය සාක්ෂාත් කර ගැනීමට හැකියාවක් නොලැබෙනු ඇත. සෑමවිටම මෙන්, මම අපගේ ගනුදෙනුකරුවන් වෙත කෘතඥතාව පළ කරන අතර ඉදිරි මූල්‍ය වර්ෂය තුළ ඔවුන්ගේ අවශ්‍යතා වඩාත් හොඳින් ඉටු කිරීමට බලාපොරොත්තු වෙමි.

රොෂාන් ගුණවර්ධන
සභාපති

සංයුක්ත තොරතුරු

නීතිමය තත්ත්වය

කොළඹ දිස්ත්‍රික්කයේ පහත් බිම් ප්‍රදේශ ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩලය යනුවෙන් මින් පෙර හඳුන්වනු ලැබූ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව, 1968 අංක 15 දරන පාර්ලිමේන්තු පනතින් සංස්ථාගත කරන ලදී. 1976 අංක 27 දරන සංශෝධන පනතින් සංස්ථාවේ පරමාර්ථ පුළුල් කරන ලදී. 1982 අංක 52 දරන සංශෝධන පනතින් මණ්ඩලයේ නම ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව යනුවෙන් වෙනස් කොට එහි බලප්‍රදේශයද මුළු දිවයිනම ආවරණය වන පරිදි පුළුල් කරන ලදී. 2006 අංක 35 දරන පනතින් ඉහත කී පනත තවදුරටත් සංශෝධනය කරන ලද අතර අනවසර ගොඩකිරීම් සහ ජල මූලාශ්‍ර දූෂණය කිරීමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ බලය එමගින් සංස්ථාව වෙත පවරා ඇත.

ප්‍රධාන කාර්යාලය

අංක 3, ශ්‍රී ජයවර්ධනපුර මාවත
වැලිකඩ
රාජගිරිය.
දුරකථන අංකය: 286369
ඊ-මේල්: mail@sllrdc.lk
වෙබ් අඩවිය: www.landdevelopment.lk

ප්‍රාදේශීය කාර්යාල

- **කොළඹ උතුර**
  ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය
  අවිස්සාවේල්ල පාර
  ඔරුගොඩවත්ත
  වැල්ලම්පිටිය
  දුරකථන අංකය :2532600

- **කොළඹ නැගෙනහිර**
  ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය
  අංක. 28/10 ඒ කිරිමණ්ඩල මාවත
  නාවල
  රාජගිරිය
  දුරකථන අංකය; 2863205

- **කොළඹ දකුණ**
  ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය
  අංක 19, ස්ටැෆෝඩ් පාර,
  කොළඹ 06
  දුරකථන අංකය: 259862

- **මුතුරාජවෙල**
  ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය
  අංක 123, කෙළවරපිටිය
  හැඳල,
  වත්තල.
  දුරකථන අංකය: 3193130

අනුබද්ධිත සමාගම්

- සීමාසහිත ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධන කිරීමේ සමාගම (REDECO)
  අංක 28/10ඒ, කිරිමණ්ඩල මාවත
  නාවල
  රාජගිරිය
  දුරකථන අංකය:2876608
  ඊ-මේල්: lrdcltd1@gmail.com

- එල්.ආර්.ඩී. සර්විසස් (පෞද්.) සමාගම
  අංක 28/10, කිරිමණ්ඩල මාවත
  නාවල
  රාජගිරිය
  දුරකථන අංකය. 2861948
  ඊ-මේල්: info@lrdcservices.com

විගණකවරුන්

විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
306/72, පොල්දූව
බත්තරමුල්ල.

බැංකුකරුවන්

ලංකා බැංකුව
මහජන බැංකුව

නීති උපදේශකවරුන්

නීතිපති
නීතිපති දෙපාර්තමේන්තුව
අළුත්කඩේ,
කොළඹ 12.

අධ්‍යක්ෂ මණ්ඩලය

නම	තනතුර	පත් වූ දිනය
රොෂාන් ගුණවර්ධන මයා	සභාපති ක්‍රියාකාරී අධ්‍යක්ෂ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව	01.03.2018 - මේ දක්වා 30.10.2015 - 28.02.2018
ඩබ්. එම්. ඒ. ඉද්දවල මයා	සභාපති ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව	28.10.2015 - 28.02.2018
පී. ඒ. කේ. ගුණවර්ධන මයා	උප සභාපති ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව	05.03.2018 - මේ දක්වා
ජේ. සී. වැලිගමගේ මෙය (භාණ්ඩාගාර නියෝජිත)	භාණ්ඩාගාර නියෝජිත අතිරේක අධ්‍යක්ෂ ජනරාල් රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරය	02.04.2015 03.05.2018 - නැවත පත් කර ඇත
ආචාර්ය ජගත් මුණසිංහ මයා (නිල බලයෙන් පත් වූ සාමාජික)	අධ්‍යක්ෂ අධ්‍යක්ෂ ජනරාල් ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව	30.03.2016 - මේ දක්වා
ඉංජි. එස්. මෝහන්රාජ් මයා	අධ්‍යක්ෂ අධ්‍යක්ෂ ජනරාල් වාරිමාර්ග දෙපාර්තමේන්තුව	02.11.2017 - මේ දක්වා
එස්. සී. දිද්දෙණිය මයා	අධ්‍යක්ෂ අංක 15, ගෝමිස් උද්‍යානය කොළඹ 05	28.10.2015 - 27.10.2018
සනත් ලංකා රණවීර මයා	අධ්‍යක්ෂ 74/14, සුවිසුද්ධාරාම පාර වැල්ලවත්ත අධ්‍යක්ෂ	02.12.2015 - 13.07.2018
ඉංජි. ඩී. සජ්ජන ද සිල්වා මයා	වැ.බ. අධ්‍යක්ෂ ජනරාල් භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය	17.01.2017 - 13.11.2018 30.01.2019 - මේ දක්වා
රවි ජයවර්ධන මයා	අධ්‍යක්ෂ නීතීඥ	22.06.2018 - 07.01.2019
ඉංජි. ජී. එම්. ඩී. බෝගම්මන මයා	අධ්‍යක්ෂ ඉංජිනේරු	16.08.2018 - 07.01.2019

ජ්‍යෂ්ඨ කළමනාකරණ කණ්ඩායම

01. ඉංජි. කේ. රාජපක්ෂ මයා - වැඩබලන සාමාන්‍යාධිකාරි
02. ඉංජි. ඩබ්.ආර්.සී. ප්‍රනාන්දු මයා - අතිරේක සාමාන්‍යාධිකාරි - (සැලසුම් හා නිර්මාණ)
03. ටී.බී. චන්ද්‍රසේකර මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් සංවර්ධන)
04. ඉංජි. සී.බී. අමරසිංහ මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පර්යේෂණ සහ සැලසුම්)
05. ජේ.ඒ.පී. කේ. ජයසිංහ මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්)
06. ඉංජි. පී. මුතුමාල මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ජලාපවහන සහ ගොඩකිරීම්)
07. ඉංජි. ඒ.එච් තුෂාරි මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (විශේෂ ව්‍යාපෘති)
08. ඉංජි. වයි.පී.සී. ද සිල්වා මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ඉදිකිරීම්)
09. ආචාර්ය එන්.එස්. විජේරත්න මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (තෙත්බිම් කළමනාකරණ)
10. එස්.ඩී. ධර්මරත්න මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සැපයුම් හා ගබඩා)
11. ඒ.ජී. සුමනරත්න මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පිරියත සහ යන්ත්‍රෝපකරණ)
12. ඉංජි. ඩබ්ලිව්.එච්. කීර්තිරත්න මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සැලසුම් සහ ව්‍යාපාර සංවර්ධන)
13. ඉංජි. ආර්.එම්.එන්.ඩී. රත්නායක මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (විශේෂ ව්‍යාපෘති)
14. හේමන්ත කමලසිරි මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ඉඩම් සහ අළෙවිකරණ)
15. එච්.කේ.කේ.ඩබ්. ඒකනායක මිය - ප්‍රධාන නීති නිලධාරි
16. ඉංජි පී.එම්.පී. විජේරත්න මිය - සහකාර සාමාන්‍යාධිකාරි (පර්යේෂණ සහ සංවර්ධන)
17. ඉංජි. එස්.එන්. ගමගේ මිය - සහකාර සාමාන්‍යාධිකාරි (පර්යේෂණ සහ සංවර්ධන)
18. ඕ.වී.ඩබ්.ආර්. ගුණතිලක මයා - සහකාර සාමාන්‍යාධිකාරි (සැලසුම් සහ ව්‍යාපාර සංවර්ධන)
19. ඒ.බී.එන්. සහබන්දු මිය - සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්)
20. ඉංජි. එස්.ආර්.එම්. ප්‍රසාද් මයා - සහකාර සාමාන්‍යාධිකාරි (පිරියත හා යන්ත්‍රෝපකරණ)
21. ඉංජි. කේ.එම්.එන්.කේ. රණසිංහ මයා - සහකාර සාමාන්‍යාධිකාරි (ඉදිකිරීම්)
22. ඉංජි. එම්.එම්.එම්. මවුලර් මයා - සහකාර සාමාන්‍යාධිකාරි (විශේෂ ව්‍යාපෘති)
23. ඒ.එස්.එස්.එම්. වීරක්කොඩි මිය - සහකාර සාමාන්‍යාධිකාරි (සැපයුම් සහ ගබඩා)
24. කේ.එම්.එස්.බී. අතපත්තු මයා - සහකාර සාමාන්‍යාධිකාරි (ගෘහනිර්මාණ)
25. ඉංජි. එස්.එම්.පී.ඩී. සිරිවර්ධන මයා - සහකාර සාමාන්‍යාධිකාරි (ජලාපවහන සහ ගොඩකිරීම්)
26. ඉංජි. එන්.ඒ.ඒ.එස්.වී. නිශ්ශංක මෙය - සහකාර සාමාන්‍යාධිකාරි (සිවිල්)
27. ඉංජි. එන්.පී.එස්. ද සිල්වා මයා - සහකාර සාමාන්‍යාධිකාරි (පර්යේෂණ සහ සැලසුම්)
28. එල්. ත්‍රිමාවිතාන මයා - සහකාර සාමාන්‍යාධිකාරි (මානව සම්පත් සංවර්ධන)
29. ඉංජි. පී. පී. විනීතා මෙය - සහකාර සාමාන්‍යාධිකාරි (පර්යේෂණ සහ සැලසුම්)
30. ඒ.එල්.ඒ.එස්.කේ. අඹේගොඩ මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අභ්‍යන්තර විගණන) රාජකාරී ආවරණය කරයි

සංවිධාන ව්‍යුහය


SRI LANKA LAND RECLAMATION & DEVELOPMENT CORPORATION
Organization Structure
CHAIRMAN
BOARD OF DIRECTORS
SECRETARY TO THE BOARD
GENERAL MANAGER
ADDITIONAL GENERAL MANAGER (Implementation)
ADDITIONAL GENERAL MANAGER (Planning & Designs)
DGM (In. Aud)
DGM (L&M)
DGM (F)
CLO
DGM (Sup)
DGM (HRD/Admin)
DGM (C)
DGM (D&R)
DGM (P&E)
DGM (Wet. Mgt.)
DGM (R&D)
DGM (SP. PRO)
DGM (PL& B.Dev.)
AGM (L&M)
AGM (F)
AGM (SUP.)
AGM(HRD / Admin)
AGM (C)
AGM (Rec.)
AGM(Dre)
AGM(P&E)
AGM (Wet.Mgt)
AGM (Env.)
AGM (DSD)
AGM (Arch)
AGM (Pro & Pru)
AGM(PL)
Fin.Anst
Pro. Speci.
Mkt. Anst
Bus. Dev Anst
Senior Management Level
Middle Management level
Junior Management level
Associate Officer level
Management Assistant-Technical
Management Assistant-Non-technical
Primary level Skilled/ semi skilled/ un skilled
In. Audi.
Mgr. (Land)
Mgr. (Mkt.)
C. Acct
M.Acct
Acct.
Legal Officer
Mgr (Sup)
Mgr (Stores)
Mgr (Trans)
Mgr (Security)
Mgr (HRD)
Mgr (Admin)
Mgr (Tr. & Dev)
Sn. Con Sec.
C. Eng.
Eng.
Mgr. (IT)
Sys. Analyst
Ser.E. A.
T. O.
A.O.
Srv.Drd. Mst
C.Eng
T.Pln
Env. Sci
Ecologist
Env. Offr
Mgr (EMT)
E. M.T.O
Lin. Surv.
Soc. Off
QS
Arch.
D.O.A.
D'man
Admin. Offr.
Acct.
Procu. Eng
Mgr (Mkt)
Mgr (R&D)
R&D. Offr.
In. Au. Off.
Land Officer
Mkt. Officer
Ac.O
Sup Off.
Stores Off.
HRD. Off.
Wel Off
Adm. Off
Inv. Off.
Mkt. Offr.
In.Au. Asst.
Le. Asst.
Mkt. Ast.
Pub. Ast.
Acc. Ast.
Sup. Ast.
St. Ast.
Trn.Ast.
D. A.
Wel. Ast.
Ad. Ast.
Inv. Ast.
Tr. Ast.
R&D Asst.
Supv.
E. A.
T.A./W.S
IT.Te.
Sy. Op.
Sp.H.E.Op.
A.A.
Drd.Mst
W.Sup
Lab. Te.
EMT Ast.
A.OS.
3D De.
D'man
Mgt. Asst.
S.O.
Skilled
Semi Skilled
Unskilled

මෙහෙයුම් සමාලෝචනය
ජලාපවහන සහ ගොඩකිරීම් අංශය

1. භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති

1.1 ඇළ මාර්ග, ජලාශ සහ මංතීරු නඩත්තු කිරීම

1.1.1 කොළඹ නගරය තුළ සහ අවට ප්‍රධාන ඇළ මාර්ග, කුඩා ඇළ මාර්ග සහ ද්විතීයික ඇළ මාර්ග නඩත්තු කිරීම

කොළඹ නගරය තුළ සහ අවට ප්‍රධාන ඇළ මාර්ග පද්ධතිය නඩත්තු කිරීම ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම සහ සංවර්ධනය කිරීම සංස්ථාවේ එක් කාර්යයකි. මෙම කාර්යය සඳහා මහා භාණ්ඩාගාරයෙන් අරමුදල් සපයනු ලැබේ.



කොළඹ ද්‍රෝණියෙහි ප්‍රධාන ඇළ මාර්ග පද්ධතිය ස්වභාවික අපවහන පද්ධතියකි. පද්ධතියෙහි දෙහිවල, වැල්ලවත්ත පිටවාන සහ මෝදර උමං මාර්ගය තුළින් හරවන ලද එක් කුඩා පිටවානක් හරහා සාගරයට සම්බන්ධ වේ. එයට අමතරව, නාගලගම් වීදියේ සහ අඹතලේ ප්‍රදේශයේ කැළණි ගඟට පිටවාන දෙකක් ඇත. අවට වැසි ජලයද බේරේ වැවේ පිටවාන හරහා මුහුදට ගලා බසී.



වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරන ලද කි.මී.41ක දිගින් යුත් කොළඹ නගරයේ ඇළ මාර්ග පද්ධතිය 1979 වර්ෂයේදී මෙම සංස්ථාවට භාර දුන් අතර මහ කොළඹ ගංවතුර පාලන සහ පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කරන ලදී. 1980 වර්ෂයේදී දියවන්නා ඔය ජලාශයක් බවට පත් කරන ලද අතර මෙම ජලාශවල නඩත්තු කටයුතු සඳහා වගකිව යුතු ආයතනය වන්නේ සංස්ථාවයි.



2001 වර්ෂයේදී කොළඹ නගරය තුළ හඳුනාගත් කුඩා ඇළ මාර්ගවල නඩත්තු කටයුතුද සංස්ථාවට භාර කෙරිණි. වර්තමානයේදී ද්විතීයික ඇළ මාර්ගවල දිග කි.මී. 43කි. ස්ථානීය ගංවතුර ඇතිවීම වැළැක්වීම සඳහා කොළඹ මහ නගර සභාව සහ වෙනත් අදාළ පාර්ශවකාර නියෝජිතායතනවල සහභාගිත්වයෙන් ප්‍රධාන සහ ද්විතීයික අපවහන පද්ධතියේ වැඩිදියුණු කිරීම් සිදු කරනු ලැබේ. පවතින ඇළ ඉවුරු ආරක්ෂණය යටතේ ගේබියන් බැමි ප්‍රතිසංස්කරණය කිරීමද සිදු කරන ලදී.

මෙහෙයුම් කාර්යයන් සඳහා ශ්‍රීලඉගොසංස ඔරුගෙ ාඩවත්ත (උතුරු කොළඹ), නාවල, කිරිමණ්ඩල මාවත (නැගෙනහිර කොළඹ), කිරුළපන (දකුණු කොළඹ) සහ මුතුරාජවෙල යන ස්ථානවල ප්‍රාදේශීය කාර්යල 04ක් පවත්වාගෙන යනු ලැබේ. ඇළ මාර්ග නඩත්තු කාර්යයන් සඳහා මතුපිට ශුද්ධ පවිත්‍ර කිරීම, ඇළ ඉවුරු නඩත්තු කිරීම, ඇළ මාර්ග හෑරීමේ කාර්යයන්, භාරන ලද ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම, ගේබියන් පෙට්ටි යොදා ගනිමින් ඇළ ඉවුරු නඩත්තු කිරීම, කැලෑ ශුද්ධ පවිත්‍ර කිරීම, දියවළ ශුද්ධ පවිත්‍ර කිරීම සහ පැති කානු ශුද්ධ පවිත්‍ර කිරීම ආදිය ඇතුලත් වේ. අතින් කරනු ලබන ශුද්ධ පවිත්‍ර කිරීම්වලට අමතරව, ඇළ ඉවුරු සහ ඒවා අවට ප්‍රදේශ ශුද්ධ පවිත්‍ර කිරීම සඳහා සංස්ථාව විසින් ඩ්‍රජේර්ස්, බැකෝ යන්ත්‍ර, ට්‍රැක්ටර සහ ට්‍රක් රථ වැනි බර යන්ත්‍රසූත්‍ර යොදවා ඇත. 2018 වර්ෂය තුළ කොළඹ ඇළ මාර්ග පද්ධතියෙහි නඩත්තු කටයුතු ශ්‍රීලඉගොසංස විසින් සිදු කරන ලද අතර සිදු කරන ලද කාර්යයන්වල මුළු වටිනාකම රු.මිලියන 254.37කි.



1.1.1. අ උතුරු කොළඹ



බේරේ වැව



සෙබෙස්තියන් දකුණු ඇළ මාර්ගය



සෙබෙස්තියන් නැගෙනහිර ජලාශය



උත්තරානන්ද මාවත



උත්තරානන්ද මාවත

1.1.1. අ නැගෙනහිර කොළඹ



1.1.1. ඇ දකුණු කොළඹ



1.1.2 හැමිල්ටන් ඇළ නඩත්තු කිරීම

ඇළ ඉවුරු ආරක්ෂණ ගේබියන් කාර්යයන් ඇතුළුව හැමිල්ටන් ඇළ නඩත්තු කාර්යයන් කැළණි ගඟ අන්තයේ සිට මීගමුව කලපුව දක්වා (දිග කි.මී. 14.3) සහ මීගමුව කලපුවේ සිට මහ ඔය අන්තය දක්වා (දිග කි.මී. 7.7) ශ්‍රීලඉගොසංස විසින් සිදු කරනු ලැබේ. 2018 වර්ෂය තුළ අවශ්‍ය අවස්ථාවලදී විධිමත් ඇළ මාර්ග සහ ඇළ ඉවුරු නඩත්තු කාර්යයන් අප විසින් සිදු කර ඇත.

එබැවින් 2018 වර්ෂය සඳහා සිදු කරන ලද නඩත්තු කාර්යයන්වල මුළු පිරිවැය රු.මිලියන 32.62කි.



1.1.3 පාර්ලිමේන්තුව අවට වැව්/පොකුණු සහ ඒවායේ සම්බන්ධිත ජල පෝෂක ප්‍රදේශ නඩත්තු කිරීම

පාර්ලිමේන්තු සංකීර්ණය පවා ගංවතුර ආපදාවට ලක් වූ 2010 වර්ෂයේ නොවැම්බර් 11 දින ඇති වූ පෙර නොවූ විරූ ගංවතුර සඳහා විසඳුමක් වශයෙන් ශ්‍රීලඉගොසංස අපවහන යෝජනා කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. ගංවතුර තත්ත්වයකදී පාර්ලිමේන්තු සංකීර්ණය සහ අවට ප්‍රදේශය ගංවතුරට යටවීමෙන් ආරක්ෂා කිරීම සඳහා එම අපවහන පද්ධති භාණ්ඩාගාර අරමුදල් යටතේ නිරන්තරයෙන් නඩත්තු කරන ලදී.

ඉහත ජල අපවහන යෝජනා යටතේ, පාර්ලිමේන්තු සංකීර්ණය තුළ සහ අවට ප්‍රදේශයේ ගංවතුර අවම කිරීම සඳහා චෝටර්ස් එජ්, දියවන්නා ගාර්ඩන්, රම්පලාවත්ත, තලවතුගොඩ වැනි ජල රැඳවුම් ප්‍රදේශවල ධාරිතාවය ඉහළ නැංවීම සඳහා ජලාශ/පොකුණු සෑදීම මඟින් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් හදිසි කෙටි කාලීන ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාවට නංවන ලද අතර හැරීම සහ ජල අපවහනය වැඩි කිරීම ආදිය මඟින් කොළඹ නගරය තුළ සහ අවට ජල රැඳවුම් ධාරිතාව වැඩි කිරීම සිදු කරන ලදී. පවත්නා ඇළ පද්ධතිය පිරිසිදු කිරීම, ගංවතුර රඳවා තබා ගැනීමේ ප්‍රදේශ හැරීම, ජලය රඳවා ගැනීමේ පොකුණු නිර්මාණය කිරීම සහ පහත් බිම් ඉඩම් නීති විරෝධී ලෙස පිරවීම පාලනය කිරීම සහ කිඹුලාවල ප්‍රදේශයේ ඉඩම් කෘෂිකාර්මික ඉඩම් බවට පරිවර්තනය කිරීම මෙම ව්‍යාපෘතිවලට ඇතුළත්ය.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ ගංවතුර අවම කිරීම සඳහා දියවන්නා ඔය (පාර්ලිමේන්තු ජලාශය) සහ අවට භූමි ප්‍රදේශය නඩත්තු කිරීම සහ හරිත නගර සංකල්පය සඳහා පරිසරය වැඩිදියුණු කිරීම මඟින් තෙත් බිම් සංරක්ෂණය කිරීම වේ. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ ගංවතුර අවම කිරීම සඳහා දියවන්නා ඔය (පාර්ලිමේන්තු ජලාශය) සහ අවට භූමි ප්‍රදේශය නඩත්තු කිරීම සහ හරිත නගර සංකල්පය සඳහා පරිසරය වැඩිදියුණු කිරීම මඟින් තෙත් බිම් සංරක්ෂණය කිරීම සහ ජල රැඳවුම් ධාරිතාවය ඉහළ නැංවීම මඟින් සහ නාගරික භූමි සැලසුම් ආදිය මඟින් ගංවතුරින් තොර, පරිසර හිතකාමී හරිත පරිසරයක් නිර්මාණය කිරීම වේ.

මෙම ව්‍යාපෘතියේ වෙනත් ප්‍රතිලාභ වන්නේ;

- අනවසර අත්පත් කර ගැනීම් වැළැක්වීම
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
- ජලාශයන්හි ජලයෙහි තත්ත්වය වැඩි දියුණු කිරීම.

ගංවතුරෙන් ආරක්ෂා වීම තුළින් පාර්ලිමේන්තු ඉහළ ජලාධාර ප්‍රදේශයේ සහ අවට ප්‍රදේශවල පදිංචිකරුවන්ට විශේෂයෙන් ප්‍රතිලාභ අත්වන අතර පොදුවේ ගත් කළ මුළු කොළඹ ප්‍රදේශයටම ප්‍රතිලාභ අත් වේ.

2018 වර්ෂය තුළ පාර්ලිමේන්තුව අවට සහ ඒ ආශ්‍රිත ජල පෝෂක ප්‍රදේශවල ඇති වැව්/පොකුණු නඩත්තු කටයුතු කටයුතු සඳහා වැය වූ මුළු පිරිවැය රු.මිලියන 41.65කි.

වෝටර්ස් එජ් - දියවන්නා ජලාශය



කිඹුලාවල



1.1.4 බෙල්ලන්විල ප්‍රදේශයේ සූර්ය විදුලිබල ලාම්පු පද්ධති ඇතුළුව ඇවිදීමේ මංතීරු සහ වාහන නැවැත්වීමේ ප්‍රදේශ නඩත්තු කිරීම

බෙල්ලන්විල ප්‍රදේශය ස්වභාවික තෙත්බිම් සහිත වඩාත් වැදගත් ප්‍රදේශවලින් එකක් වන අතර කොළඹ නගරයේ දකුණු කොටසට යාබදව පිහිටි සීග්‍රයෙන් දියුණුවන ප්‍රදේශයකි. වර්ෂාපතනය ඉහළ යෑම සහ කාලගුණික විපර්යාස සහ අවිධිමත් සංවර්ධන කටයුතු හේතුවෙන් වර්ෂා කාලයේදී මෙම ප්‍රදේශයේ නිරන්තරයෙන් ගංවතුර ඇති වේ.

වේරළ් ගඟ වැසි ජල අපවහන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මෙම ප්‍රදේශයේ සමාජ සහ සංස්කෘතික පසුබිමෙහි වටිනාකම ඉහළ නැංවීම සඳහා අක්කර 37ක වැවක් සහ කෘෂිකාර්මික ඉඩම් සමඟ ඇළ මාර්ග පද්ධතියක් ඉදිකිරීම වැනි දීර්ඝ කාලීන ගංවතුර වැළැක්වීමේ කාර්යයන් ක්‍රියාවට නංවන ලදී.

ආර්ථික සහ සමාජ ක්‍රියාකාරකම් සඳහා මධ්‍යස්ථානයක් ලෙස සහ කොළඹ පුරවර කලාපයේ ජනතාවගේ නිවාස පහසුකම් සඳහා වේරළ් ගංගා ද්‍රෝණිය වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. මෙම නිම්න භූමියේ සමහර ප්‍රදේශ කර්මාන්ත සහ වාණිජ ක්‍රියාකාරකම්වල මධ්‍යස්ථාන වන අතර අනෙකුත් කොටස් ප්‍රධාන වශයෙන් නේවාසික ප්‍රදේශ ලෙස හඳුනාගෙන ඇත. ප්‍රදේශයෙන් නාගරික පැතිරීම සහ දිවයිනේ අභ්‍යන්තර ප්‍රදේශවලින් සංක්‍රමණය වීම හේතුවෙන් මෙම ප්‍රදේශයේ නේවාසික සංවර්ධන විභවය ඉහළ මට්ටමක පවතී. වේරළ් ගඟ අවට ප්‍රදේශය ජල පෙරටු පරිසරයක් ලබා දෙන අතර එය විනෝදාත්මක ක්‍රියාකාරකම් සඳහා මෙන්ම නේවාසික සංවර්ධන සඳහා ජනප්‍රිය ප්‍රදේශයකි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමෙන් තිරසාර සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය වීම පමණක් නොව හරිත පරිසරය පවත්වා ගනිමින් සංචාරක ව්‍යාපාරයද ප්‍රවර්ධනය කරයි.

ඒ අනුව, ජලය රඳවා තබා ගැනීමේ සීමාවේ මායිමක් ලෙස ජල අපවහන ක්‍රියාවට නැංවීම් සමඟ බෙලන්විල ඇවිදින මංතීරු සහ බයිසිකල් ධාවන පථය සංවර්ධනය කර ඇත. ඇවිදීමේ මංතීරු සහ බයිසිකල් ධාවන පථයේ ප්‍රධාන අරමුණ සමඟ තවදුරටත් අනවසරයෙන් අත්පත් කර ගැනීම් වළක්වා ගැනීමට හැකි වී ඇත. ප්‍රධාන අරමුණට අමතරව ඇවිදීමේ මංතීරුවලින් පහත සඳහන් අමතර ප්‍රතිලාභද මහජනතාවට හිමි වේ.

- අවම අමුද්‍රව්‍ය (කළුගල් සහ වැලි) භාවිතයක් යටතේ තණ පිඩලි අල්ලන ලද ප්‍රදේශ මඟින් පරිසරයට හරිත පෙනුමක් ලබා දෙයි.
- බෙලන්විල ඉහළ ජල පෝෂක පක්ෂි අභයභූමිය සඳහා කදිම පරිසර සංවර්ධනයක් ඇති කිරීම.
- විනෝදාස්වාදය ලබා ගත හැකි ස්ථාන නිර්මාණය කිරීම.
- ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය වැඩි දියුණු වීම.
- සංචාරක කර්මාන්තය පදනම් කරගත් ව්‍යාපාර මඟින් නව රැකියා අවස්ථා බිහිවනු ඇත.
- ගංවතුර අවස්ථාවලදී ප්‍රධාන මාර්ගයේ පාංශු ඛාදනය වැළැක්වීම.

මෙම ව්‍යාපෘතිය යටතේ බෙල්ලන්විල ප්‍රදේශයේ පහත දැක්වෙන සංවර්ධන කටයුතු සිදු කරන ලද අතර මේ වනවිට මෙම ප්‍රදේශවල නඩත්තු කටයුතු අප සිදු කරනු ලැබේ.

- වැව (තාවකාලික ජල රැඳවුම් ජලාශය): අක්කර 37
- අපවහන වැඩිදියුණු කිරීමේ ව්‍යුහ (ඇළ මාර්ග, පාලම්, බෝක්කු ආදිය)
- ඇවිදීමේ මංතීරු සහ ඇස්ෆාල්ට් පාපැදි මංතීරුව: කි.මී. 2.84 (සූර්ය බලයෙන් ආලෝකකරණය කරන ලද)
- පිල්ලෑව ප්‍රදේශයේ සහ දෙහිවල මහරගම මාර්ගය අද්දර වෙළඳ කුටි (නිදහස් වෙළඳාම සඳහා)





ශ්‍රීලඉගොසංස විසින් නිර්මාණය කරන ලද හරිත නගරය තිරසරකත්වය සඳහා මෙම ගොඩනැඟිය හැකි ප්‍රදේශයේ වාර්ෂික නඩත්තු කටයුතු ඉතා වැදගත් වේ.

එබැවින් වැඩ කටයුතු සිදු කර ඇති අතර 2018 වර්ෂය සඳහා සිදු කර ඇති නඩත්තු කාර්යයන්වල මුළු පිරිවැය රු. මිලියන 34කි.

1.1.4. අ වැව් සහ ජලාශ නඩත්තු කිරීම



1.1.4. ආ ඇවිදීමේ මංතීරු සහ නාගරික භූමි සැකසීමේ කාර්යයන්



1.1.5 සූර්ය විදුලිබල ලාම්පු පද්ධති ඇතුළුව ඇවිදීමේ මංතීරු සහ වාහන නැවැත්වීමේ ප්‍රදේශ නඩත්තු කිරීම

කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වාණිජ අගනුවර සහ එහි තදාසන්න ප්‍රදේශ ආදර්ශ හරිත, පිරිසිදු සහ ජනතා හිතකාමී නගරයක් බවට සංවර්ධනය කිරීම සඳහා වන සැලසුම් ඉදිරිපත් කරන ලදී.

එබැවින් දියත උයන උද්‍යානය සහ වැව, නාවල තෙත්බිම් උද්‍යානය, ජපන් ශ්‍රී ලංකා මිත්‍රත්ව මාර්ගය, රම්පලාවත්ත වැව සහ කිඹුලාවල ප්‍රදේශය සංවර්ධනය කිරීම ඉහත සංකල්පය සාර්ථකව සාක්ෂාත් කර ගැනීම සඳහා කෙටි කාලයක් තුළ ගංවතුර අවම කිරීමේ විශේෂ ව්‍යාපෘති යටතේ සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති ගණනාවකින් කිහිපයකි. ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවල සහාය ඇතිව ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් මෙම ව්‍යාපෘති සම්පූර්ණ කර ඇති අතර මෙම උද්‍යානවල නඩත්තු කටයුතු ශ්‍රීලඉගොසංස විසින් සිදු කර ඇත.

නිර්මාණය කරන ලද ජල රැඳවුම් පොකුණු ආරක්ෂා කිරීම සඳහා ජපන් මිත්‍රත්ව මාර්ගය, වෝටර්ස් එජ්, කිඹුලාවල සහ චන්ද්‍රිකා කුමාරණතුංග මාවත වැනි ජල රැඳවුම් ප්‍රදේශ සඳහා පරිසර හිතකාමී තණ පිඩලි ඇල්ලූ ද්විතීයික ඉවුරු සැලසුම් හඳුන්වා දී ඇත. පවතින අනවසර ඉඩම් අත්පත් කර ගැනීම් සඳහා අඟල් 4ක වැලි පස් තට්ටුවක් පමණක් එක් කර ඇවිදීමේ මංතීරු සහ ගැටි බැමි සකස් කර ඇති අතර ඇවිදීමේ මංතීරුවලින් පහත සඳහන් වෙනත් අමතර ප්‍රතිලාභද හිමි වේ.

- ගංවතුර අවස්ථාවලදී ප්‍රධාන මාර්ගයේ පාංශු ඛාදනය වැළැක්වීම.
- අවම අමුද්‍රව්‍ය (කළුගල් සහ වැලි) භාවිතයක් යටතේ තණ පිඩලි අල්ලන ලද ප්‍රදේශ මඟින් පරිසරයට හරිත පෙනුමක් ලබා දෙයි.
- නාගරික භූමි අලංකරණ වැඩි කිරීම (ඉවුරු ඔස්සේ රුක් රෝපණය)

- සමාජ ක්‍රියාකාරකම් සඳහා ස්ථාන නිර්මාණය වීම (සෑම මට්ටමකම ජනතාව සඳහා පවුල් වශයෙන් නිදහස්ව හැසිරීමේ හැකියාව)
- ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය වැඩි දියුණු වීම
- සංචාරක කර්මාන්තය පදනම් කරගත් ව්‍යාපාර මඟින් නව රැකියා අවස්ථා බිහිවීම සහ දැකුම්කළු පරිසරයක් ඇති වීම.

2018 වර්ෂය සඳහා සිදු කර ඇති කාර්යයන්වල මුළු පිරිවැය රු.මිලියන 69කි.

1.1.5.ඈ චෝටර්ස් එජ්



1.1.5.ආ කිඹුලාවල

ජපන් මිත්‍රත්ව ඇවිදීමේ මංතීරුව



කිඹුලාවල ඇවිදීමේ මංතීරුව



1.1.5.ඇ නැගෙනහිර කොළඹ

පාගොඩ තෙත්බිම් උද්‍යානය





1.2 කොළඹ පුරවර ප්‍රදේශයේ පවතින ද්විතීයික ඇළ මාර්ග සංවර්ධනය, නාගරික භූමි සැකසීම සහ වැඩිදියුණු කිරීම සහ කාර්යාල නඩත්තු කිරීම (මෙම ඇළ මාර්ග කිසිදු ආයතනයකින් නඩත්තු කරනු නොලැබේ.)

කවර හෝ ආයතනයක විෂය පථය යටතට නොගැණෙන බොහෝ ද්විතීයක ඇළ මාර්ග කිසිදු ආයතනයක් විසින් වැඩිදියුණු නොකර පවතී. වගකීමක් නොමැති වීම හේතුවෙන් මෙම කාර්යය සෑම ආයතනයකින්ම පැහැර හැර ඇත. ඇළ මාර්ග ධාරිතාවයක් නොමැති වීම සහ පද්ධතිය සඳහා සම්බන්ධතාවයක් නොමැති වීම හේතුවෙන් සුළු ගංවතුර තත්ත්වයන් ඇති වීම සඳහා මෙම තත්ත්වය හේතු වී ඇත. මෙම ගැටලුව වළක්වා ගැනීම සඳහා මෙම ද්විතීයික ඇළ මාර්ග සහ සම්බන්ධක ඇළ මාර්ග වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ. එබැවින් මෙම ද්විතීයික ඇළ මාර්ගද ශ්‍රීලඉගොසංස විසින් නඩත්තු කරනු ලැබේ.

පවතින ද්විතීයික ඇළ මාර්ග වැඩි දියුණු කිරීම හේතුවෙන්ද ගංවතුරෙන් තොර පරිසරයක් නිර්මාණය වී ඇත.

මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ,

- ප්‍රදේශයේ ඇති වන ස්ථානීය ගංවතුර හේතුවෙන් මහජනතාට සිදුවන අපහසුතා වැළැක්වීම
- සමස්ත ඇළ මාර්ග පද්ධතියෙහි මනා සම්බන්ධතාවයක් නිර්මාණය කිරීම

- සමස්ත පරිසරය පිරිසිදුව සහ අලංකාරව තබා ගැනීම

ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකරකම් පහත පරිදි වේ,

- ඇළ මාර්ග සහ ඒවායේ රක්ෂිත බලහත්කාරයෙන් අත්පත් කර ගැනීම වැළැක්වීම
- නඩත්තු කාර්ය සඳහා අවශ්‍ය ස්ථාන සඳහා ප්‍රවේශ මාර්ග ලබා දීම
- ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සහ මල අපද්‍රව්‍ය බැහැර කිරීම පාලනය කිරීම
- මේ යටතේ කොළඹ මහනගර සභා ප්‍රදේශයේ, පැලියගොඩ ප්‍රදේශයේ සහ කෝට්ටේ නගර සභා ප්‍රදේශයේ වැදගත් ද්විතීයික ඇළ මාර්ග කිහිපයක් නඩත්තු කරනු ලැබේ. ගංවතුර සඳහා වඩාත් සංවේදී ලෙස හඳුනාගෙන ඇති කොළඹ ප්‍රදේශයෙන් පිටත ඇළ මාර්ගද නඩත්තු කරනු ලැබේ.

ඒ අනුව 2018 වර්ෂය සඳහා මෙම ඇළ මාර්ගවල නඩත්තු කාර්යයන්වල මුළු පිරිවැය රු.මිලියන 30කි.



ඇළ මාර්ග පද්ධතියට ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම

1.3 ආපදා තත්ත්වයකදී ඉල්ලා සිටින විට පොදු ස්ථානවල ජලාපවහනය වැඩිදියුණු කිරීම සහ ගංවතුර සම්බන්ධ ගැටලු සඳහා පිළියම් යෙදීම

නිරන්තර ගංවතුර යනු ශ්‍රී ලංකාවේ ස්වාභාවික උපද්‍රවයන්හි වඩාත් විනාශකාරී ආකාරයයි. ජීවිත හානි හා දේපල හානි යන දෙකටම මෙය සත්‍යයකි. ස්වාභාවික උපද්‍රවයේ වඩාත් ප්‍රචලිත ස්වරූපයද එයයි. මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා සාමාන්‍ය ජනතාවට බලපාන ගැටලු සඳහා පිළියම් යෙදිය යුතුය.

පසුගිය වසරවලදී, පහළ බෝමිරියේ ඇළ මාර්ගයේ අවහිරතා ඉවත් කිරීමේ කටයුතු, පාර්ලිමේන්තු ප්‍රදේශයේ ජල මට්ටම වාර්තාගත කිරීමේ කටයුතු, නාවින්න ඇළ මාර්ගයේ අවහිරතා ඉවත් කිරීමේ කටයුතු, ගංවතුර කාලයේදී කොලොන්නාව, කඩුවෙල සහ පැලියගොඩ ප්‍රදේශවල ගංවතුර අවම කිරීමේ ක්‍රියාකාරකම් සහ ගංවතුර කාලයේදී ජා ඇල ප්‍රදේශයේ ගංවතුර අවම කිරීමේ ක්‍රියාකාරකම් වැනි බස්නාහිර පළාතේ පිහිටි පොදු ස්ථාන, සංගම් සහ ආගමික ස්ථාන ඔවුන්ගේ ස්ථානවල හා ඒ අවට ඇති ජලාපවහන ගැටලු විසඳීම සඳහා අපගේ ක්ෂණික සහාය ඉල්ලා සිටියේය.

පහත සඳහන් කාර්යයන් සඳහා ඉල්ලීම් සිදු කරන ලදී,

- ගංවතුර කාලවලදී ඇළ මාර්ගවල අවහිරතා පිරිසිදු කිරීම.
- ගංවතුර නිදහසේ ගලායෑමට හැකි වන අයුරින් අනවසර ව්‍යුහයන් ඉවත් කිරීම.
- ජලයෙන් බෝවන රෝග ආදිය අවම කිරීම සඳහා ඇළ මාර්ග පිරිසිදු කිරීම.

2018 වර්ෂය සඳහා මුළු පිරිවැය රු.මිලියන 3.64කි.



1.4 කළු ඔය ද්‍රෝණියේ ඇළ මාර්ග නඩත්තු කිරීම

කළු ඇළ ගම්පහ දිස්ත්‍රික්කයේ පිහිටි කුඩා වැව් 5කින් ආරම්භ වන අතර එය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5 ක් ආවරණය කර අවසානයේ කැළණි ගඟෙන් අවසන් වේ. (ප්‍රධාන හා කුඩා ඇළ මාර්ග ඇතුළුව කිලෝමීටර 12 කට ආසන්න වේ)

- කැළණිය
- බියගම
- වත්තල
- ජා-ඇළ
- මහර



කළු ඔය ද්‍රෝණියේ නේවාසික හා කර්මාන්ත අංශයේ අඛණ්ඩ වර්ධනයක් අත්කර ගෙන තිබේ. ඉඩම් මිල අඩු වීම හේතුවෙන් එය නව පදිංචිකරුවන් ආකර්ෂණය කරගෙන ඇත. කොළඹ ජනගහනය වර්ධනය වනවිට එය අනාගත නාගරික ව්‍යාප්තිය සඳහා ප්‍රමුඛතා ප්‍රදේශයක් ලෙස දැන් ඉලක්ක කර ඇත. මෙම වේගවත් සංවර්ධනයත් සමඟ ස්වාභාවික උවදුරුවලට ලක් වීමේ අවදානම අවම කිරීම සඳහා වැසි ජල අපවහන ඇතුළු නාගරික යටිතල පහසුකම් කෙරෙහි වැඩි අවධානයක් අවශ්‍ය වේ.

ශ්‍රීලඉගොසංස විසින් අවශ්‍ය අවස්ථාවලදී ප්‍රධාන සහ කුඩා ඇළ මාර්ගවල ඇළ මාර්ග හැරීම, මඩ ඉවත් කිරීම සහ ඇළ ඉවුරු ආරක්ෂණය සිදු කරනු ලැබේ.

ව්‍යාපෘතියේ අරමුණු පහත පරිදි වේ.

- වැසි ජල අපවහන පද්ධතිය වැඩිදියුණු කිරීමෙන් ගංවතුර හානිය අවම කිරීම
- ගංවතුර අවදානම අඩු කිරීමෙන් (හෝ කළමනාකරණය කිරීමෙන්) ජීවන තත්ත්වය ඉහළ නැංවීම
- ප්‍රජාව සඳහා සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව වැඩි දියුණු කිරීම
- සමාජ හා වාණිජ කටයුතුවලට සිදුවන බාධා අවම කිරීම
- පදිංචිකරුවන්ගේ සෞඛ්‍ය අවදානම අඩු කිරීම
- වඩාත් ආකර්ශණීය නාගරික පරිසරයක්

2018 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල මුළු වටිනාකම රු.මිලියන 20.47කි.



කළු ඔය ද්‍රෝණිය සහ ඇළ මාර්ග පිරිසිදු කිරීම



මාබෝල මධ්‍යම බස් නැවතුම්පොළ ආසන්නයේ පිහිටි ඇළ මාර්ගය සංවර්ධනය කිරීම

1.5 කොලොන්නාව ප්‍රදේශයේ (කිත්තම්පහුව ඇළ, මාර්ගය, සැලලිහිණි මාවත, පස්සෙන ඇළ, දහම්වෙල සහ ද්විතීයික ඇළ මාර්ග) සහ මීතොටමුල්ල ප්‍රදේශයේ ඇළ මාර්ග පද්ධතිය නඩත්තු කිරීම හා පුනරුත්ථාපනය කිරීම.

මෙය කොළඹ නගරයට ආසන්නව පිහිටීම හේතුවෙන් ඉහළ වාණිජ වටිනාකමක් සහිත නේවාසික ප්‍රදේශයකි. නාගරික ප්‍රදේශවල ඉඩම් සඳහා ඇති අධික ඉල්ලුම හේතුවෙන් බොහොමයක් ජනතාව තදාසන්න ප්‍රදේශ කරා යොමු වෙමින් පවතින අතර ඇළ මාර්ග නීතිවිරෝධීව අත්පත් කර ගැනීම්ද බහුලය. එබැවින්, අපවහන වැඩිදියුණු කිරීම් සහ නාගරික භූමි අලංකරණ කාර්යයන් ක්‍රියාවට නැංවීම මෙම ප්‍රදේශ තුළ සහ අවට ජීවත්වන ජනතාවට ප්‍රයෝජනවත් වේ.

එබැවින් වාර්ෂික නඩත්තු කාර්යයන් යටතේ කිත්තම්පහුව, කොලොන්නාව, මීතොටමුල්ල, මුල්ලේරියාව සහ අංගොඩ ප්‍රදේශ තුළ සහ අවට ඇළ මාර්ග පද්ධතිය නඩත්තු කිරීම, සංවර්ධන කිරීම සහ වැඩිදියුණු කිරීම ශ්‍රීලඉගොසංස විසින් සිදු කර ඇත. 2018 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල මුළු පිරිවැය රු. මිලියන 25.95කි.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වන්නේ,

- ඇළ මාර්ගයන්හි නිදහස් ගලා බැසීම සඳහා පවතින අපවහන පද්ධතිය වැඩිදියුණු කිරීම
- මහජනතාව සඳහා ගංවතුරෙන් තොර හරිත පරිසරයක් සකස් කිරීම
- ඝන අපද්‍රව්‍ය සහ මලාපද්‍රව්‍ය ඇළ මාර්ගවලට මුදා හැරීම පාලනය කිරීම
- මෙම ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම, විශේෂයෙන් ඩෙංගු රෝගය වැළැක්වීම
- අනවසර ඉඩම් ගොඩ කිරීම වැළැක්වීම
- ඇළ මාර්ග රක්ෂිත සහ ජල රැඳවුම් ප්‍රදේශ බලහත්කාරයෙන් අත්පත් කර ගැනීම වැළැක්වීම

- ප්‍රදේශයේ දේපලවල වාණිජ වටිනාකම ඉහළ නැංවීම
- පවතින ජලාශ සහ තෙත් බිම් සංරක්ෂණය කිරීම

2018 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල මුළු වටිනාකම රු.මිලියන 26කි.



1.6 ඇළ ඉවුරු ආරක්ෂණ කාර්යයන් (ගේබියන් කාර්යයන්, පෝරු ටැඹ යෙදීම, RRM බිත්ති, RCC බිත්ති)

කොළඹ ප්‍රධාන ඇල පද්ධතිය මහ කොළඹ ප්‍රදේශයේ ජලාපවහන අවශ්‍යතා සපුරාලීම සඳහා ක්‍රියා කරන අතර ගංවතුර තත්ත්වයන් අවම කර එමඟින් නාගරික ප්‍රජාවේ, විශේෂයෙන් කොළඹ පහත් බිම්වල වෙසෙන නාගරික දුගී ජනතාවගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂක තත්ත්වය වැඩිදියුණු කරයි. වියළි කාලගුණික තත්ත්වයන් යටතේ, උතුරු දියඟුල සහ වැල්ලවත්ත සහ දෙහිවල පිටවාන ප්‍රධාන පිටවාන ස්ථාන වේ.

එබැවින් කලින් පුනරුත්ථාපනය කරන ලද ඇළ මාර්ග මෙන් ගේබියන් බැම් ඇතුළුව ඇළ ඉවුරු පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමට තීරණය කරන ලදී.

ගංවතුර තත්ත්වයකදී, කැළණි ගඟෙහි ඉහළ ජල මට්ටම හේතුවෙන් උතුරු දියඟුල සහිත ඇළ පද්ධතිය වසා දමන අතර පද්ධතියට ප්‍රධාන වශයෙන් වැල්ලවත්ත සහ දෙහිවල පිහිටි මුහුදට ජලය ගලායන පිටවාන මත යැපීමට සිදුවේ. මේ අනුව, පිටවාන දක්වා වන කොළඹ ප්‍රදේශය තුළ සහ අවට ප්‍රධාන ඇළ මාර්ග පද්ධතිය එහි උපරිම ධාරිතාවයෙන් ගලා යෑම සපුරාලීම සඳහා නඩත්තු කිරීම වැදගත්ය.

වර්ෂ 1992 සිට 1998 දක්වා කාල පරිච්ඡේදය තුළ කොළඹ හා ඒ අවට ඇළ මාර්ග පද්ධතිය ඇළ ඉවුරු වැඩිදියුණු කිරීමේ කාර්යයන් ආදිය සමඟින් සංවර්ධනය කරන ලදී. මහජනයා විසින් ඇති කරන ලද හේතු කිහිපයක් සහ ඇළ ඉවුරු ස්වාභාවික ලෙස බාදනය වීම හේතුවෙන් ඇළ ඉවුරුවල යම් කොටසක් හානියට ලක්ව ඇත.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, ඇළ ඉවුරුවල බාදනය වීම හා කඩා වැටීම වළක්වා ගැනීම සඳහා සහ හැකි උපරිම පළල පවත්වා ගැනීම සඳහා කොළඹ උතුරු කලාපය, කොළඹ දකුණු කලාපය (මනේටා බෝක්කුව ආදිය) සහ කොළඹ නැගෙනහිර කලාපය (හීන් ඇළ, පාගොඩ ඇළ) සහ එහි තදාසන්න ප්‍රදේශවල ප්‍රධාන ඇළ මාර්ග ඉවුරු ආරක්ෂා කිරීමට යෝජනා කර ඇත. ගලා යෑමට මඟ පෙන්වන බැම් ස්ථාපිත කිරීමෙන් ගලා යෑම නිවැරදි වන අතර ගැලීමේ ධාරිතාවයද ඉහළ නංවනු ඇත. ඉවුර ආරක්ෂණ (ගේබියන් බැම්) ඉදිකිරීමේදී පවතින වැසි ජල අපවහන පිවිසුම් ස්ථාන සඳහා වෙන්කිරීම් පවත්වාගනු ලබන අතර ස්ථානීය ගංවතුර වැළැක්වීම සඳහා අවශ්‍ය ස්ථානවල ජලය එක් රැස් කිරීමටත් ඇළ මාර්ගයට සෘජුව මුදා හැරීම සඳහාත් අනුබද්ධ දියවල සහ කුඩා පැති කානු සහිත නව සම්බන්ධතාවයන්ද ඇති කරනු ඇත. ගේබියන් ඉදිකිරීමේදී පවතින බැම්වලට හානි සිදු වන ස්ථානවල නඩත්තු මාර්ග යථා තත්ත්වයට පත් කිරීම සිදු කරනු ලැබේ. අසල පදිංචිව සිටින්නන්ට සුබවාදී ආකල්පයක් ඇති කරමින් ඒවා වඩාත් හොඳ තත්ත්වයකට පුනරුත්ථාපනය කරනු ඇති අතර නඩත්තු මෙහෙයුම් සඳහා අවශ්‍ය ඉඩකඩ වෙන් කර තැබීමක්ද සිදු වනු ඇත.

2018 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල මුළු පිරිවැය රු.මිලියන 113.28කි.

මෝදර, ශ්‍රී වික්‍රම ඇළ පුනරුත්ථාපනය කිරීම - පැකේජය 02



දෙහිවල මනේටා බෝක්කුව පුනරුත්ථාපනය කිරීම



ප්‍රතිබිම්බාරාම ප්‍රදේශයේ බොල්ගොඩ ඇළ මාර්ගය ඔස්සේ යෝජිත ගේබියන් බැම්ම ඉදිකිරීම



1.7 ඇළ මාර්ග සහ වැව ඔස්සේ පවතින නඩත්තු මාර්ගය පුනරුත්ථාපනය කිරීම

කොළඹ පුරවර කලාපයේ ඇළ මාර්ග ජාලය ඔස්සේ පවතින නඩත්තු මාර්ග ඉදිරි මාස කිහිපය තුළ පුනරුත්ථාපනය කිරීමට ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන කිරීමේ සංස්ථාව තීරණය කර ඇත.

නඩත්තු මාර්ග වැඩිදියුණු කිරීමෙන් අප බලාපොරොත්තු වන ප්‍රතිඵල පහත පරිදි වේ.

- බර යන්ත්‍ර සූත්‍ර සඳහා පහසු ප්‍රවේශයක් ලබා දීම
- ටිපර් රථ සහ ලොරි රථ සඳහා අවශ්‍ය ඉඩකඩ ලබා දීම
- යන්ත්‍රසූත්‍ර යෙදවීම සහ නැවත ඉවත් කර ගැනීම සඳහා අවශ්‍ය ඉඩකඩ ලබා දීම.
- ඇළ මාර්ග සහ ඒවාට වෙන් කර ඇති ඉඩම් බලහත්කාරයෙන් අත්පත් කර ගැනීම වැළැක්වීම.
- ඇළ මාර්ගවලට අපද්‍රව්‍ය බැහැර කිරීම අවම කිරීම.

තවද, මාර්ග පුනරුත්ථාපනය කිරීම මඟින් කොළඹ නගරය තුළ නව මඟහැරයෑමේ මාර්ග නිර්මාණය කරනු ඇති අතර එය වර්තමාන වාහන තදබදය අඩු කිරීමට උපකාරී වනු ඇත.

2018 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල මුළු පිරිවැය රු.මිලියන 12කි.



ඇළ මාර්ග හා වැව ඔස්සේ නඩත්තු මාර්ගය පුනරුත්ථාපනය කිරීම

1.8 ලුනාව ඇළ මාර්ග පද්ධතියේ N1, N1-iii, S1 සහ S2 ඇළ මාර්ග හැරීම, ප්‍රතිසංස්කරණය කිරීම සහ නඩත්තු කිරීම සහ ලුනාව වැව හා එහි අවට නාගරික භූමි අලංකරණ

උතුරින් දෙහිවල ගල්කිස්ස මහ නගර සභා ප්‍රදේශයේ සිට දකුණින් මොරටුව නගර සභා බල ප්‍රදේශය දක්වා කිලෝ මීටර් 6.15 ක් ආවරණය කරමින් ලුනාව වැව කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු පසට වන්නට පිහිටා ඇත. කලපුව විනාශය කරා ගමන් කරමින් පවතින අවධියේදී 2000 වසරේදී අන්තර්ජාතික අරමුදල් සමඟින් රජය විසින් ලුනාව පාරිසරික වැඩිදියුණු කිරීමේ සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය දියත් කරන ලදී.

යෝජිත ව්‍යාපෘති ප්‍රදේශයේ ලූනාව ඇළ මාර්ගය ප්‍රධාන ඇළ මාර්ගය වන අතර, උතුර සිට දකුණ දක්වා දිවෙන පහත් බිම් හරහා ගමන් කර ලුනාව වැව කරා ගලා බසී. ද්‍රෝණිය කුඩා ද්‍රෝණි විශාල සංඛ්‍යාවකින් සෑදී ඇති අතර ඒවායින් වැවෙහි බස්නාහිර සහ දකුණු දිශාවලින් වැසි ජලය සෘජුව වැව කරා ගෙන එයි. අඟුලාන දුම්රිය ස්ථානයට දකුණු දෙසින් පිහිටි දුම්රිය පාලම යටින් ලුනාව වැව මුහුදට සම්බන්ධ වේ.





ලුනාව ප්‍රදේශය

ලුනාව කලපුව සහ ඇළ මාර්ග පද්ධතිය ලුනාව පාරිසරික වැඩිදියුණු කිරීමේ සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරන ලද අතර ශ්‍රීලඟොසංස විසින් ප්‍රධාන ඇළ මාර්ග පද්ධතියේ කොටසක නඩත්තු කාර්යයන් වාර්ෂිකව සිදු කරනු ලැබේ. කලපුවේ හා ඒ අවට සහ ප්‍රධාන ඇළ මාර්ග පද්ධතියේ කොටසක

හැරීම සහ පුනරුත්ථාපන කටයුතු සමහරක් සිදු කළ යුතු වේ. ඒ අනුව සමාජ වගකීමක් ලෙස මහජනයාට ප්‍රසන්න වාතාවරණයක් ඇති කිරීම සඳහා ප්‍රධාන ඇළ මාර්ග පද්ධතියේ පිරිසිදු කිරීමේ හා හැරීම් කටයුතු ශ්‍රීලඉගොසංස විසින් සිදු කර ඇත.

මෙම ව්‍යාපෘතියේ ප්‍රතිඵල වන්නේ,

- ජනතාවගේ සෞඛ්‍ය සම්පන්න ජීවිතය සඳහා නාගරික ප්‍රදේශවල සනීපාරක්ෂක පරිසරයක් නිර්මාණය කිරීම සහ වැසි ජල අපවහන පද්ධතිය වැඩිදියුණු කිරීම තුළින් නගරයේ ගෞරවය ඉහළ මට්ටමක තබා ගැනීම.

- අධ්‍යාපනය ඇතුළු ආර්ථික හා සංස්කෘතික කටයුතු සඳහා බොහෝ විට බාධා ඇති වන ව්‍යාපෘති ප්‍රදේශයේ ගංවතුර වැළැක්වීම.

- නාගරික ප්‍රදේශයෙන් වැසි ජලය ලබා ගන්නා ඇළ මාර්ග සහ මුහුදු ජලයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.

- ප්‍රධාන ඇල පද්ධතියේ කොටසක් හැරීම, පිරිසිදු කිරීම හා නඩත්තු කිරීම මඟින් ප්‍රසන්න පරිසරයක් ඇති කිරීම.

- රොන්මඩ ඉවත් කිරීම මඟින් ඇළ මාර්ගයේ ජලය රැගෙන යාමේ ධාරිතාව වැඩි කිරීම.

- වැවට සහ ඇළ මාර්ග පද්ධතියට එක් වන අපද්‍රව්‍ය පාලනය කිරීම.

- ඇළ මාර්ග සහ කලපු සඳහා වෙන්කර ඇති භූමිය බලහත්කාරයෙන් අත්පත් කර ගැනීම සහ එහි සිදු වන නීති විරෝධී ක්‍රියා වැළැක්වීම.

2018 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල මුළු පිරිවැය රු.මිලියන 15කි.

S1 ඇළ මාර්ගය



S2 ඇළ මාර්ගය



N1 ඇළ මාර්ගය



N1 - iii ඇළ මාර්ගය



1.9 රාගම පිහිටි පොල්ගහවැව වැව අවට බැම්ම සහ නඩත්තු මාර්ගය වැඩිදියුණු කිරීම

පොල්ගහවැව යනු රාගම ඉහළ ජල පෝෂක ප්‍රදේශයේ පිහිටා ඇති ඓතිහාසික වැව්වලින් එකක් වන අතර එය රාගම ඉහළ ජල පෝෂක ප්‍රදේශයේ සිට ගලා බසින ජලය එක් රැස් කර ගන්නා අතර වැසි කාලවලදී සැලකිය යුතු ජල ප්‍රමාණයක් රඳවා ගනී. එසේම එය රාගම නගර ප්‍රදේශයේ ඇති වන ගංවතුර සැලකිය යුතු ප්‍රමාණයකින් පාලනය කිරීමට උපකාරී වේ. නමුත් පසුගිය වසර 10 ක කාලය තුළ පොල්ගහවැව සම්බන්ධයෙන් කිසිදු සංවර්ධන ව්‍යාපෘතියක් සිදු නොවීය. එම නිසා අවසාදිත ක්‍රියාවලිය මඟින් වැවේ රඳවා ගැනීමේ ධාරිතාව අඩු වේ.

පොල්ගහවැවට ජලය පැමිණෙන මාර්ග 09 ක් ඇති අතර පසුගිය වසර 10 තුළ එම ජලය පැමිණෙන මාර්ගවල නඩත්තු තිරීමක් සිදු කර නොමැති අතර වැව වටා නිසි වැව් බැම්මක් නොමැති වීමෙන් අවට ඉඩම්වල පාංශු ඛාදනය වීමේ ක්‍රියාවලියෙන් වැවට බලපෑම් එල්ල වී ඇත.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වනුයේ වැව හැරීම මඟින් වැවේ ධාරිතාවය ඉහළ නැංවීමෙන් වර්ෂා කාලයේදී වැසි ජලය එක්රැස් කර තබා ගැනීම සහ වැව බැම්ම ඔස්සේ නිසි අඩි පාරක් සකස් කිරීම සහ වැවට ජලය ගලා එන මාර්ග වැඩි දියුණු කිරීමෙන් පරිසරය පිරිසිදුව තබා ගැනීමයි.

මෙම ව්‍යාපෘතියේ අනෙකුත් ප්‍රතිලාභ වන්නේ, අවට ප්‍රදේශය තවදුරටත් බලහත්කාරයෙන් අත්පත් කර ගැනීමෙන් ආරක්ෂා කිරීම, විනෝදාත්මක කටයුතු වැඩි දියුණු කිරීම සඳහා ජලාශ අවට අලංකාර කිරීමේ කටයුතු, පවත්නා ඇළ මාර්ග වැඩිදියුණු කිරීම මඟින් අවට ජීවත් වන ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම වේ.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වන්නේ,

- ගංවතුරෙන් තොර පරිසරයක් නිර්මාණය කිරීම
- වර්ෂා කාලවලදි වැඩි ජල ධාරිතාවයක් රඳවා ගැනීමට හැකි වන අයුරින් වැවෙහි ධාරිතාවය ඉහළ නැංවීම
- අවට පිහිටි වැවට ජලය ගලා එන මාර්ග වැඩිදියුණු කිරීම
- අඩිපාරක් ඇතුළුව වැව වටා විධිමත් වැව් බැම්මක් ස්ථාපිත කිරීම

මෙම ව්‍යාපෘතිය යටතේ වැව හා ඒ අවට ජලාපවහන හා භූමි අලංකරණ කටයුතු වැඩිදියුණු කිරීම අප විසින් සිදු කරන ලදී. ඒ අනුව 2018 වර්ෂය සඳහා සිදු කරන ලද මුළු කාර්යයන්වල වටිනාකම රු. මිලියන 45 කි.



1.10 කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය ඔස්සේ පැරණි ලන්දේසි ඇළ හා සම්බන්ධිත ජලාශ නඩත්තු කිරීම

CKE අධිවේගී මාර්ගය ඉදිකිරීමේදී අවට ප්‍රදේශය දැඩි ලෙස ජලයෙන් යට විය. ගංවතුර අවදානම අවම කිරීම සහ අභ්‍යන්තර ජලය සම්බන්ධ ගැටලු අවම කිරීම සඳහා පසුකාලීනව පැරණි ලන්දේසි ඇළ මාර්ගය සහ සම්බන්ධිත ජලාශ වැඩිදියුණු කර වැසි ජලයට නිදහස් ප්‍රවාහයක් සැපයීම සඳහා නිර්මාණය කර ඇත.

ඒ අනුව පැරණි ලන්දේසි ඇළ මාර්ගය සහ සම්බන්ධිත ජලාශ නඩත්තු කිරීම සඳහා ශ්‍රීලඉගොසංස නිරන්තරයෙන් කටයුතු කර ඇති අතර 2018 වර්ෂය සඳහා සිදු කරන ලද මුළු කාර්යයන්වල වටිනාකම රු. මිලියන 15 කි.



ගංවතුර අවම කිරීම ක්‍රියාකාරකම්

1.11 පැලියගොඩ පවතින පොම්පාගාරය වැඩිදියුණු කිරීම සහ වාර්ෂික නඩත්තු කිරීම

පැලියගොඩ දැනට පවතින පොම්පාගාරය වර්තමානයේදී ශ්‍රීලඉගොසංස විසින් නඩත්තු කරනු ලබන අතර එය විදුලියෙන් ධාවනය වන පොම්ප 2 කින් සමන්විත වන අතර කැළණි ගඟේ ඉහළ ගංවතුර මට්ටමක් පවතින විට පැලියගොඩ ප්‍රදේශයේ ගංවතුර පොම්ප කිරීමට එහි උපකාරී වේ.

2018 අයවැය ප්‍රතිපාදන යටතේ, පැලියගොඩ දැනට පවතින පොම්පාගාරය සහ වතුර වල නිවැරදි කිරීම සඳහා වානේ පෝරු ටැඹ යෙදීමේ කාර්යයන් සහ පැලියගොඩ පොම්පාගාරයේ ඇළ මාර්ග ඉවුරු වැඩිදියුණු කිරීමේ කාර්යයන් ශ්‍රීලඉගොසංස විසින් සිදු කර ඇත.

ප්‍රධාන අරමුණු වන්නේ,

- පවතින පොම්පාගාර ගොඩනැගිල්ල පුනරුත්ථාපනය කිරීම
- නඩත්තු කිරීමේ ඒකකයක් ඉදිකිරීම
- මෙහෙයුම් පිරිවැය අඩු කිරීම සඳහා ජාල මනුකරණ පද්ධතියක් හඳුන්වා දීම.
- වාර්ෂික මෙහෙයුම් සහ නඩත්තු කාර්යයන්.

ඉහත ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂය සඳහා සිදු කරන ලද මුළු කාර්යයන්වල වටිනාකම රු. මිලියන 0.94 කි





පැලියගොඩ පොම්පාගාරය සඳහා පෝරු ටැඹ ස්ථාපිත කිරීම

1.12 කටුබැද්දෙහි ජලාපවහනය වැඩිදියුණු කිරීම සහ නාගරික භූමි අලංකරණ සංවර්ධන ව්‍යාපෘතිය

කටුබැද්ද වැවෙහි රොන්මඩ ඉවත් කිරීම සහ හැරීම, වැව් බැම්ම ඔස්සේ අඩි පාරක් ඉදිකිරීම සහ පරිසරය පිරිසිදුව තබා ගැනීම සහ සංවර්ධනයට අදාළ ඇළ මාර්ග පද්ධතියේ වඩා හොඳ සම්බන්ධතාවයක් ඇති කිරීම යනාදිය මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ.

ඒ අනුව ශ්‍රීලඉගොසංස විසින් කටුබැද්ද ව්‍යාපෘතියේ හැරීමේ කටයුතු සහ අඩි පාර ඉදිකිරීමේ කොටසක් සිදු කර ඇති අතර 2018 වර්ෂය සඳහා සිදු කර ඇති කාර්යයන්වල මුළු පිරිවැය රු.මිලියන 50කි.

2018.05.20 දින මෙම උද්‍යානය මහජනයාට විවෘත කෙරිණි. මෙම ව්‍යාපෘතියේ අනෙකුත් ප්‍රතිලාභ වන්නේ, වැවෙහි ධාරිතාව ඉහළ නැංවීම සහ අවට ප්‍රදේශය තවදුරටත් අනවසරයෙන් අත්පත් කර ගැනීමෙන් ආරක්ෂා වීම, විනෝදාත්මක ක්‍රියාකාරකම් ඉහළ නැංවීම සඳහා ජලාශ අවට අලංකාර කිරීමේ කටයුතු, නගර සංවර්ධන පිරවුම් සහ අවට සංවර්ධනයන් ආදිය හේතුවෙන් වෙනස්වීවලට ලක් වූ පවතින ඇළ මාර්ග පද්ධති සහ වැව් වැඩිදියුණු කිරීම යනාදියයි.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වන්නේ,

- අවම අමුද්‍රව්‍ය (කළුගල් සහ වැලි) භාවිතයක් යටතේ තණ පිඩලි අල්ලන ලද ප්‍රදේශ මඟින් පරිසරයට හරිත පෙනුමක් ලබා දීම
- නාගරික භූමි සැකැස්ම වැඩිදියුණු කිරීම (ඉවුර ඔස්සේ රුක් රෝපණය)
- සමාජ ක්‍රියාකාරකම් සඳහා ස්ථාන නිර්මාණය කිරීම (සෑම මට්ටමකම ජනතාව සඳහා පවුල් වශයෙන් නිදහස්ව හැසිරීමේ හැකියාව)
- සංචාරක කර්මාන්තය පදනම් කරගත් ව්‍යාපාර මඟින් නව රැකියා අවස්ථා බිහිවීම සහ දැකුම්කළු පරිසරයක් ඇති කිරීම
- ඇළ මාර්ගවල නිදහස් ගලනයට පහසුකම් සැලසීම සඳහා පවතින ජල අපවහන පද්ධති වැඩිදියුණු කිරීම
- මහජනතාව සඳහා හරිත සහ ගංවතුරින් තොර පරිසරයක් නිර්මාණය කිරීම
- මෙම ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම.
- ප්‍රදේශයේ දේපලවල වාණිජ වටිනාකම ඉහළ නැංවීම



1.13 බස්නාහිර පළාත තුළ ගංවතුර අවම කිරීමේ ව්‍යාපෘතිවලට අදාළ ජලාපවහන වැඩිදියුණු කිරීම

කොළඹ, ගම්පහ සහ කළුතර යන දිස්ත්‍රික්ක ඇතුළත් සමස්ත බස්නාහිර පළාතේ සංවර්ධන සැලැස්මට අනුව කොළඹ නගරය පදනම් කර ගනිමින් මහා නගරයක් ලෙස සංවර්ධනය කෙරේ.

ඒ අනුව 2018 වර්ෂය සඳහා කරන ලද මුළු කාර්යයන්වල වටිනාකම රු. මිලියන 97.52කි.

ඉහත කාර්යය යටතේ පහත සඳහන් ව්‍යාපෘති සිදු කරනු ලැබේ:

- කලපලුවාව, නෙළුම්පෙදෙසෙහි වගුරු බිම් සංවර්ධනය කිරීම සඳහා ජල අපවහන සැලැස්ම
- අංගොඩ මාදිවෙල වැවෙහි ජල අපවහනය කාර්යයන්
- සුහුරුපාය ඇළ මාර්ගවේ ජල අපවහන කාර්යයන්

අංගොඩ මාදිවෙල වැවෙහි හැරීමේ කාර්යයන්



කලපලුවාව, නෙළුම්පෙදෙසෙහි වගුරු බිම සංවර්ධනය කිරීම



1.14 කොළඹ දිස්ත්‍රික්කයෙන් පිටත අපවහන වැඩිදියුණු කිරීමේ සහ නාගරික භූමි සැකසුම් ව්‍යාපෘති

මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ ගංවතුර අවදානම අවම කිරීම සඳහා කොළඹ දිස්ත්‍රික්කයෙන් පිටත ප්‍රධාන නගර සහ ස්ථානවල වැව් පුනරුත්ථාපනය කිරීම, රොන්මඩ ඉවත් කිරීම සහ අනවසරයෙන් අත්පත් කරගන්නන් විසින් සිදුකර ඇති නීතිවිරෝධී පිරවීම් හැරීම, වැව් බැම්ම දිගේ අඩි පාර ඉදිකිරීම, පරිසරය පිරිසිදුව තබා ගැනීම සහ සංවර්ධනයට අදාළ ඇළ මාර්ග පද්ධතියේ වඩා හොඳ සම්බන්ධතාවයක් ඇති කිරීම යනාදියයි.

මෙම ව්‍යාපෘතියේ අනෙකුත් ප්‍රතිලාභ වන්නේ, වැවෙහි ධාරිතාව ඉහළ නැංවීම සහ අවට ප්‍රදේශය තවදුරටත් අනවසරයෙන් අත්පත් කර ගැනීමෙන් ආරක්ෂා වීම, විනෝදාත්මක ක්‍රියාකාරකම් ඉහළ නැංවීම සඳහා ජලාශ අවට අලංකාර කිරීමේ කටයුතු, නගර සංවර්ධන පිරවුම් සහ අවට සංවර්ධනයන් ආදිය හේතුවෙන් වෙනස්වීම්වලට ලක් වූ පවතින ඇළ මාර්ග පද්ධති සහ වැව් වැඩිදියුණු කිරීම යනාදියයි.

2018 වර්ෂය සඳහා සිදු කරන ලද මුළු කාර්යයන්වල වටිනාකම රු. මිලියන 82.06 කි.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වන්නේ,

- ඇළ මාර්ගවල ජලය මනා ලෙස ගලා යාම සඳහා පහසුකම් සැලසීමට පවත්නා කානු පද්ධතිය වැඩිදියුණු කිරීම
- මහජනතාවට හරිත හා ගංවතුර රහිත පරිසරයක් නිර්මාණය කිරීම
- ඇළ මාර්ගවලට සන අපද්‍රව්‍ය සහ මල අපද්‍රව්‍ය
- බැහැර කිරීම පාලනය කිරීම
- මෙම ප්‍රදේශයේ ජීවත් වන ජනතාවගේ සෞඛ්‍ය වැඩි
- දියුණු කිරීම.
- ප්‍රදේශයේ දේපලවල වාණිජ වටිනාකම වැඩි කිරීම

කළුතර, මහ සහ කුඩා වස්කඩුව ප්‍රදේශය සඳහා වැසි ජල අපවහන පද්ධතිය යටතේ යෝජිත ගේබියන් ව්‍යුහ ඉදිකිරීම



1.15 පාර්ලිමේන්තු ඉහළ ජල පෝෂක ප්‍රදේශයක් වන බත්තරමුල්ල සහ අවට ප්‍රදේශයේ අපවහන සහ පාරිසරික වැඩිදියුණු කිරීමේ කාර්යයන්

හරිත නගර සංකල්පය සඳහා පරිසරය වැඩිදියුණු කිරීම මඟින් පාර්ලිමේන්තු පරිශ්‍රයේ සහ එහි අවට ප්‍රදේශයේ ගංවතුර අවම කිරීම සහ ඉහළ ජල පෝෂක ප්‍රදේශයේ පිහිටි තෙත් බිම් සංරක්ෂණය කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. ඒ අනුව 2018 වර්ෂය සඳහා සිදුකර ඇති කාර්යයන්වල මුළු පිරිවැය රු. මිලියන 53කි.

ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වන්නේ

- ජල රැඳවුම් ධාරිතාවය ඉහළ නැංවීමෙන් සහ නාගරික භූමි සැකසීම් මඟින් ගංවතුරෙන් තොර, පරිසර හිතකාමී පරිසරයක් ඇති කිරීම
- බලහත්කාරයෙන් අත්පත් කර ගැනීම් වැළැක්වීම
- සන අපද්‍රව්‍ය කළමනාකරණය
- ජලයෙහි තත්ත්වය වැඩිදියුණු කිරීම
- අපවහනය වැඩි දියුණු කිරීම
- නාගරික භූමි සැකසීම

ආරක්ෂක මූලස්ථාන ප්‍රදේශයේ ප්‍රවේශ මාර්ගයේ ජල අපවහනය (අකුරගොඩ)



නාගහමුල්ල ඇළ මාර්ගය හැරීම සහ පැලවත්ත ලංකා විදුලිබල මණ්ඩලය අසල ඇළ මාර්ග පිරිසිදු කිරීම



2. සේවාදායක ව්‍යාපෘති

2.1 මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය සඳහා "සුබිත පුරවර" ප්‍රාදේශීය නගර සංවර්ධන ව්‍යාපෘති

කොළඹ නගරය සහ එහි තදාසන්න ප්‍රදේශ බස්නාහිර කලාපයේ මහානගර සැලැස්මෙහි කේන්ද්‍රය වේ. වර්තමානයේ දකුණු ආසියාවේ වඩාත් කාර්යබහුල හා වැදගත් වරාය අගනගරයේ පිහිටා ඇත. කලාපය තුළ එහි ප්‍රධාන තරඟකරුවන් අතරින් වඩාත් පිරිසිදු, වඩාත් සාදරයෙන් පිළිගනු ලබන සහ වඩාත් සජීවී බවින් යුත් වරාය ලෙස මෙය පුළුල් ලෙස සලකනු ලැබේ. මහානගර ප්‍රධාන සැලැස්ම යටතේ, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් මැනිං වෙළඳපොළ පැළියගොඩ ප්‍රදේශයට ගෙන යෑම සහ "සුබිත පුරවර"ප්‍රාදේශීය නගර සංවර්ධන වැඩසටහන වැනි විශේෂ ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කර ඇත. මැනිං වෙළඳපොළ පවතින ස්ථානයේ ඉඩම්වල වාණිජ වටිනාකම ඉහළ යෑම සහ කොළඹ නගරය තුළ සහ අවට වාහන තදබදය අඩු කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සහ මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් මැනිං වෙළඳපොළ පැළියගොඩ ප්‍රදේශයට ගෙන යෑම සඳහා ව්‍යෘපෘතියක් ආරම්භ කරන ලදී.

"සුබිත පුරවර" යටතේ ශ්‍රීලඉගොසංස විසින් 2018 වර්ෂයේදී පහත සඳහන් ව්‍යාපෘති සිදු කර ඇත.

- ඇඹිලිපිටිය කාවන්තිස්ස වැවේ යෝජිත සංවර්ධන ව්‍යාපෘතිය - අදියර II
- මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ බස් රථ නැවතුම්පළක්, ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීම
- පානදුර - ගලවත්ත නාගරික චතුරශ්‍රය සඳහා භූමි සැකසුම් කාර්යයන් සැලසුම් කිරීම හා ඉදිකිරීම
- ඇඹිලිපිටිය කාවන්තිස්ස වැවෙහි යෝජිත සංවර්ධන ව්‍යාපෘතිය - අදියර III
- ගම්පහ යෝජිත තෙත්බිම් උද්‍යානය "සියත" - අදියර I - පියවර I
- ගම්පහ යෝජිත තෙත්බිම් උද්‍යානය "සියත" - අදියර I - පියවර II

2.1.1 ඇඹිලිපිටිය කාවන්තිස්ස වැවේ යෝජිත සංවර්ධන ව්‍යාපෘතිය - අදියර II

ආරම්භ කරන ලද දිනය : 2017.08.17
කාලය දීර්ඝ කිරීම : 2018.02.28
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 24.82
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 3.84





2.1.2 මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ බස් රථ නැවතුම්පළක්, ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීම

ආරම්භ කරන ලද දිනය : 2017.06.30
කාලය දීර්ඝ කිරීම : 2018.08.31
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 92.10
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු. මිලියන 56.02





2.1.3 පානදුර - ගාලවත්ත නාගරික චතුරශ්‍රය සඳහා භූමි සැකසුම් කාර්යයන් සැලසුම් කිරීම හා ඉදිකිරීම

ආරම්භ කරන ලද දිනය : 2018.11.10
කාලය දීර්ඝ කිරීම : 2019.01.15
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 88.29
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 51.20



2.1.4 ඇඹිලිපිටිය කාවන්තිස්ස වැවෙහි යෝජිත සංවර්ධන ව්‍යාපෘතිය - අදියර III

ආරම්භ කරන ලද දිනය : 2018.05.04
සම්පූර්ණ කරන දිනය : 2019.03.31 (සිදු කරමින් පවතී)
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 88.66
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 39.96





2.1.5 ගම්පහ යෝජිත තෙත්බිම් උද්‍යානය "සියත" - අදියර I - පියවර I

ආරම්භ කරන ලද දිනය : 2018.08.15
සම්පූර්ණ කරන දිනය : 2019.01.30 (සිදු කරමින් පවතී)
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 19.99
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 8.06

2.1.6 ගම්පහ යෝජිත තෙත්බිම් උද්‍යානය "සියත" - අදියර I - පියවර II

ආරම්භ කරන ලද දිනය : 2018.09.09
සම්පූර්ණ කරන දිනය : 2019.05.15 (සිදු කරමින් පවතී)
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන107.82
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 14.03





2.2 සායින්දමරුදු තෝනා කලපුවේ ගේබියන් බැම්ම සැලසුම් කිරීම හා ඉදිකිරීම - අදියර I - පියවර II
සේවාදායකයා - නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය

ආරම්භ කරන ලද දිනය : 2017.08.15
කාලය දීර්ඝ කිරීම : 2018.01.05
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 35.33
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 3.27





2.3 මාතර යෝජිත රිවර්සයිඩ් උද්‍යානය සඳහා ඉඩම් සංවර්ධන කටයුතු - අදියර I
සේවාදායකයා - මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

ආරම්භ කරන ලද දිනය : 2017.06.25
කාලය දීර්ඝ කිරීම : 2018.08.31
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 155.23
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 39.95





2.4 ඉමදූව වැසි ජල අපවහන පද්ධතිය සැලසුම් කිරීම සහ ඉදිකිරීම - අදියර II
සේවාදායකයා - මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

ආරම්භ කරන ලද දිනය : 2017.11.10
කාලය දීර්ඝ කිරීම : 2018.04.10
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 18.18 Mn
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 14.63



2.5 මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ ජලාපවහන වැඩිදියුණු කිරීමේ කටයුතු - පැකේජය I.
සේවාදායකයා - REDECO/ නගර සංවර්ධන සංරචකය

ආරම්භ කරන ලද දිනය : 2017.10.31
කාලය දීර්ඝ කිරීම : 2018.01.30
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 24.33
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 11.15



2.6 පෑලියගොඩහි කසළ බැහැර කිරීමේ භූමිය වැඩිදියුණු කිරීම
සේවාදායකයා - නාගරික සංවර්ධන අධිකාරිය

ආරම්භ කරන ලද දිනය : 2017.11.22
කාලය දීර්ඝ කිරීම : 2018.01.30
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 36.31
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 0.49



2.7 අත්තිඩිය වනජීවී පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ මායිම් ඇළ මාර්ගය හැරීම
සේවාදායකයා - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

ආරම්භ කරන ලද දිනය : 2017.12.01
සම්පූර්ණ කළ දිනය : 2018.01.15
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 3.15
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 3.52



2.8 රේඛීය උද්‍යාන ඇවිදීමේ මාර්ගය ඉඩම් සංවර්ධනය, ජලාපවහනය වැඩිදියුණු කිරීම - මාකුඹුර අදියර I.
සේවාදායකයා - නාගරික සංවර්ධන අධිකාරිය

ආරම්භ කරන ලද දිනය : 2017.11.22
කාලය දීර්ඝ කිරීම : 2019.02.08 (සිදු කරමින් පවතී)
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 209.14
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 122.12



2.9 හයිලෙවල් පාර සහ ඩී ඩී කුලතුංග පාර අතර ජලාපවහනය සහ ගොඩකිරීම් - මාකුඹු අදියර II
සේවාදායකයා - නාගරික සංවර්ධන අධිකාරිය

ආරම්භ කරන ලද දිනය : 2017.11.22
කාලය දීර්ඝ කිරීම : 2019.03.31 (සිදු කරමින් පවතී)
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 194.31
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 133.61



2.10 කෙරවලපිටිය අන්තර් හුවමාරුවේ යෝජිත ජලාපවහන වැඩිදියුණු කිරීමේ කටයුතු
සේවාදායකයා - මෙටලර්ජිකල් කෝපරේෂන් ඔෆ් චයිනා ලිමිටඩ් (OCH)

ආරම්භ කරන ලද දිනය : 2018.02.05
කාලය දීර්ඝ කිරීම : 2018.06.05 (සිදු කරමින් පවතී)
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 32.76
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 15.60



2.11 බස් රථ නැවතුම සඳහා ඉඩම් සංවර්ධන කාර්යයන් සැලසුම් කිරීම හා ඉදිකිරීම - පැකේජය IV (මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය)
සේවාදායකයා - නාගරික සංවර්ධන සංරචකය

ආරම්භ කරන ලද දිනය : 2018.04.05
කාලය දීර්ඝ කිරීම : 2018.10.10 (සිදු කරමින් පවතී)
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 66.26
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 46.39



2.12 මාකුඹුර බහුවිධ ප්‍රවාහ ප්‍රවාහන මධ්‍යස්ථානයේ බස් රථ නැවතුම සහ පිවිසුම් මාර්ගය ඉදිකිරීම පැකේජය VII
සේවාදායකයා - නාගරික සංවර්ධන සංරචකය

ආරම්භ කරන ලද දිනය : 2018.04.05
කාලය දීර්ඝ කිරීම : 2018.09.06 (සිදු කරමින් පවතී)
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 11.87
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 7.18



2.13 බේරේ වැව මැදිහත්වීමේ ප්‍රදේශ සංවර්ධන සැලැස්ම යටතේ නැගෙනහිර බේරේ වැව පිරිසිදු කිරීම (හැරීමේ කාර්යයන්)
සේවාදායකයා - මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

ආරම්භ කරන ලද දිනය : 2018.06.22
කාලය දීර්ඝ කිරීම : 2018.03.22 (සිදු කරමින් පවතී)
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 74.32
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 18.91



2.14 බේරේ වැව මැදිහත්වීමේ ප්‍රදේශ සංවර්ධන සැලැස්ම යටතේ බටහිර බේරේ වැව පිරිසිදු කිරීම (හැරීමේ කාර්යයන්)
සේවාදායකයා - මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

ආරම්භ කරන ලද දිනය : 2018.06.22
කාලය දීර්ඝ කිරීම : 2019.02.28 (සිදු කරමින් පවතී)

ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 54.54
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 32.18



2.15 කොළඹ නගරයේ ඇළ මාර්ග හැරීම හා නඩත්තු කිරීම

සේවාදායකයා - කොළඹ මහ නගර සභාව

ආරම්භ කරන ලද දිනය : 2018.08.01
කාලය දීර්ඝ කිරීම : 2019.08.01 (සිදු කරමින් පවතී)
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 26.66
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 12.84

කිඹුලා ඇළ



කාක දූපත ඇළ මාර්ගය



කදිරානාවත්ත ඇළ මාර්ගය



2.16 බේරේ වැව - රේඛීය උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය (නැගෙනහිර බේරේ වැවෙහි බස්නාහිර ඉවුර ඔස්සේ ඉවුරු ආරක්ෂණ බැම්ම ඉදිකිරීම)

සේවාදායකයා - මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

ආරම්භ කරන ලද දිනය : 2018.07.30
කාලය දීර්ඝ කිරීම : 2019.04.30 (සිදු කරමින් පවතී)
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 54.54
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 32.18

3. ස්වයං ව්‍යාපෘති

3.1 මුතුරාජවෙල මීටර් 400ක ඉඩම් තීරුවක් සංවර්ධනය කිරීම

ආරම්භ කරන ලද දිනය : 2016.01.01
සම්පූර්ණ කළ දිනය : සිදු කරමින් පවතී
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 308.02
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 21.14



3.2 කිරිමණ්ඩල මාවත ක්‍රිකට් ක්‍රීඩාංගනය

ආරම්භ කරන ලද දිනය : 2014.06.24
සම්පූර්ණ කළ දිනය : 2018.12.31
ඇස්තමේන්තුගත පිරිවැය : රු. මිලියන 56.85
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 6.65



3.3 වෙරළට ඔබ්බෙන් ලබා ගන්නා වැලි භාවිතා කරමින් මුතුරාජවෙල ඉඩමක් (අක්කර 9) සංවර්ධනය කිරීම

ආරම්භ කරන ලද දිනය : 2017.07.05
සම්පූර්ණ කළ දිනය : 2018.06.02
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 8.82
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන් : රු.මිලියන 8.45



3.4 ඝායනික අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ මුතුරාජවෙල ඉඩම් සකස් කිරීමේ කාර්යයන්

ආරම්භ කරන ලද දිනය : 2017.09.21
සම්පූර්ණ කරන දිනය : 2018.07.16
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 295.86
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 183.99



3.5 මුහුදු වැලි විකුණුම් ඒකකය සඳහා යෝජිත තාවකාලික වැසිකිළි කොටස

ආරම්භ කරන ලද දිනය : 2017.11.22
සම්පූර්ණ කළ දිනය : 2018.06.20
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 0.74
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 0.22

3.6 මීටර් 400ක තීරුව වට බැම්මක් ඉදිකිරීම

ආරම්භ කරන ලද දිනය : 2017.08.15
සම්පූර්ණ කළ දිනය : 2018.04.30
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 30.1
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 15.36



3.7 කැළණිය, මුදුන් ඇළ ප්‍රදේශයේ ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීම

ආරම්භ කරන ලද දිනය : 2018.05.03
සම්පූර්ණ කළ දිනය : 2018.08.02
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 1.21
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 1.21

3.8 කැළණිය විශ්වවිද්‍යාලය සඳහා යෝජිත ප්‍රවේශ මාර්ගය - මුදුන් ඇළ

ආරම්භ කරන ලද දිනය : 2018.05.10
සම්පූර්ණ කළ දිනය : 2018.08.10
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 4.07
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන් : රු.මිලියන 4.07

3.9 මුතුරාජවෙල මීටර් 400 තීරුව සඳහා යෝජිත ප්‍රවේශ මාර්ගය (මීටර් 200)

ආරම්භ කරන ලද දිනය : 2018.05.15
සම්පූර්ණ කළ දිනය : 2018.08.31
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 34.11
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 33.89



3.10 කෙරවලපිටිය යෝජිත මාර්ගය

ආරම්භ කරන ලද දිනය : 2018.07.05
සම්පූර්ණ කළ දිනය : 2018.11.20
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 22.69
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 18.74

3.11 මීටර් 20 පළල මාර්ගය ඇතුළුට කෙරවලපිටිය ඉඩම සංවර්ධනය කිරීම

ආරම්භ කරන ලද දිනය : 2018.07.05
සම්පූර්ණ කළ දිනය : 2018.08.06
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 15.68
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 15.33

3.12 රාගම යෝජිත RCC බෝක්කුව ඉදිකිරීම

ආරම්භ කරන ලද දිනය : 2018.08.29
සම්පූර්ණ කළ දිනය : සිදු කරමින් පවතී
ඇස්තමේන්තුගත පිරිවැය : රු.මිලියන 75.08
2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්: රු.මිලියන 1.66

වේරැස් ගඟ වැසි ජල අපවහන සහ පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

1. හැඳින්වීම

කොළඹ සහ තදාසන්න නගරවල සිදු වන සීඝ්‍ර නාගරීකරණය සැලසුම් නොකළ ඉඩම් ගොඩකිරීම් සඳහා දායකත්වය දක්වා ඇති අතර එය වර්ෂා කාලවලදී ගංවතුර ඇති වීම සඳහා හේතු වී ඇත. මෙම තත්ත්වය වාර්ෂිකව බරපතල වෙමින් පවතී. ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (ශ්‍රීලඉගොසංස) ජපන් අන්තර්ජාතික සහයෝගිතා නියෝජිතායතන (JICA) කණ්ඩායම සමඟ එක්ව 2003 වර්ෂයේදී කොළඹ පුරවර කලාපය සඳහා විස්තීර්ණ ප්‍රධාන අපවහන සැලැස්මක් සකස් කරන ලදී. අපවහන සැලසුම් සඳහා වූ මෙම අධ්‍යයනයේදී ශක්‍යතා අධ්‍යයනය පිළිබඳව සිදු කරනු ලැබූ අධ්‍යයන ගණනාවකින් ගංවතුර වැළැක්වීම සඳහා බොල්ගොඩ උප ජල පෝෂකයක් වන වේරැස් ගඟ ද්‍රෝණියට ඉහළ ප්‍රමුඛත්වයක් අවශ්‍ය වන බව අනාවරණය විය. එබැවින් 2011 වර්ෂයේදී ඉහත ව්‍යාපෘතිය දියත් කරන ලදී.

වේරස් ගඟ වැසි ජල අපවහනය සහ පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාර්යයන් ශ්‍රීලඉගොසංස විසින් ආරම්භ කිරීම සඳහා 2013 අගෝස්තු 30 වන දින කැබිනට් අනුමැතිය ලබාගෙන ඇත. ප්‍රධාන ගංවතුර පාලන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හැකියාව ඇති එකම ආයතනය ලෙස ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට සම්පූර්ණ සැලසුම් කටයුතු සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා ඉදිකිරීමට සිදු වී ඇත. මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 11,050 කි.

2. අරමුණු

පවතින ඇළ මාර්ග පද්ධතිය තවදුරටත් පුළුල් කිරීමෙන් ගංවතුර අවම කිරීම, ඇළ ඉවුරු ආරක්ෂණය, ජල රැඳවුම් ප්‍රදේශය සංරක්ෂණය කිරීම සහ වැව් නිර්මාණය කිරීම, පවතින බෝක්කු සහ පාලම් වැඩිදියුණු කිරීම, නව ව්‍යුහ ඉදිකිරීම, අත්හැර දැමූ කුඹුරු නැවත වගා කිරීම ඉහළ නැංවීම, ජල පෙරටු විනෝදාත්මක ක්‍රියාකාරකම් සහ අත්තිඩිය කුරුළු පරාදීසය ප්‍රතිසංස්කරණය කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වේ. මෙම ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් ගංවතුර අවම කිරීම සඳහා ඉලක්ක කර ඇති බැවින්, ගංවතුර හානිය, මදුරුවන් මඟින් බෝ වන රෝග සහ මී උණ රෝගයෙන් අවම කිරීම මඟින් ප්‍රදේශවාසීන්ට සහ මුළු දිවයිනටම සහ ප්‍රතිලාභ අත් වේ. ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් පසු ප්‍රදේශයේ ඉඩම් වටිනාකම සැලකිය යුතු ලෙස වැඩි වී ඇත.

මීට අමතරව වගුරු බිම් අත්පත් කර ගැනීමෙන් හා ඒවා ජල රැඳවුම් ප්‍රදේශ ලෙස තබා ගැනීමෙන් භූගත ජල මට්ටම නිසි ලෙස පවත්වා ගැනීමට උපකාරී වන අතර එය පරිසරයේ ආර්ද්‍රතාවය සහ උෂ්ණත්වය පාලනය කරන අතරම ජෛව විවිධත්වය ආරක්ෂා කර වාතයේ CO2 සහ O2 සංයුතිය සමතුලිත කරයි.

3. සම්පූර්ණ කරන ලද ඉදිකිරීම් කාර්යයන්

වේරස් ගඟ වැසි ජල අපවහන සහ පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ දේශීය කොන්ත්‍රාත්කරුවන් විසින් ගුරුත්වාකර්ෂණය යටතේ ගංවතුරෙන් තොර ඇළ මාර්ග පද්ධතියක් තැනීම සඳහා දේශීය ඉංජිනේරු තාක්ෂණික ධාරිතාව භාවිතා කරනු ලබන ජාතිය සඳහා කෙරෙන ආයෝජනයකි.

2018 දෙසැම්බර් මස අවසානය දක්වා සිදු කරන ලද කාර්යයන්හි සමුච්චිත වටිනාකම දළ වශයෙන් මිලියන 5,600 කි.

ව්‍යාපෘති කටයුතු අඛණ්ඩව සිදුවන අතර ව්‍යාපෘතියේ සම්පූර්ණ කරන ලද කොටස්වලින් මහජනතාවට පහත සඳහන් පරිදි උපරිම ප්‍රතිලාභ ලැබේ

3.1 බෙල්ලන්විල රඳවා ගැනීමේ ප්‍රදේශය, වේරහැර රඳවා ගැනීමේ ප්‍රදේශය සහ බොරලැස්ගමුව රඳවා ගැනීමේ ප්‍රදේශය සංවර්ධනය කිරීම - පරිසරය වැඩිදියුණු කිරීම, ජල පෙරටු විනෝදාත්මක ක්‍රියාකාරකම් සමඟින් "කෙලිමඩළ විවේක උද්‍යානය"

බෙල්ලන්විල ජල රැඳවුම් ප්‍රදේශය



වේරහැර ජල රැඳවුම් ප්‍රදේශය



පරිසරය වැඩිදියුණු කිරීම, ජල පෙරටු විනෝදාත්මක ක්‍රියාකාරකම් සමඟින් ''කෙලිමඬල විවේක උද්‍යානය''



3.2 වාහන ධාවනය කළ හැකි ඇස්ෆාල්ට් නඩත්තු මාර්ගය ඇතුළුව ගේබියන් ඉවුරු ආරක්ෂණ සමඟ නුගේගොඩ රත්තනපිටිය ඇළ මාර්ගය සම්පූර්ණ කිරීම



3.3 කුළුණු අත්තිවාරම් උපස්ථරයක් සහිත මීටර් 12 ක පළලකින් යුත් පාලම් 3 ක් සම්පූර්ණ කිරීම

ෆ්ලෙක්ස්පෝර්ට් පාලම





සූරිය මල් මාවත පාලම



අඹගහවත්ත පාලම



3.4 සුනේත්‍රදේවි පාරට පහළින් කොන්ක්‍රීට් ඇළ මාර්ගය නිම කිරීම



4. මේ වනවිට සිදු කරමින් පවතින ඉදිකිරීම් කාර්යයන්

කරදියනහි හි මීටර් 40ක් පළල පාලම සහ මීටර් 20 ක පළල පාලම් 2ක් සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය සැලසුම් කර ඇති අතර ඉදිකිරීම් 2019 දී ආරම්භ කෙරේ. දැනට සිදුකෙරෙමින් පවතින ඉදිකිරීම් පහත පරිදි වේ;

4.1 නිම කරන ලද මීටර් 4 ක පළලින් යුතු බොක්කු 2ක් සහ මීටර් 8 ක පළලින් යුත් කුළුණු අත්තිවාරම් උපව්‍යුහ සහිත පාලම් 2 ක් සමඟින් දෙල්කඳ ඇළ මාර්ගය (කටු ඇළ) ඉදිකිරීම

85%ක් නිම කර ඇති රබර්වත්ත බෝක්කුව



85%ක් නිම කර ඇති අන්දිරිස් මාවත බෝක්කුව



4.2 සූරියමල් මාවත සහ වෙළ පාර වැව ඉදිකිරීම් කාර්යයන් සිදු කරමින්



80%ක් නිම කර ඇති සූරියමල් මාවත වැව



80%ක් නිම කර ඇති වෙළ පාර වැව

4.3 ඉදිකරමින් පවතින ද්විත්ව බැරල කොටස සහ පෙර-නිමි, පෙර-සවි පාළම් තලාදය සමඟින් මීටර් 4ක් පළල කොන්ක්‍රීට් ඇළ මාර්ග කොටස



4.4 සම්පූර්ණයෙන්ම පාහේ නිම කර ඇති මහ ඇළෙහි වම් ඉවුරෙහි ගේබියන් වැඩිදියුණු කිරීම්



පර්යේෂණ සහ සැලසුම් අංශය

උපදේශන සේවාවන්

රාජ්‍ය හා පෞද්ගලික අංශ ආයතන සඳහා වැසි ජල අපවහන සැලසුම් සහ වැසි ජල අපවහන ප්‍රධාන සැලසුම් සකස් කිරීම, ගොඩනැගිලි හා පාලම් සඳහා ගෘහ නිර්මාණාත්මක සැලසුම් සහ ව්‍යුහාත්මක සැලසුම් පිළිබඳ උපදේශන සේවාවන් සංස්ථාව විසින් භාර ගනු ලැබේ.

ඉංජිනේරුමය ද්‍රව්‍ය පර්යේෂණාගාරය

සංස්ථාවේ ඉංජිනේරුමය ද්‍රව්‍ය පර්යේෂණාගාරය විසින් රාජ්‍ය හා පෞද්ගලික අංශවල ආයතන වෙනුවෙන් භූ-තාක්ෂණ පර්යේෂණ, ජලයෙහි තත්ත්වය, පස් කොන්ක්‍රීට් ඝනක සහ කොන්ක්‍රීට් බ්ලොක් පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ. 2017 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්හි මුළු වටිනාකම රු. මිලියන 21.89

යෝජිත මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ ජල විද්‍යාත්මක අධ්‍යයන

සංස්ථාව විසින් යෝජිත මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා ජල විද්‍යාත්මක හා හයිඩ්‍රොලික් අධ්‍යයනය සිදු කරන ලද අතර 2018 වර්ෂයේදී නිම කර ඇත. සියලුම අංශ සඳහා අධ්‍යයනයන් සිදු කරන ලදී (ආසන්න වශයෙන් කි.මී.185); 01 වන කොටස (කඩවත සිට මීරිගම දක්වා කි.මී. 37.) 02 වන කොටස (කි.මී. 39.2), 03 වන කොටස (කි.මී. 32.5 කි.) 04 (කි.මී. 59.89). මාර්ග සංවර්ධන අධිකාරිය අවශ්‍යතා මත පදනම්ව අංශ 04 සඳහා ජල විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කර ඇත. මාර්ග ඉදිකිරීම අවසන් වන තෙක් ජලාපවහන කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සහ පාර්ශවකාර සංවිධානයක් ලෙස රැස්වීම්වලට සහභාගී වීම සිදු කරනු ඇත.

අධ්‍යයනය සඳහා මුළු උපදේශන ගාස්තුව මිලියන 62.5 කි. (බදු හැර). 2018 වර්ෂය සඳහා කරන ලද කාර්යයන්වල වටිනාකම ඩොලර් මිලියන 0.5 කි.

මධ්‍යම අධිවේගී මාර්ග I කොටසේ නියමු මාර්ගය සඳහා ජල විද්‍යා අධ්‍යයනය - (කඩවත සිට මීරිගම දක්වා)

මධ්‍යම අධිවේගී මාර්ගයේ නියමු මාර්ගය සඳහා උපදේශන සේවා සංස්ථාව විසින් භාර ගන්නා ලදී. I වන කොටස වන්නේ කඩවත සිට මීරිගම දක්වා වූ අධිවේගී මාර්ග කොටස වන අතර එහි මුළු දිග කිලෝමීටර 37.0 කි.

ව්‍යාපෘතිය සඳහා වන මුළු උපදේශන ගාස්තුව රුපියල් මිලියන 4.0 කි. කාර්යයන් 2017 මාර්තු මාසයේ ආරම්භ කර 2018 වර්ෂයේදී නිම කරන ලදී. 2018 දී සිදු කරන ලද ප්‍රගතිය රු.මිලියන 0.71කි.

මධ්‍යම අධිවේගී මාර්ග II කොටසේ නියමු මාර්ගය සඳහා ජල විද්‍යා අධ්‍යයනය - (මීරිගම සිට කුරුණෑගල දක්වා)

මධ්‍යම අධිවේගී මාර්ගයේ නියමු මාර්ගය සඳහා උපදේශන සේවා සංස්ථාව විසින් භාර ගන්නා ලදී. ෂෂ වන කොටස වන්නේ මීරිගම සිට කුරුණෑගල දක්වා වූ අධිවේගී මාර්ග කොටස වන අතර එහි මුළු දිග කිලෝමීටර 39.0 කි.

ව්‍යාපෘතිය සඳහා වන මුළු උපදේශන ගාස්තුව රුපියල් මිලියන 4.5 කි. කාර්යයන් 2017 ඔක්තෝබර් මාසයේ ආරම්භ කර 2018 වර්ෂයේදී නිම කරන ලදී. 2018 වර්ෂයේදී සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම රු.මිලියන 0.71කි.

දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය මාතර සිට හම්බන්තොට දක්වා දීර්ඝ කිරීම

2018 වර්ෂයේදී ෑෑෂ සියලු අදියර සඳහා ජලවිද්‍යාත්මක අධ්‍යයන සමාලෝචනය කිරීම සංස්ථාව විසින් සම්පූර්ණ කර ඇත. 2017 වර්ෂය සඳහා සිදු කර ඇති කාර්යයන්වල වටිනාකම රු.මී. 1.47කි.

රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා ජල විද්‍යා අධ්‍යයනය

2017 වර්ෂයේදී සංස්ථාව රුවන්පුර අධිවේගී මාර්ගය පිළිබඳ ජල විද්‍යා අධ්‍යයනය සඳහා උපදේශන සේවා භාර ගන්නා ලදී. අධිවේගී මාර්ගය කහතුදුව සිට පැල්මඩුල්ල දක්වා ඉදිකරන අතර මුළු දිග කි.මී. 74.0 කි. විෂය පථයට ජල විද්‍යාත්මක හා ජල ගතික අධ්‍යයන සිදු කිරීම සහ ඉහළ ගංවතුර මට්ටම් සමඟ විවෘතව තැබිය යුතු ප්‍රමාණ ලබා දීම ඇතුළත් වේ. ආරම්භයේදී ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 15.18 ක් විය. ජල විද්‍යාව පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය සමාලෝචනය කිරීමේ සිට සවිස්තරාත්මක ජල විද්‍යා අධ්‍යයනයක් සිදු කිරීම දක්වා විෂය පථය වෙනස් වීම හේතුවෙන් එය සංශෝධනය කරන ලදී. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 48.6 කි. 2018 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයේ වටිනාකම රු.මිලියන 12.76 කි.

කඳුරුවෙල නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා යෝජිත වැසි ජල අපවහන සැලැස්ම

නාගරික සංවර්ධන අධිකාරියේ ඉල්ලීම පරිදි යෝජිත කඳුරුවෙල නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ප්‍රධාන වැසි ජල අපවහන සැලැස්ම සකස් කිරීමට ශ්‍රීලඉගොසංස

භාර ගෙන ඇත. යෝජිත ව්‍යාපෘතිය මඟින් පවතින ජල අපවහන පද්ධතියේ ධාරිතාවය වැඩි කරන අතර එමඟින් ගංවතුරට ගොදුරු වීමේ අවදානම අවම වේ. අධ්‍යයනය සඳහා සංශෝධිත මුදල (උපදේශන ගාස්තුව) රු.මිලියන 12.0 ක් වන අතර එය 2018 වර්ෂයේ දී සම්පූර්ණ කර ඇත. 2018 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයේ වටිනාකම රු.මිලියන 1.0කි.

<u>ගුවන් නගර සංවර්ධනය යටතේ ඒකල යෝජිත සංවර්ධන කටයුතු සඳහා ජල විද්‍යාත්මක අධ්‍යයනය</u>

සේවාදායකයා : - මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
ව්‍යාපෘති පිරිවැය : - රු.මිලියන 1.5
කාල පරිච්ඡේදය : - මාස 6

මෙම අධ්‍යයනයේ පරමාර්ථය වන්නේ අදාළ ප්‍රදේශයේ නාගරික ජල අපවහන තත්ත්වය ඇගයීම සහ එම සංවර්ධනය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ජල විද්‍යාත්මක හා ජලගතික බලපෑම් ඇගයීමයි. සංවර්ධනය සඳහා නිසි වැසි ජල කළමනාකරණ පද්ධතියක් සැලසුම් කිරීම ද මෙම අධ්‍යයනයේ දී සලකා බලනු ලැබේ. මේ වනවිට මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් භූමි මැනුම් කටයුතු සිදු කරනු ලබන අතර ජල අපවහන සැලසුම ආරම්භ කිරීම සඳහා ToR ලැබෙන තුරු සිටී.



<u>ගුවන් නගර සංවර්ධනය යටතේ කටුනායක 18 වන සැතපුම් කණුවේ යෝජිත සංවර්ධනය සඳහා ජල විද්‍යාත්මක අධ්‍යයනය</u>

සේවාදායකයා : - මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
ව්‍යාපෘති පිරිවැය : - රු.මිලියන 1.0
කාල පරිච්ඡේදය : - මාස 4

මෙම අධ්‍යයනයේ පරමාර්ථය වන්නේ අදාළ ප්‍රදේශයේ නාගරික ජල අපවහන තත්ත්වය ඇගයීම සහ එම සංවර්ධනය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ජල විද්‍යාත්මක හා ජලගතික බලපෑම් ඇගයීමයි. සංවර්ධනය සඳහා නිසි වැසි ජල කළමනාකරණ පද්ධතියක් සැලසුම් කිරීම ද මෙම අධ්‍යයනයේ දී සලකා බලනු ලැබේ. ශ්‍රීලඉගෙ ාසංස විසින් උපදේශන ගාස්තු අය කිරීමේ උපලේඛනය ව්‍යාපෘති කණ්ඩායමට ඉදිරිපත් කරන ලදී.



<u>"සුඛිත පුරවර" යටතේ සැලසුම් සහ ඉදිකිරීම් කාර්යයන්, ප්‍රගතිය ("සියත උයන" - ගම්පහ)</u>

සේවාදායකයා: - UDA (සුඛිත පුරවර වැඩසටහන)
අරමුදල් සපයන ආයතනය: - මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
ඉංජිනේරු: - ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (ශ්‍රීලඉගොසංස)
ගෘහ නිර්මාණ ශිල්පියා: - නාගරික සංවර්ධන අධිකාරිය
ප්‍රධාන කොන්ත්‍රාත්කරු: - ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (ශ්‍රීලඉගොසංස)

ව්‍යාපෘති පිරිවැය: -

අදියර 1සඳහා

- පියවර 1 - රු.මිලියන 24.1 (වැටි බදු සහ අවිනිශ්චිතතා ඇතුළුව)
- පියවර 2 - රු. මිලියන 130.2 (වැටි බදු සහ අවිනිශ්චිතතා ඇතුළුව)

මුළු ව්‍යාපෘති කාලය: - වර්ෂ 3 යි

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ගම්පහ ප්‍රදේශයේ නාගරික තෙත්බිම් උද්‍යානයක් සකස් කිරීමයි. නාගරික සංවර්ධන අධිකාරිය විසින් අත්පත් කරගත් ප්‍රදේශය සඳහා ශ්‍රීලඉගොසංස විසින් ජල විද්‍යාත්මක අධ්‍යයනයක් සැලසුම් කර ඇති අතර වැසි ජල අපවහන සැලැස්ම සැලසුම් කර

ඇත. පළමු අදියරෙහි සවිස්තරාත්මක සැලසුම් සකස් කර ඇති අතර ජලාපවහන හා ගොඩකිරීමේ අංශය විසින් අදියර අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. ව්‍යාපෘතියේ උපදේශන ගාස්තුව ව්‍යාපෘති පිරිවැයෙන් 6% කි.

- **කාවන්තිස්ස වැව නාගරික උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය අදියර III & IV**

ව්‍යාපෘති පිරිවැය අදියර - III = රු. මිලියන 93.1
අදියර - IV = රු. මිලියන 30.4
කොන්ත්‍රාත් කාලය - 2018 මැයි 02 සිට 2019 අප්‍රේල් 30 දක්වා

2018 වර්ෂය සඳහා කරන ලද කාර්යයේ වටිනාකම - රු. මිලියන 0.65 කි.

උපදේශන සේවාව පර්යේෂණ හා සංවර්ධන අංශය විසින් සිදු කරනු ලබන අතර කාර්යය සඳහා උපදේශන ගාස්තුව සමස්ත ව්‍යාපෘති පිරිවැයෙන් 3% කි. ඉදිකිරීම් කටයුතු පර්යේෂණ හා සංවර්ධන අංශය විසින් සිදු කරනු ලැබේ. ජල අපවහන වැඩිදියුණු කිරීම සහ භූමි සැකසුම් කාර්යයන් ඇතුළුව කාවන්තිස්ස වැව පුනරුත්ථාපනය කිරීමට UDA යෝජනා කර ඇත.

<u>බස්නාහිර මහාමාර්ගයේ සහ මහේන්වත්ත ටෙක් සිටි (හෝමාගම) වෙත පිවිසෙන මාර්ගවල හයිඩ්‍රොලික් ව්‍යුහයන් නිර්දේශ කිරීම</u>

සේවාදායකයා : - මාර්ග සංවර්ධන අධිකාරිය
අරමුදල් මූලාශ්‍රය : - මාර්ග සංවර්ධන අධිකාරිය
වර්ගය :- සේවාදායක ව්‍යාපෘති/උපදේශන කාර්යයන්
ව්‍යාපෘති පිරිවැය : -රු. මිලියන 1.73

එම අධ්‍යයනයේ අරමුණ වන්නේ හරස් ජලාපවහන ව්‍යුහ ධාරිතාව, මාර්ග පැති කාණු සහ අවරජල ඇළ මාර්ග ධාරිතාව සැපයීම ඇතුළුව යෝජිත මාර්ග පද්ධතිය සඳහා ජල විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කිරීම සහ මාර්ග නිම කිරීමේ මට්ටම් තීරණය කිරීම සඳහා සැලසුම්ගත ගංවතුර මට්ටම් සැපයීම ය. RDA විසින් ඉල්ලා සිටින ලද මාර්ග පද්ධතියෙන් 30% ක් ආවරණය කරමින් දැනට ජලාපවහන අධ්‍යයනය අවසන් කර ඇත.

සුබිත පුරවර ව්‍යාපෘති - මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය සඳහා උපදේශන කාර්යයන්

පර්යේෂණ හා සැලසුම් අංශය විසින් සුබිත පුරවර නගර සංවර්ධන වැඩසටහනේ අධීක්ෂණය සහ ව්‍යාපෘති කළමනාකරණය ඇතුළු ඒකාබද්ධ උපදේශන සේවාවක් සිදු කරනු ලැබේ. ව්‍යාපෘති පහත දැක්වෙන පරිදි වේ. ඒකාබද්ධ ගාස්තුව මුළු ව්‍යාපෘති පිරිවැයෙන් 6% කි.

1) **මහනුවර ශ්‍රී දළදා මාළිගාව සඳහා යටිතල පහසුකම්, අදියර - III**

ව්‍යාපෘති පිරිවැය - රු.මිලියන 45.5
කොන්ත්‍රාත් කාලය - 2018 අගෝස්තු 30 සිට 2019 අප්‍රේල් 30 දක්වා
කොන්ත්‍රාත්කරු- CESL
2018 වර්ෂය සඳහා කරන ලද කාර්යයන්වල වටිනාකම - රු. මිලියන 1.74

දළදා මාළිගාවෙහි මහ මළුවෙහි ජලය රැඳීමේ ගැටලුව විසඳීම සඳහා ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. ස්ථානය පරීක්ෂා කිරීමේදී මාළිගාව වටා ප්‍රමාණවත් නොවන ජලාපවහන පද්ධතිය සහ සමහර ජලය බැස යන කාණු දිය අඟල වෙත හරවා ඇති බවත් දිය අඟල සමඟ සම්බන්ධ වන ස්ථානයේ දැඩි ලෙස රොන්මඩ තැන්පත්ව ඇති බවත් හඳුනාගෙන ඇත. ඉහත ගැටළු නිරාකරණය කිරීම සඳහා ශ්‍රීලඉගොසංස විසින් උපපෘෂ්ඨ ජලාපවහන පද්ධතිය ඇතුළු ප්‍රධාන ජලාපවහන සැලැස්මක් සකස් කරන ලදී.

2) **තල්දූව මහජන පොළ සංවර්ධනය කිරීම**

මෙම ව්‍යාපෘතියේ අරමුණ ස්ථානීය ගංවතුර අවම කිරීම සඳහා විධිමත් ජලාපවහන කළමනාකරණ සැලැස්මක් ඇතුළුව සති පොළ ප්‍රදේශයේ කොටසක් සංවර්ධනය කිරීම වේ.

සේවාදායකයා - මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
උපදේශක - ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව
ව්‍යාපෘති පිරිවැය - රු.45.706,750.00 (වැට් බදු රහිතව)
කොන්ත්‍රාත්කරු - වීරසූරිය බිල්ඩර්ස්
කොන්ත්‍රාත් කාලය - දින 180 යි
ආරම්භක දිනය - 2018/07/26
2018 වර්ෂය අවසානයේ ප්‍රගතිය - 75%
2018 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම- රු.මිලියන2.55





3) අත්තිඩිය ළමා අනාථ නිවාසය සඳහා යෝජිත නව ගොඩනැගිල්ල

සේවාදායකයා - මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
උපදේශක - ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව
ව්‍යාපෘති පිරිවැය - රු. 68,999,315.00 (වැට් බදු රහිතව)
කොන්ත්‍රාත්කරු - ජීපීඩී ඉංජිනියරින් (පෞද්.) සමාගම.
කොන්ත්‍රාත් කාලය - දින 270
ආරම්භක දිනය - 2018/05/30
2018 වසර අවසානය දක්වා ප්‍රගතිය - 50%
2018 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම - රු. මිලියන 3.68.

යෝජිත ගොඩනැගිල්ල වැර ගැන්වූ කොන්ක්‍රීට් ව්‍යුහයක් සහ දැව වහලක් සහිත දෙමහල් ගොඩනැගිල්ලකි. එක් එක් මහලේ සාමාන්‍ය විශාලත්වය වර්ග මීටර් 355 කි.



4) රාගම වල්පොල පිහිටි කිතුදාන පුබුදුව ජාතික මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම, අදියර -III

සේවාදායකයා - මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
උපදේශක - ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව
ව්‍යාපෘති පිරිවැය - රු. 20,671,775.00 (වැට් බදු රහිතව)
කොන්ත්‍රාත්කරු - ජේඑස්එම් කන්ස්ට්‍රක්ෂන් (පෞද්) සමාගම.
කොන්ත්‍රාත් කාලය - දින 180 යි
ආරම්භක දිනය - 2018/08/09
2018 වසර අවසානය දක්වා ප්‍රගතිය - 40%
2018 වර්ෂය සඳහා කරන ලද කාර්යයන්වල වටිනාකම - රු.මිලියන 0.61

නවාතැන් ගොඩනැගිලි, තාර පාර (කි.මී. 1) සහ රථගාල ඉදිකිරීම මෙම ව්‍යාපෘතියට ඇතුලත් වේ. නවාතැන් ගොඩනැගිල්ල වැර ගන්වන ලද ව්‍යුහයක් සහිත තනි මහල් ගොඩනැගිල්ලකි. ගොඩනැගිල්ලේ බිම් ප්‍රමාණය වර්ග අඩි 2500 කි.



නාගරික සංවර්ධන අධිකාරිය (UDA) සඳහා උපදේශන කටයුතු

පහත සඳහන් ව්‍යාපෘතිවල ගොඩනැගිලි සහ පාලම් සඳහා වැසි ජල අපවහන සැලසුම් සහ වැසි ජල අපවහන ප්‍රධාන සැලසුම් සහ ව්‍යුහාත්මක සැලසුම් සකස් කිරීම. කාර්යය සඳහා උපදේශන ගාස්තුව මුළු ව්‍යාපෘති පිරිවැයෙන් 3% කි.

- **යෝජිත බොරලෙස්ගමුව වැව අවට ප්‍රදේශ සංවර්ධන ව්‍යාපෘතිය, අදියර - I**

නාගරික සංවර්ධන අධිකාරිය විසින් බොරලැස්ගමුව වැව පුනරුත්ථාපනය කිරීම සඳහා සැලැස්මක් සකස් කර ඇත. අරමුදල් පැවතීම හේතුවෙන් ව්‍යාපෘතියේ පළමු අදියර I , අදියර II සහ අදියර III වශයෙන් ගේබියන් බැම් යොදා ඉවුරු ආරක්ෂා කිරීමට යෝජනා කරන ලදී.

ව්‍යාපෘති පිරිවැය - රු.මිලියන 68.4
කොන්ත්‍රාත්කරු - එස්එෆ් කන්ස්ට්‍රක්ෂන්
කොන්ත්‍රාත් කාලය - 2018 අගෝස්තු 01 සිට 2019 ජනවාරි 31 දක්වා
2018 වර්ෂය සඳහා කරන ලද කාර්යයන්වල වටිනාකම - රු.මිලියන 1.03



වැව් ඉවුර සඳහා ගේබියන් බැම්ම ඉදිකිරීම



වැව් ඉවුර පිරවීම

නාගරික සංවර්ධන අධිකාරිය සහ 3K ව්‍යාපෘතිය

මාකුඹුර අන්තර් හුවමාරු නගර සංවර්ධන ව්‍යාපෘතිය මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ අංගයකි. මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ බස් රථ නැවතුම්පළක් සහ බස් හා දුම්රිය සේවය එකිනෙක හා සම්බන්ධ වී ඒකාබද්ධ මහාමාර්ග ප්‍රවාහන ජාලයක් නිර්මාණය වන බහුආකෘතික මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා දැනට පවතින කුඹුරු ඉඩම් සංවර්ධනය කිරීමයි. ශ්‍රීලඉගොසංස වේ ප්‍රධාන කාර්යය වන්නේ ඉඩම් පිරවීම සහ අනාගතයේදී ගංවතුර වළක්වා ගැනීම සඳහා ව්‍යාපෘති ප්‍රදේශයේ ජල අපවහන පද්ධතියක් නිර්මාණය කිරීමයි.

ශ්‍රීලඉගොසංස වේ පර්යේෂණ හා සැලසුම් අංශය විසින් මාකුඹුර බහුආකෘතික මධ්‍යස්ථානය (MMC) සඳහා ඉඩම් සංවර්ධනය හා ජලාපවහන වැඩිදියුණු කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම ඇතුළු සැලසුම් හා උපදේශන සේවාවක් භාර ගෙන ඇත.

දක්ෂිණ අධිවේගී මාර්ගය කොට්ටාව පිවිසුමේ සිට කොළඹ දෙසට මීටර් 300 ක් දුරින් MMC පිහිටා ඇති අතර බස්නාහිර පළාතේ ප්‍රධාන ප්‍රවාහන මධ්‍යස්ථාන 3 ක් එනම් කඩවත, කඩුවෙල සහ කොට්ටාව සම්බන්ධ කරන පිටත වටරවුම් අධිවේගී මාර්ගයද (OCH) ආසන්නයේ පිහිටා ඇත. නගර සංවර්ධනය සඳහා හඳුනාගත් ස්ථානය හයිලෙවල් මාර්ගය දෙපස හෙක්ටයාර 8.6 ක (අක්කර 21) අත්හැර දැමූ තෙත් බිමක් (වී වගාවක්) වන අතර, කැලණි වැලි දුම්රිය මාර්ගයද භූමියේ බටහිර සීමාවේ කොටසක් පසෙකින් වැටී ඇත. මාකුඹුර කොට්ටාව නගර මායිමේ සිට මීටර් 1200 ක් පමණ දුරින් පිහිටා ඇත. කොට්ටාව නගරයෙන් ආරම්භ වන පළාත්බද බස් මාර්ග 7 ක් ඇති අතර බොහෝ අන්තර් පළාත් බස් රථද මෙම මාර්ගයෙන් ගමන් කරයි. අරමුදල් පැවතීම අනුව මෙම ව්‍යාපෘතිය අදියර කිහිපයකින් සිදු කර ඇත.



සේවාදායකයා - නාගරික සංවර්ධන අධිකාරිය සහ 3K කේ ව්‍යාපෘතිය

උපදේශක - පර්යේෂණ හා සැලසුම් අංශය / ශ්‍රීලඉගොසංස

කොන්ත්‍රාත්කරු - ජලාපවහන හා ගොඩකිරීමේ අංශය / ශ්‍රීලඉගොසංස

මුළු ව්‍යාපෘති පිරිවැය - රු.1,003

2018 වර්ෂය අවසානයේ සමස්ත ප්‍රගතිය - 75%

2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම ව්‍යාපෘති පිරිවැයෙන් 3% කි.

මාකුඹුර බහුමාධ්‍ය මධ්‍යස්ථානයෙහි ජල අපවහනය වැඩිදියුණු කිරීමේ කාර්යයන් සඳහා ප්‍රධාන සැලැස්ම



ශ්‍රීලඉගොසංස වේ වැඩපොළ කෙරවලපිටියට ගෙන යෑමේ යෝජනාව

මේ වනවිට කොළඹ 05, කිරිමණ්ඩල මාවතෙහි පිහිටි ශ්‍රීලඉගොසංස වැඩපොළ කෙරවලපිටියට ගෙන යාමට යෝජනා කර ඇත.

කෙරවලපිටියේ වැඩපොළ සංකීර්ණය කාර්ය මණ්ඩලය සහ සේවකයන් සඳහා මහළු 3 කින් යුත් උපයෝගිතා ගොඩනැගිල්ලකින් (K කාණ්ඩය) සමන්විත වන අතර විශේෂිත විෂයයන් සඳහා වැඩපොළ ගණනාවකින්ද සමන්විත වේ.

2018 වර්ෂය තුළ තෙමහල් ගොඩනැගිල්ල (K කාණ්ඩය) සැලසුම් කර ඇති අතර ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී.

2018 දෙසැම්බර් මස අවසානය වනවිට මෙම ගොඩනැගිල්ල වහල මට්ටමට ළඟා වී ඇති අතර නිමා කිරීම් ආරම්භ කර ඇත.

සංකීර්ණයේ ඇති බොහෝ වැඩපොළ ගොඩනැගිලි අතරින්, A හා B වැඩපොළ සඳහා, අත්තිවාරම් සැලසුම් කිරීම අවසන් කර ඇති අතර පාංශු වැඩිදියුණු කිරීම දැනටමත් සිදු කර ඇත.

උපරි ව්‍යුහය ග්‍රාන්ටි දොඹකර දෙකක් සහිත වානේ රාමුවකි. උපිරි ව්‍යුහය සැලසුම් කිරීමේ සහ ගොඩනැගීමේ කොන්ත්‍රාත්තුවක් යටතේ සිදු කෙරේ.



තෙමහල් ගොඩනැගිල්ල - K කාණ්ඩය

භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති

ජලාපවහන හා ගොඩකිරීමේ අංශය විසින් හසුරුවනු ලබන භාණ්ඩාගාර අරමුදල් ලැබූ සියලු කාර්යයන් සඳහා ජල අපවහන සැලසුම් පර්යේෂණ හා සැලසුම් අංශය විසින් සකස් කර ඇත. පහත සඳහන් ව්‍යාපෘති සඳහා ගෘහ නිර්මාණාත්මක හා ව්‍යුහාත්මක සැලසුම් සකස් කිරීම සඳහා පර්යේෂණ හා සැලසුම් අංශයට භාර දී ඇත.

ජල මිටටම සහ මුදා හැරීමේ මිනුම්

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන සංස්ථාවේ එක් ප්‍රධාන අරමුණක් වන්නේ අනාගත ගංවතුර හානිය අවම කිරීම සඳහා ප්‍රධාන ජලාපවහන සැලසුම් අධ්‍යයනය කිරීමයි. පවත්නා තත්ත්වය, ජලාශ, වැව් සහ ප්‍රධාන ඇළ මාර්ගවල හැසිරීම මත ප්‍රධාන ජලාපවහන අධ්‍යයනවල ප්‍රතිඵලය පදනම් වී ඇත. අධ්‍යයනයේ ඉහළ නිරවද්‍යතාවය ලබා ගැනීම සඳහා ජල මට්ටම් සහ විසර්ජන මිනුම් ඉතා වැදගත් වේ. මේ වනවිට ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව 01 වන වගුවේ දක්වා ඇති පරිදි නම් කළ ද්‍රෝණි 7 ක් තුළ ස්ථාන 134 ක් හඳුනාගෙන ඇත. ස්ථාන 60 ක් සකස් කරමින් පවතී. නවීන තාක්ෂණය යොදා ගනිමින් අනාගතයේදී ස්ථාන 74ක් සංවර්ධනය කළ යුතු වේ.

මිනුම් මධ්‍යස්ථානයට ඉතා ආසන්නව ජීවත්වන ජනතාවගේ සහාය ඇතිව අතින් මිනුම් ගැනීමේ ක්‍රමයක් භාවිතා කරමින් සකස් කළ දත්ත සමුදායක් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සතුව පවතී. දත්ත එක්රැස් කිරීමට කාලය ගත වන අතර අඛණ්ඩ දත්ත වාර්තා සමහර ස්ථානවල නොමැත. දත්ත රැස් කිරීම ප්‍රමාද වීම සහ දත්ත නොමැති වීම වළක්වා ගැනීම සඳහා ස්වයංක්‍රීය ජල මට්ටමේ මිනුම් සහ පරිගණක ආකෘති පද්ධතියක් හඳුන්වා දීමෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන සංස්ථාව මෙම ක්‍රමය වැඩිදියුණු කිරීමට සැලසුම් කරමින් සිටී. ජලාපවහන අධ්‍යයන සඳහා මෙන්ම අනෙකුත් අදාළ ආයතන සඳහා වඩාත් විශ්වාසදායක දත්ත සමුදායක් සැපයීමට ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට හැකියාව ලැබෙනු ඇත.

කේතය	ද්‍රෝණි	ස්ථාන සංඛ්‍යාව	නව සකස් කිරීම්	2018	2019	2020	2021
B - 1	බොල්ගොඩ	36	4	-	√	√	√
J - 2	ද්‍රෝණිය	14	4	√	√	-	-
M -3	ජා-ඇළ	18	13	√	-	-	-
K - 4	ද්‍රෝණිය	16	16	-	-	-	-
G - 5	මුදුන් ඇළ	34	22	-	-	√	√
Ko-6	ද්‍රෝණිය	13	1	√	√	-	-
Be- 7	කළු මය ද්‍රෝණිය මහ කොළඹ ද්‍රෝණිය කොලොන්නාව බරව ද්‍රෝණිය	03	-	√	-	-	√
	Total	134	60				

01 වගුව

1 වන වගුවට අනුව මෙම ක්‍රමය සංවර්ධනය කිරීමට (2018 - 2021 දක්වා කාල පරිච්ඡේදය) සහ අතින් මිනුම් ගැනීමේ ක්‍රමය ස්වයංක්‍රීයව යාවත්කාලීන වන කියවීමේ ක්‍රමයට පරිවර්තනය කිරීමට සංස්ථාව සැලසුම් කරයි.

2003 වර්ෂයේදී සකස් කරන ලද කොළඹ පුරවර කලාපය සඳහා වැසි ජල අපවහන සැලැස්ම සමාලෝචනය කිරීම සඳහා ශ්‍රීලඉගොසංස JICA හි විශේෂඥ කණ්ඩායම අතර 2017 දෙසැම්බර් මාසයේදී ගිවිසුම අත්සන් කරන ලදී.

එබැවින්, ඉහළ නිරවද්‍යතාවයකින් යුත් වැඩි දත්ත ප්‍රමාණයක් එකතු කර ගැනීම සඳහා අපගේ ප්‍රමුඛතාවය ලබා දෙන ලදී. ඒ අනුව උපකරණ කිහිපයක් සහ ස්වයංක්‍රීය ජල මට්ටමේ දත්ත ලඝුර කිහිපයක් මිලදී ගැනීමට පර්යේෂණ හා සංවර්ධන අංශය තීරණය කරන ලද අතර වැය කරන ලද මුළු මුදල රු.මිලියන 6කි.

හානියට පත් මිනුම් මධ්‍යස්ථානයේ අලුත්වැඩියා කටයුතු සිදු කරන ලද අතර දත්ත රැස් කිරීම දිගටම කරගෙන යනු ලැබේ.

කේතය	ද්‍රෝණිය	ස්ථාන සංඛ්‍යාව	නව සකස් කිරීම්	හානිය	2018 නව	2018 අලුත් වැඩියා	අනාගත යෝජනා
B - 1	බොල්ගොඩ ද්‍රෝණිය	40	11	20	5	2	29
1 - 2	ජා-ඇළ ද්‍රෝණිය	17	11	2	8	3	4
M -3	මුදුන් ඇළ ද්‍රෝණිය	18	13	1	0	5	4
K - 4	කළු ඔය ද්‍රෝණිය	16	14	1	0	5	1
G - 5	මහ කොළඹ ද්‍රෝණිය	13	32	1	1	27	2
Ko-6	කොලොන්නාව		12	0	0	1	1
BR- 7	බරව ද්‍රෝණිය	3	0	0	0	0	3
	මුළු ස්ථාන සංඛ්‍යාව	142	93	25	14	43	44

ප්‍රගතියේ සාරාංශය වගුව - 2

- **ප්‍රධාන ජලාපවහන සැලසුම් සකස් කිරීම (ප්‍රදේශයෙන් පිටත)**

ගංවතුර අවම කිරීම සඳහා දත්ත එක්රැස් කිරීම, මැනීම් කාර්යයන් සහ කොළඹ සහ පිටත ප්‍රදේශය සඳහා ප්‍රධාන ජලාපවහන සැලසුම් සකස් කිරීම සිදු කර ඇත. 2018 වර්ෂය සඳහා වෙන් කරන ලද භාණ්ඩාගාර ප්‍රතිපාදනය රු.මිලියන 12කි. ප්‍රධාන ජලාපවහන යෝජනා නවයක් සම්පූර්ණ කර ඇත. තවත් යෝජනා අටක් ක්‍රියාත්මක වෙමින් පවතී. ඉහත ව්‍යාපෘති 17 ලැයිස්තුව පහත දැක්වේ.

අංකය	ව්‍යාපෘතිය	සටහන්
1	මහ සහ කුඩා වස්කඩුව - කළුතර ප්‍රදේශය සඳහා වැසි ජල අපවහන පද්ධතිය.	සැලසුම් අදියර 1 සහ 11 ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් අධීක්ෂණය කිරීම
2	කොස්වත්ත සඳහා "නගර මලාපවහන ප්‍රධාන සැලැස්ම". (JICA)	සංකල්ප නිර්මාණය ඉදිරිපත් කර ඇත පාරිසරික බලපෑම් තක්සේරුව සිදු කරමින් පවතී
3	කිරිමණ්ඩල මාවතෙහි ලේක් ඩ්‍රයිව් මාර්ගය ඔස්සේ ඉතිරි ගේබියන් වැඩ සැලස්ම (ලේක් ඩ්‍රයිව් සංවර්ධන ව්‍යාපෘතිය සහ පාලම)	සැලසුම් සම්පූර්ණ කර ඇත, ක්‍රියාවට නැංවීමේ කාර්යයන් සිදු කරමින් පවතී
4	කැලණිමුල්ල මංසන්ධියේ ජලාපවහන වැඩිදියුණු කිරීමේ කටයුතු	සැලසුම් කිරීම සම්පූර්ණ කර ඇත
5	නාරාහෙන්පිට කිරිමණ්ඩල මාවත ප්‍රදේශයේ යෝජිත නාගරික ජලාපවහන සංවර්ධන ව්‍යාපෘතිය.	NPD අනුමැතිය අපේක්ෂිතය
6	බේරුවල දර්ගා නගරය සඳහා ජලාපවහන සැලැස්ම සකස් කිරීම.	ක්ෂේත්‍ර පරීක්ෂණ සහ මැනුම් කටයුතු හඳුනාගෙන ඇත
7	පොල්දූව පාර සහ බත්තරමුල්ල, සුහුතිපුර ජලාපවහන අධ්‍යයනය සමාලෝචනය කිරීම	UDA ඉල්ලීම අනුව සමාලෝචනය කිරීම
8	කලපාලුවාවේ නෙලුම් පෙදෙසෙ වගුරු බිම වැඩි දියුණු කිරීම සඳහා ජලාපවහන සැලැස්ම.	සැලසුම් UDA වෙත ඉදිරිපත් කරන ඇත
9	වැලිසර නාවික කඳවුරට යාබද ඇළ මාර්ගය සංවර්ධනය කිරීම.	සැලසුම් ඉදිරිපත් කර ක්‍රියාත්මක කර ඇත
10	ප්‍රතිබිම්බාරාමය අසළ ඇළ ඉවුරු වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය.	සැලසුම සම්පූර්ණ කර ඇත
11	නිවී ගේට්වේ කොලේජ් අසල ඇළ ඉවුරු වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය.	සැලසුම් කිරීම සම්පූර්ණ කර ඇත. ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සිදු වෙමින් පවතී
12	දෙහිවල ද සිල්වා පාරේ ස්ථානීය ගංවතුර ඇතිවන ප්‍රදේශ සඳහා ජලාපවහන යෝජනාව.	ජලාපවහන යෝජනාව DMMCට ඉදිරිපත් කර ඇත
13 14	කොස්වත්ත ප්‍රදේශයේ UDA ප්‍රධාන සැලැස්ම සමාලෝචනය කිරීම	සැලසුම් සම්පූර්ණ කර ඇත වැඩිදියුණු කිරීම සිදු කරමින පවතී
	කඩුවෙල ප්‍රදේශයේ ජලාපවහන වැඩිදියුණු කිරීම - OCH ට ආසන්නයි බෝමිරිය ප්‍රදේශය	ජලාපවහන යෝජනාව කඩුවෙල නාගරික සභාවට ඉදිරිපත් කර ඇත
15	උණවටුන ලන්දේසි ඇළ සඳහා ජලාපවහන යෝජනාව.	NPD අනුමැතිය අපේක්ෂිතය
16	නුගේගොඩ, පාගොඩ ඇළ ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය.	
17	විද්‍යා පාරේ දැනට පවතින ඇළ මාර්ග පද්ධතිය ඔස්සේ මැනුම් කාර්යයන්	කොන්ත්‍රාත් ප්‍රදානය

- **මොරටුව රත්මලාන උප ද්‍රෝණියේ සවිස්තරාත්මක ජලාපවහන අධ්‍යයනය**

ව්‍යාපෘති කාල සීමාව: 2018.01.01 - 2018.12.31
මුළු ඇස්තමේන්තුගත පිරිවැය: රු.මිලියන 30.00

මොරටුව - රත්මලාන උප ද්‍රෝණිය පිහිටා ඇත්තේ වේරළ ගඟ ද්‍රෝණියේ බටහිර කොටසේ ය. උප ද්‍රෝණියේ විශාලත්වය කි.මී. 8.1 කි. කඳවල සහ තෙලවල අතර මධ්‍ය ප්‍රදේශය ජනාකීර්ණ නේවාසික ප්‍රදේශ සහ කාර්මික සංකීර්ණවලින් සමන්විත වේ. ජලාපවහන පද්ධතියක් නොමැති වීම සහ භූ විෂමතා අවහිරතා හේතුවෙන් පහත් බිම්වල ජලාපවහන තත්ත්වය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකිය. නාගරීකරණය හේතුවෙන් ඉහළ ගොස් ඇති මතු පිට ගැලීමට සාර්ථකව මුහුණ දීම සඳහා මොරටුව - රත්මලාන උප ද්‍රෝණිවල ප්‍රධාන ඇළ මාර්ගය සහ ප්‍රධාන අතුරු ඇළ මාර්ග වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ. ද්‍රෝණිවල ඇති වන ගංවතුර හානිය අවම කිරීම සඳහා එය ක්‍රියාවට නැංවීමට නියමිතය.

ජල විද්‍යාත්මක හා හයිඩ්‍රොලික් දත්ත මෙන්ම සමීක්ෂණ දත්ත එකතු කිරීම 2016 සහ 2017 වර්ෂවලදී දියත් කරන ලද අතර උප ද්‍රෝණියේ 1 සඳහා එය බොහෝ දුරට අවසන් වී ඇත. උප ද්‍රෝණිය 1 සඳහා සංකල්පීය සැලසුම් සකස් කරමින් පවතී.

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ අවට පරිසරය වැඩිදියුණු කිරීම තුළින් අධ්‍යයන ප්‍රදේශය තුළ ජලාපවහන ජාලය හා ජනයාගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමයි.

- දත්ත එක්රැස් කිරීම
- ප්‍රධාන බෝක්කුව ඉදිකිරීම
- කෙටුම්පත් අදියර යටතේ සංකල්පීය සැලසුම් සකස් කිරීම
- JICA කණ්ඩායම සමඟ ප්‍රධාන ජල අපවහන සැලැස්ම සකස් කිරීම
- ඉඩම් අත්පත් කර ගැනීම
- දේශීය අරමුදල් සැපයීමේ සංසටකය ගණනය කිරීම

2018 වර්ෂයේදී, උප ද්‍රෝණියේ 1 හි ජලාපවහන වැඩිදියුණු කිරීමේ කටයුතු ආරම්භ කිරීමට සහ උප ද්‍රෝණියේ 2 සහ 3 සමාලෝචනය කිරීමට (පොම්පාගාරය හැර) සහ තෝරාගත් ප්‍රධාන ඇළ මාර්ගවල සවිස්තරාත්මක සැලසුම් සම්පූර්ණ කිරීමට සංස්ථාව සැලසුම් කරන ලදී. උප ද්‍රෝණියේ 1 සඳහා ජලාපවහන යෝජනාව ක්‍රියාත්මක කිරීමට පෙර හඳුනාගත් ප්‍රධාන ඇළ මාර්ගය සඳහා පවුල් කිහිපයක් නැවත ස්ථානගත කළ යුතුය.

2016.08.29 දිනැති අංක NPD/UDA/201/6/PP/20 ලිපියෙහි නිර්දේශයට අනුව විදේශීය අරමුදල් මඟින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට NPD විසින් අනුමැතිය ලබා දී ඇත. මේ අතර 2003 වසරේදී සිදු කරන ලද "කොළඹ පුරවර කලාපය සඳහා වූ වැසි ජල අපවහන සැලැස්ම" සමාලෝචනය කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා JICA විශේෂඥ කණ්ඩායමක් ශ්‍රී ලංකාවට පැමිණියේය. සාකච්ඡාවලින් පසුව 2018 වර්ෂය තුළ ශ්‍රීලඉගොසංස සමඟ සම්බන්ධීකරණයෙන් සමස්ත මොරටුව, රත්මලාන උප ද්‍රෝණියේ ජලාපවහන අධ්‍යයනය සමාලෝචනය කිරීමට ඔවුන් එකඟ විය.

➢ පැලියගොඩ මුදුන් ඇළ උප ද්‍රෝණියේ සවිස්තර ජලාපවහන අධ්‍යයනය

පැලියගොඩ සහ මුදුන් ඇල යනු කැලණි ගංගා ද්‍රෝණියේ පහළින් පිහිටා ඇති උප ද්‍රෝණි දෙකකි. ජලාපවහන පද්ධතියේ ධාරිතාවය ප්‍රමාණවත් නොවීම සහ සැලසුම් නොකළ නාගරීකරණය හේතුවෙන් මෙම ද්‍රෝණි දෙක නිරන්තරයෙන් ගංවතුරට ලක් වේ.

එබැවින් ද්‍රෝණියේ ගංවතුර බලපෑමට පිළියම් යෙදීම සඳහා ජලාපවහන පද්ධතිය වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට සැලසුම් කර ඇත. ඉහත අධ්‍යයනයට සමගාමීව ඔලියමුල්ල පිහිටි ද්‍රෝණියේ පිටවානෙහි පොම්පාගාරයක් ඉදිකිරීමට සහ ආශ්‍රිත ජලාපවහන ජාලය වැඩිදියුණු කිරීමට සැලසුම් කර ඇත.

2017 වර්ෂයේ දී අත්කර ගත් ඉලක්ක වූයේ භූ විද්‍යාත්මක හා භූ තාක්ෂණික සමීක්ෂණය, පවත්නා ඇළ මාර්ග පද්ධතිය ඇගයීම සහ හයිඩ්‍රොලික් ආකෘතිය පිහිටුවීමයි. සමීක්ෂණය අතරතුරදී මඟ හැරුණු අධ්‍යයනයට අදාළ ක්ෂේත්‍ර දත්ත කිහිපයක් එකතු කරන ලදී.

2018 වර්ෂයේදී හයිඩ්‍රොලික් මොඩල් සැකසුම අවස්ථා කිහිපයක් සහ විවිධ ප්‍රතිලාභ කාලයන් සඳහා සියුම්ව සීරු මාරු කර ඇත. ලබාගත් ප්‍රතිඵල අනුව ජලවිද්‍යාව හා හයිඩ්‍රොලික් අධ්‍යයන වාර්තාව සකස් කිරීම ආරම්භ කරන ලදී.

➢ අත්තනගලු ඔය සහ ජා-ඇළ මූලික අධ්‍යයනය

අත්තනගලු ද්‍රෝණියේ ගංවතුරට ප්‍රධාන හේතු වී ඇත්තේ ප්‍රධාන ගංගාවලින් (අත්තනගලු ඔය, උරුවල් ඔය, දඬුගම් ඔය ජා-ඇළ) පිටාර ගැලීම, මුතුරාජවේල වගුර අවට පහත බිම්වල ස්වාභාවික ජලාපවහන දුෂ්කරතා සහ වැසි ජල අපවහන පද්ධතියේ ධාරිතාව නොමැති වීමය.

ශ්‍රීලඉගොසංස විසින් මූලික අධ්‍යයන හා මැනුම් කටයුතු සිදු කිරීමට පියවර ගෙන ඇති අතර සියත උයන - ගම්පහ ප්‍රධාන ජලාපවහන යෝජනාව සකස් කිරීමද මෙම ප්‍රතිපාදන යටතේ අවසන් කර ඇත.

2018 වර්ෂය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.මිලියන 5 කි.

➢ දික්ඕවිට ගංවතුර ගේට්ටු ඉදිකිරීම

ව්‍යාපෘති කාලය: 2017 - 2019
මුළු ඇස්තමේන්තුගත පිරිවැය: රු.මිලියන 240.00 කි.

දික්ඕවිට ප්‍රදේශය ගංවතුරට ලක් වී ඇති කාලය අවම කිරීම සඳහා ගංවතුර ඉතා සීඝ්‍රයෙන් මුහුදට ගලා යැවීම කළ යුතුය. නව පාලම යටින් ගලා බැස මුහුදු ඉදිරිපස පාලමට යාබදව ඉදිකර ඇති ගංවතුර ගේට්ටු තුන කරා එන ජලය වේගයෙන් මුහුදට ගලා බැසීමට දික්ඕවිට පිහිටි ලුනාව මෝයෙහි මුහුදට ජලය බැස යන පිටවාන පහසුකම් සපයයි. ප්‍රදේශයේ අධික ගංවතුර කාලවලදී අතින් ක්‍රියාත්මක වන ගංවතුර දොරටු විවෘත කරනු ලැබේ. මෑත කාලයේදී වත්තල, දික්ඕවිට සහ ගම්පහ දිස්ත්‍රික්කයේ බරපතල ගංවතුර තත්ත්වයක් ඇතිවීමත් සමඟ, වේගවත් සහනයක් ලබා ගැනීම සඳහා ප්‍රදේශයේ දැනට පවතින ජලය බැස යෑමේ පිටවාන වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. මෙම ප්‍රදේශ සඳහා ගංවතුර ජලය මුහුදට ගලා යාම කැළණි ගං මෝය හරහා සිදු වේ. එසේම හැමිල්ටන් ඇළ සහ ලන්දේසි ඇළ මීගමුව කලපුවට ගලා බසී. මෑතදී ඇති වූ ගංවතුර තත්ත්වවලදී ඒවා ප්‍රමාණවත් නොවන බව පැහැදිලි විය. එබැවින් කැළණි ගං මෝය සහ මීගමුව කලපුව අතර අතිරේක පිටවානක් ඉදිකිරීම අත්‍යවශ්‍ය වේ. පසුගිය වසර 60 ක කාලය තුළ ලුනාව පිටවාන පිහිටි ස්ථානය ප්‍රදේශයේ ප්‍රජාව විසින් ගංවතුර ජලය මුහුදට ගෙන යාම තෝරා ගෙන ඇති අතර එම

ස්ථානයේ බොරළු පාර ඔවුන් විසින් අතින් කපා දමමින් එම කාර්යය සිදු කර ඇත.



මෙම ව්‍යාපෘතිය ගම්පහ දිස්ත්‍රික්කයේ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 168B දික්ඕවිට ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ස්ථානගතව ඇත. යෝජිත ව්‍යුහයේ ප්‍රධාන කොටස් වන්නේ උස් පාලමක් සහ ඊට යටින් වූ ගංවතුර බැහැර කිරීමේ දොරටු තුනක් ය. අධික ගංවතුර කාලවලදී පමණක් ගංවතුර දොරටු තුන විවෘත කරනු ලැබේ. දැඩි වර්ෂා කාලවලදී ප්‍රදේශයේ ප්‍රජාවට වසර ගණනාවක් තිස්සේ මුහුණ දීමට සිදු වූ දුෂ්කරතා සහ අපහසුතාවයන් මෙමඟින් අවම වනු ඇත.



කුළුණු අත්තිවාරම් සහ මුහුදු ආශ්‍රිත පෝරු ටැඹ කාන්දු බාධකය 2017 වර්ෂය තුළදී නිම කර ඇත. පාලම් කුළුණුවල ඉතිරි කාර්යයන්, පැති බැම්, පාලම් තට්ටුව, ගංවතුර ගේට්ටු සවි කිරීම, පිවිසුම් මාර්ගය සහ ගේබියන් බැම් භාවිතා කරමින් ඉවුරු ආරක්ෂා කිරීම 2018 වර්ෂයේදී සම්පූර්ණ කරන ලදී. ව්‍යාපෘතිය නිම කර ඇති අතර ක්‍රියාත්මක වේ.

1. **මුල්ලේරියාව ප්‍රධාන සැලැස්මේ ජල අපවහන වැඩි දියුණු කිරීමේ කාර්යයන්**

ව්‍යාපෘති කාල සීමාව: 2018 - 2019
2018 වර්ෂය සඳහා භාණ්ඩාගාර වෙන්කිරීම රු. මිලියන 3

ව්‍යාපෘති ප්‍රදේශය කොටිකාවත්ත - මුලලේරියාව ප්‍රාදේශීය සභා තුළ පිහිටා ඇති අතර එය උතුරට අවිස්සාවේල්ල මාර්ගයෙන් මායිම්ව ඇත, දකුණු මායිමේ අඹතලේ ජල පවිත්‍රාගාරය සහ පොම්පාගාරය පිහිටා ඇති අතර ව්‍යාපෘති ප්‍රදේශයේ නැගෙනහිර මායිමේ මාදිවෙල නැගෙනහිර හැරවුම් ඇළ මාර්ගය පිහිටා ඇත. අඹතලේ ගංවතුර දොරටුව වසා දැමූ පසු මෙම ප්‍රදේශයේ නිරන්තර ගංවතුර හා ඉඩම් ජලයෙන් යටවීම සාමාන්‍ය තත්ත්වයකි. ගංවතුර ගැටලු අවම කිරීම සහ ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමත් සමඟ ප්‍රසන්න වාතාවරණයක් ඇති කිරීම සඳහා මුල්ලේරියාව වැව සහ ඒ අවට සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ශ්‍රීලඉගොසංස අදහස් කළේය.

ව්‍යාපෘති අරමුණ වන්නේ ජලාපවහන ජාලය සහ පරිසරය වැඩිදියුණු කිරීම තුළින් ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමයි.

- සංකල්පීය සැලසුම් සකස් කිරීම
- මැනුම් කාර්යය සඳහා ටෙන්ඩර් කැඳවීම
- සවිස්තරාත්මක සැලසුම්
- ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්යය සහ නැවත පදිංචි කිරීම
- ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්යය සඳහා සැලසුම් සකස් කිරීම
- මූලික සැලැස්ම සඳහා අදාළ ආයතනවල අනුමැතිය ලබා ගැනීම
- ඇස්තමේන්තු සහ ටෙන්ඩර් ලිපි ලේඛන
- ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ කාර්යය

මූලික සැලසුම් සහ ඇස්තමේන්තු සම්පූර්ණ කර ඇත. ජලාපවහන කටයුතු සඳහා සවිස්තරාත්මක මැනුම් කටයුතු සිදු වෙමින් පවතී. ව්‍යාපෘති සංකල්ප පත්‍රය අනුමැතිය සඳහා NPD වෙත ඉදිරිපත් කරන ලදී. අනුමැතිය තහවුරු කිරීමෙන් පසු, ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සහ සවිස්තරාත්මක සැලසුම් කටයුතු ආරම්භ කිරීමට නියමිතය.



ගංවතුර පවතින අවස්ථාවක්



යෝජිත ජල අපවහන සැලැස්ම

පිළියන්දල නගර සංවර්ධන ප්‍රදේශයේ ජල අපවහනය වැඩි දියුණු කිරීමේ කාර්යය

2018 වර්ෂය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන වෙන් කිරීම රු.මිලියන 3 කි.

පිළියන්දල නගරය කොළඹ පරිපාලන ප්‍රදේශය තුළ පිහිටි තදාසන්න නගරවලින් එකකි. එබැවින් එය සංවර්ධනය සඳහා ඉහළ ඉල්ලුමක පවතී. පවතින නගරය දැනටමත් තදබදයෙන් පිරී ඇත. එබැවින් අතහැර දමා ඇති කුඹුරු ඉඩමක් සංවර්ධනය කර බස් නැවතුම්පොළ, වෙළඳපොළ යනාදිය එම ස්ථානයට ගෙන යාමෙන් නගරය පුළුල් කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය යෝජනා කර ඇත. කොළඹ / හොරණ මාර්ගයේ රථවාහන තදබදය වළක්වා ගැනීමට සහ දක්ෂිණ අධිවේගී මාර්ගයට පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිදි ජාලියගොඩ සිට කැස්බෑව හන්දිය දක්වා දිවෙන මඟහැරයෑමේ මාර්ගයක් දැනටමත් ඉදිකර ඇත.

යෝජිත ප්‍රදේශයේ වැඩි කොටසක් (සංවර්ධනය කිරීමට) පිහිටා ඇත්තේ තුම්බෝවිල වගුරු බිමෙහි ඉහළ කොටසෙහි ය. පිළියන්දල නගරය අවට උස්බිම් වලින් ගලා බසින වැසි ජලය මෙම වගුරු බිම හරහා ගලා ගොස් තුම්බෝවිල ගම්මානය සහ කරදියන කසළ බැහැර කිරීමේ ස්ථානය හරහා වේරස් ගඟට මුදා හරිනු ලැබේ. මේ වනවිට මඟහැරයෑමේ මාර්ගයද සහ පිළියන්දල නගරයද ඇතුළුව පුරවා ඇති භූමි ප්‍රමාණය අක්කර 40 ක් පමණ වේ. ස්ථානීය ගංවතුර අවම කිරීම සහ මඟහැරයෑමේ මාර්ගය දෙපස නීති විරෝධී ඉඩම් පිරවීම වැළැක්වීම පිණිස ඉහත ඉඩම් පිරවීම පියවීම සඳහා සහ ජල අපවහනය වැඩි දියුණු කිරීමේ කාර්යයන් සඳහා අක්කර 15 ක පමණ භූමි ප්‍රදේශයක වැවක් හැරීමට යෝජනා කෙරේ.

හරස් මාර්ගවල දැනට පවතින බෝක්කු ප්‍රතිසංස්කරණය කිරීම හා පුළුල් කිරීම සහ ඇළ මාර්ග සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු මෙම ව්‍යාපෘතියේ අනෙකුත් අංග වේ.

යෝජිත සේවා මාර්ගය සහ වැව් ඉවුර ඔස්සේ ඇවිදීමේ මංතීරුව සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සිදු වෙමින් පවතී.

2018 - 2021 කාලය සඳහා රු. මිලියන 993ක මුළු පිරිවැය සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත.

සවිස්තරාත්මක සැලසුම් කටයුතු ආරම්භ කර ඇති අතර බෝක්කු ඉදිකිරීම සහ බස් නැවතුම්පොළ සංවර්ධනය කිරීම සඳහා RDA සහ UDA සමඟ සම්බන්ධීකරණය කරමින් පවතී.

තෙත් බිම් කළමනාකරණ අංශය

මහ කොළඹ ගංවතුර පාලන හා පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අත්පත් කර ගත් සීමාවන් තුළ මායිම් නැවත විවෘත කිරීම සහ අනවසර ඉඩම් සීමා ලකුණු කිරීම.

ඉහත ව්‍යාපෘතිය යටතේ 1989 වර්ෂයේදී ජලය රඳවා ගැනීමේ කාර්යයන් සඳහා රජය විසින් ඉඩම් අත්පත් කර ගන්නා ලදී.

වර්තමානයේදී, 1989 දී ස්ථාපිත කරන ලද මායිම් ගල් භෞතිකව ක්ෂේත්‍රයේ නොමැති අතර මෙම ප්‍රදේශය තුළ අනවසරයෙන් අල්ලා ගැනීම් සහ අනවසර ඉඩම් පිරවීම් වැඩි වී ඇත. එවැනි ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ප්‍රධාන හේතුව එය විය.

මායිම් නැවත විවෘත කිරීමේ ව්‍යාපෘතිය යටතේ, අත්පත් කරගත් ප්‍රදේශය තුළ වගුරු බිම් හතරක් තෝරා ගන්නා ලදී.

1. කෝට්ටේ වගුරු බිම
2. කොලොන්නාව වගුරු බිම
3. පාර්ලිමේන්තු ඉහළ රඳවාගැනීමේ ප්‍රදේශය
4. හීන් ඇළ වගුරු බිම



එම වගුරු හතරෙන් 2017 වර්ෂය අවසානයේදී කෝට්ටේ, කොලොන්නාව සහ පාර්ලිමේන්තුවේ ඉහළ රැඳවුම් වගුරු බිම්වල මායිම් නැවත විවෘත කිරීම අවසන් කරන ලදී. 2018 වර්ෂය සඳහා අපට සම්පූර්ණ කිරීමට සිදු වූයේ හීන් ඇළ වගුරු බිම් පමණක් වන අතර එම වර්ෂය සඳහා රු.මිලියන 1.8 ක් භාණ්ඩාගාරය විසින් වෙන් කරන ලදී.



කෝට්ටේ - අක්කර 233.6



කොලොන්නාව - අක්කර 380



පාර්ලිමේන්තු ඉහළ රැඳවුම - අක්කර 69.9



හීන් ඇළ - අක්කර 201

මේ වනවිට ව්‍යාපෘතිය නිම කර ඇති අතර සියලුම භාණ්ඩාගාර ප්‍රතිපාදන සංස්ථාව විසින් ඉල්ලා ඇත.

බස්නාහිර පළාත සඳහා තෙත් බිම් කළමනාකරණ උපාය මාර්ග (WMS) සකස් කිරීම

කළු ඔය, මුදුන් ඇළ සහ අත්තනගළු ඔය ද්‍රෝණිය සඳහා තෙත් බිම් කළමනාකරණ උපාය මාර්ග (WMS)

බස්නාහිර පළාතේ ජනතාවගේ යහ පැවැත්ම උදෙසා තෙත් බිම් වැදගත් වේ. සියලුම තෙත් බිම්, වඩාත් අයහපත් තත්ත්වයක පවතින ඒවා පවා මානව යහපතට දායක වන ප්‍රතිලාභ රැසක් සපයයි. නාගරික සන්දර්භය තුළ අත්‍යවශ්‍ය ස්වාභාවික යටිතල පහසුකමක් ලෙස තෙත් බිම් ප්‍රධාන වශයෙන් ගංවතුර ඇතුළු නාගරික ගැටලු රාශියකට විසඳුම් සැපයීමේ හැකියාවෙන් යුක්ත වේ.

තෙත් බිම්වලින් ලැබෙන සියලු ප්‍රතිලාභ නොසලකමින් මානව මැදිහත්වීම් හේතුවෙන් තෙත් බිම් සම්පූර්ණයෙන්ම නැති වී යෑමට හෝ ක්‍රමයෙන් පිරිහෙමින් පවතී. තෙත් බිම්වල වාසි බොහෝ විට නොපෙනෙන අතර ඒවා නැති වූ විට පමණක් ඒවායේ වටිනාකම් පැහැදිලිව දැකිය හැකි වන අතර නොමිලේ ලැබෙන මෙම සේවා ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දැරිය යුතු නොපෙනෙන පිරිවැය පැහැදිලි වනු ඇත. එබැවින්, නාගරික තෙත්බිම් ප්‍රදේශ සංරක්ෂණය හා තිරසර කළමණාකරණය නගරය තුළ සිදු කරමින් පවතින සංවර්ධන ක්‍රියාකාරකම්වල අත්‍යවශ්‍ය කොටසක් ලෙස සැලකීමෙන් ක්‍රියාකාරකම් දෙකම එකවර සිදු කළ යුතු වන අතර එකිනෙක සමඟ සහයෝගයෙන් සිදු විය යුතුය.

තෙත්බිම් ඥානාන්විතව භාවිතා කිරීමේ අරමුණින් කොළඹ පුරවර කලාපය සඳහා තෙත් බිම් කළමනාකරණ උපාය මාර්ගයක් (WMSM) 2016 දී සකස් කරන ලද අතර එය සමස්ත බස්නාහිර පළාත සඳහා WMS සකස් කිරීමේ අඛණ්ඩව නිරත වේ. ඒ අනුව, කළු ඔය සහ මුදුන් ඇළ ද්‍රෝණි සහ අත්තනගලු ඔය ද්‍රෝණිය සඳහා තෙත් බිම් කළමනාකරණ උපාය මාර්ග ක්‍රියාවට නැංවීම 2017 වර්ෂයේදී සිදු කරන ලදී. කළු ඔය සහ මුදුන් ඇළ සඳහා WMS සකස් කිරීම තෙත් බිම් කළමනාකරණ අංශයේ (WMD) කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව උපදේශක කණ්ඩායමක් විසින් සිදු කරමින් පවතින අතර අත්තනගලු ඔය ද්‍රෝණිය සඳහා WMS සකස් කිරීම WMD කාර්ය මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ.

ව්‍යාපෘති ක්‍රියාකාරකම්වලට පහත සඳහන් කරුණු ඇතුළත් වුවද ඒවාට පමණක් සීමා නොවේ;

1 පරිසර විද්‍යාව, ජලයේ ගුණාත්මකභාවය, ජල විද්‍යාව, පස, අවසාදිත, සමාජ ආර්ථික ලක්ෂණ සහ තෙත් බිම්වල පරිසර පද්ධති සේවා පිළිබඳ අධ්‍යයනයන්;
2 තෙත් බිම් ආර්ථික ඇගයීම;
3 තෙත් බිම් සිතියම්ගත කිරීම සහ කලාපකරණය කිරීම;
4 තෙත් කළමනාකරණ උපායමාර්ග සකස් කිරීම; සහ
5 පුහුණු කිරීම, ධාරිතා වර්ධනය සහ ආයතනික ශක්තිය වැඩි කිරීම

ඒ අනුව, කළු ඔය සහ මුදුන් ඇළ ද්‍රෝණිවල තෙත්බිම් කළමනාකරණ උපාය මාර්ග සකස් කිරීම පිළිබඳ අධ්‍යයනය 2018 දී අවසන් කරන ලදී. මෙම අධ්‍යයනයේ ප්‍රධාන ප්‍රතිඵල වූයේ තෙත්බිම් කළමනාකරණය සඳහා ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් සමඟින් කළු ඔය සහ මුදුන් ඇළ ද්‍රෝණි තෙත්බිම්වල පරිසර විද්‍යාව, ජලයේ ගුණාත්මකභාවය, පාංශු අවසාදිත, සමාජ ආර්ථික ලක්ෂණ සහ පරිසර පද්ධති සේවා පිළිබඳ තාක්ෂණික වාර්තාය.

තෙත්බිම් කළමනාකරණ උපාය මාර්ගයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙන් සැලකිය යුතු සමාජ, පාරිසරික හා ආර්ථික ප්‍රතිලාභ ලබා දෙනු ඇත. එනම් ගංවතුරෙන් සාර්ථක ලෙස ආරක්ෂා වීම, ජලයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, අධික වායු උෂ්ණත්වය අඩු කිරීම, පුරවැසියන්ගේ සෞඛ්‍යය වැඩි දියුණු කිරීම, දේශගුණික විපර්යාස අවම කිරීම, ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම, නාගරික දුප්පතුන්ට සැලකිය යුතු ප්‍රතිලාභ අත්වන අතර නගර වඩාත් ජීවත්වීම සඳහා සුදුසු පරිසර බවට පත් කිරීමට තෙත්බිම් තවත් ප්‍රතිලාභ බොහෝ ගණනක් සපයයි.

ව්‍යාපෘති ප්‍රදේශයේ සිතියම



දියසරු උද්‍යානය

තෙත්බිම් ආශ්‍රිත CEPA (සන්නිවේදනය, අධ්‍යාපනය, සහභාගීත්වය සහ දැනුම්වත්භාවය) ක්‍රියාකාරකම් සහ දේශීය හා විදේශීය සංචාරකයින් සඳහා සංචාරක ගමනාන්තයක් සපයන තෙත්බිම් මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කරන කොළඹ නගරයේ ප්‍රධානතම ආකර්ශනීය ස්ථානයක් බවට දියසරු උද්‍යානය පත්ව ඇත. 2018 වසර දියසරු උද්‍යානයට සුවිශේෂී වසරක් වූ අතර ඒ සඳහා එම උද්‍යානය එහි 5 වන සංවත්සරය සැමරීම පමණක් නොව, බොහොමයක් වැදගත් සිදුවීම් ද හේතු විය.

නාගරික තෙත්බිම් නුවණැති භාවිතය සහ තිරසර කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනය සහ දැනුම්වත්භාවය වැඩි දියුණු කිරීම සඳහා 2018 වර්ෂයේදී උද්‍යානය විසින් බොහෝ ක්‍රියාකාරකම් සංවිධානය කර ක්‍රියාවට නැංවීය. ලෝක තෙත්බිම් දිනය - 2018 සැමරුමට මෙම උද්‍යානය විශාල කාර්යභාරයක් ඉටු කළේය. සොබාදහමේ ඡායාරූප ප්‍රදර්ශන සතියක්, පාසල් ළමුන් සඳහා තෙත්බිම් වැඩමුළුවක් සහ ජාත්‍යන්තර විශේෂඥයන්ගේ සහභාගිත්වයෙන් සහ දේශීය සංචාරකයින් 2500 කට ආසන්න පිරිසකගේ සහභාගිත්වයෙන් තෙත්බිම් ජෛව විවිධත්ව මහජන වැඩමුළු පවත්වමින් ශ්‍රීලඉගොසංස විසින් වැඩසටහන් මාලාවක් සංවිධානය කරන ලදී. ඊට අමතරව දියසරු ස්වේච්ඡා කණ්ඩායම සහ එකකට පසුව එකක් වශයෙන් ළමුන් සහ වැඩිහිටියන් සඳහා සෑම මසකට තුන්වන සතියේ විශේෂ තේමාවක් යටතේ වැඩසටහනක් පවත්වන තෙත් බිම් සති අන්ත වැඩසටහනක් වැනි නව වැඩසටහන් රාශියක් උද්‍යානය තුළ ආරම්භ කළේය. මෙම වැඩසටහන් හරහා විශාල ආගන්තුක ප්‍රජාවක් මේ වනවිට උද්‍යානය සමඟ සම්බන්ධ වී ඇත. මීට අමතරව, උද්‍යානය විසින් විවිධ පාර්ශවකරුවන්, කණ්ඩායම් සඳහා අඛණ්ඩ දැනුවත් කිරීමේ වැඩසටහන් ද පවත්වන ලදී.

දියසරු උද්‍යානය සෑමවිටම එහි අමුත්තන්ට අද්විතීය අත්දැකීම් ලබා දීමට උනන්දු වෙයි. එබැවින්, ශ්‍රීලඉගොසංස වේ 50 වන සංවත්සරය වෙනුවෙන් උද්‍යානය විසින් සංගීතය තුළින් මිනිසුන් ස්වභාව ධර්මය වෙත වඩාත් සමීප කරවීම සඳහා "නිශ්ශබ්දතාවයට සවන් දෙන්න" නමින් හරිත සංධිවනියක් සංවිධානය කරන ලදී. තෙත්බිම් මධ්‍යස්ථානය කලාව හා සංගීතය සමඟ ඇති ශක්තිමත් සම්බන්ධතාවය මෙම පොදු උත්සවය තුළින් අනාවරණය විය. උද්‍යානය සම්බන්ධයෙන් මහජනතාව අතර ඇති ජනප්‍රියතාවය විදහා දක්වමින් උද්‍යානය තුළ පවත්වන ලද බාහිර උත්සව අවස්ථා සංඛ්‍යාවේ සහ වර්ගයන්හි සැලකිය යුතු වැඩිවීමක්ද මෙම වර්ෂය තුළ පෙන්නුම් කළේය.

වාසස්ථාන වැඩිදියුණු කිරීම, නරඹන්නන්ගේ ආකර්ශණයට ලක් වන ප්‍රදේශ සහ නව ඉදිකිරීම් ඇතුළත් වන නරඹන්නන් ආකර්ෂණය කර ගැනීම, අමුත්තන්ගේ පහසුකම් වැඩිදියුණු කිරීම මෙන්ම උද්‍යාන නඩත්තු කාර්ය මණ්ඩලයේ පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා නව භෞතික අංග රැසක් උද්‍යානය විසින් හඳුන්වා දෙන ලදී. මෙම ලක්ෂණ වන්නේ; උද්‍යානයේ තණ පිඩලි ඇල්ලූ ප්‍රදේශ සහ ආසන පහසුකම් වැඩි කිරීම, නාගරික වවුලන් සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා වවුල් නිවස්නය, නව සපුෂ්පක ප්‍රදේශ, නව ආවේණික තෙත්බිම් පැල 50 ක් හඳුන්වා දීම, කුරුල්ලන්ගේ වාසස්ථාන වැඩිදියුණු කිරීම, පුළුල් ඇවිදීමේ මංතීරු, විශේෂයෙන් ඡායාරූප රූගත කිරීම් සඳහා නව පාලම් ආදියයි. 2018 වර්ෂයේ ආරම්භ කරන ලද ප්‍රධාන ඉදිකිරීම් වන්නේ නාගරික ජලය සඳහා මධ්‍යස්ථානයේ සවි කර ඇති තථ්‍ය කාලීන ගංවතුර නිරීක්ෂණ පද්ධතියට සම්බන්ධ සොරොව් ගේට්ටුව සහ නව ශ්‍රමික නිල නිවාසයි. 2020 වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කරමින් ඉදිකිරීම් අංශය විසින් ඉදිරිපස ප්‍රවේශ ප්‍රදේශය සහ පිවිසුම් ගොඩනැගිල්ල ඉදිකිරීම ආරම්භ කරන ලදී.

2018 දී උද්‍යානය සැලකිය යුතු ජාත්‍යන්තර පිළිගැනීමක් ලබා ගත්තේය. 2018 වර්ෂය තුළ බොහෝ ජාත්‍යන්තර නියෝජිතයින් පැමිණි අතර, ඉන්, පෙබරවාරි මාසයේ රැ මිසාර් Pre-COP නියෝජිතයින්ගේ සංචාරය, මාලදිවයිනේ ලෝක බැංකු නියෝජිතයින් සඳහා පවත්වන ලද වැඩමුළුව සහ කොළඹදී පවත්වන ලද ආසියානු දේශගුණික විපර්යාස අනුවර්තන වැඩමුළුවේ නියෝජිතයන්ගේ සංචාරය කැපී පෙනුණි. මෙම ජාත්‍යන්තර නිරාවරණයවීම් හේතුවෙන් තෙත් බිම් සම්බන්ධ අන්තර්ජාතික-ආසියාවේ මෙහෙයුම් කණ්ඩායම සඳහා දකුණු ආසියානු නියෝජිතයා ලෙස තෝරා ගැනීමෙන් දියසරු විශිෂ්ට ජයග්‍රහණයක් ලබා ගත්තේය.

විදේශීය සංචාරකයින්ගේ සැලකිය යුතු වැඩි වීමක් ද ඇතුළුව 2018 වර්ෂය තුළ උද්‍යානය නැරඹීමට පැමිණි අමුත්තන් සංඛ්‍යාව 30,440 ක් විය. 2018 වර්ෂයේදී

දියසරු උද්‍යානය පිළිබඳව බොහෝ රූපවාහිනී වාර්තා වැඩසටහන් සහ පුවත්පත් ලිපි පළ විය. ඊට අමතරව උද්‍යානයේ ප්‍රධාන අලෙවිකරණ මෙවලම වන උද්‍යාන ෆෙස්බුක් පිටුව 2018 වර්ෂය අවසානයේදී නැරඹීම් 4000 පසු කරන ලදී.







කළු ඔය ද්‍රෝණිය සඳහා වැසි ජල අපවහන සහ පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - ශක්‍යතා අධ්‍යයනය

කළු ඔය යනු වර්ග කි.මීටර් 61ක වෙරළාශ්‍රිත ද්‍රෝණියකි. එය කොළඹ නගරයට සහ කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල ප්‍රධාන යටිතලවැසුහවලට ආසන්නව පිහිටා ඇත. රටේ වේගයෙන් නාගරිකරණය වන ප්‍රදේශයක කළු ඔය ද්‍රෝණියේ පිහිටීම සහ කොළඹ නගරය සහ ජාත්‍යන්තර ගුවන් තොටුපළ අතර එහි ස්ථානගත වීම සහ දිවයිනෙහි පවතින අධිවේගී මාර්ග තුන ආශ්‍රිතව තිබීම හේතුවෙන් වැසි ජල අපවහන කළමනාකරණය භාරව සිටින ඉහළම ජාතික ආයතනය ලෙස ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (ශ්‍රීලඉගොසංස) ද්‍රෝණියේ ගංවතුර අවම කිරීම සඳහා සැලසුම් සකස් කිරීමට ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දී ඇත. ඉහත සන්දර්භය තුළ ශ්‍රීලඉගොසංස, SMEC විශේෂඥයන්ගේ සහයෝගිත්වයෙන් 2016 සිට 2018 දක්වා කාලය තුළ කළු ඔය ද්‍රෝණිය සඳහා ශක්‍යතා අධ්‍යයනය සිදු කර ඇත.

මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වන්නේ ද්‍රෝණියේ ගංවතුර අවම කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග හඳුනාගැනීම සහ ද්‍රෝණිය තුළ ජීවත් වන ප්‍රජාව ද්‍රෝණියේ ඇති වන ගංවතුරෙන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ ජීවන තත්ත්වයන් නඟා සිටුවීමයි.

දැනට පවතින ඇළ මාර්ගයේ තෝරාගත් දිගක් වැඩිදියුණු කිරීමෙන් සහ පවතින තෙත්බිම් රඳවා තබා ගැනීමේ ප්‍රදේශයක් ලෙස භාවිතා කිරීමෙන් හෙක්ටයාර 300 කට වැඩි භූමි ප්‍රමාණයක් ජලයෙන් යටවීමෙන් වළක්වා ගත හැකි වනු ඇති අතර පරිසරය වැඩිදියුණු වීමෙන් ද්‍රෝණියේ ඇති භූමියේ වටිනාකම වැඩි වනු ඇතැයි අධ්‍යයනයෙන් හෙළි වේ.

එපමණක් නොව, ගංවතුර අවම කිරීම සඳහා හඳුනාගත් විසඳුමක් ලෙස, දැනට පවතින වගුරු බිම් බොහොමයක් අනවසරයෙන් අත්පත් කර ගැනීම වැළැක්වීම සඳහා සීමා මායිම් සලකුණු කිරීම සහ පොදු එළිමහන් විනෝදාස්වාද පහසුකමක් ලෙස භාවිතා කළ හැකි තෙත්බිම් සඳහා ප්‍රවේශය ලබා දීමෙන් අවශ්‍ය ගංවතුර රැඳවුම් ප්‍රදේශ ස්ථාපිත කිරීම, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අමතර ආදායමක් උපයා ගැනීම සඳහා මෙන්ම තෙත්බිම් පද්ධතියේ වටිනාකම වැඩි දියුණු කිරීම සඳහා පාරිසරික වශයෙන් පිළිගත හැකි ආයෝජන (එනම් විනෝදාත්මක භාවිතයන්, උත්සව ශාලා, අවන්හල්) සඳහා යාබද උස් භූමියේ ව්‍යාපාරික පරිසරයක් සංවර්ධනය කිරීම සිදු කෙරේ.


Hamilton Canal
Old Negombo Canal
Muthurajawela Marsh
Kelani River
Indian Ocean
Colombo Harbour
Colombo - Katunayaka Expressway
Negombo Road
Outer Circular Highway
Colombo - Hanwella Low Level Road
Colombo - Kandy
Peliyagoda - Puttalam (Negombo Rd)
Railway Line
Water Bodis
Streams
Airport / Airfield
Built up area
Marsh
Paddy
SriLanka Coastline
Proposed Roads
Central Expressway
Outer Circular Highway
(Under Construction)
Existing Roads
Roads Name
Other Main Roads
Landuse
Types
Ragama
Mabole
Kadawatha
Enderamulla
Mahara
Wattala
Kiribathgoda
Peliyagoda
Colombo
Kolonnawa
SMEC
0 1.25 2.5 5 km

විශේෂ ව්‍යාපෘති අංශය

බොහෝවිට ජලවිද්‍යාත්මක/ද්‍රාව විද්‍යාත්මක කාර්යයන් සඳහා සැලසුම් සකස් කිරීම, ඇඳීම් සකස් කිරීම, පිරිවැය ඇස්තමේන්තු, ලංසු ලියවිලි සහ ක්‍රියාවට නැංවීම කළමනාකරණය කිරීම/අධීක්ෂණය කිරීම වැනි ක්‍රියාකාරකම් විශේෂ ව්‍යාපෘති අංශය විසින් භාරගනු ලැබේ. 2018 වර්ෂය තුළදී භාරගත් කාර්යයන් පහත පරිදි කාණ්ඩගත කළ හැක;

- විදේශ අරමුදල් ලැබූ ව්‍යාපෘති

1. කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය (ලෝක බැංකුව විසින් මූල්‍යාධාර ලබා දී ඇත)

- භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති

2. මාදිවෙල දකුණ හැරවුම් ව්‍යාපෘතියේ සවිස්තර අපවහන සැලසුම් සකස් කිරීම

1. කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය

කොළඹ නගරය තුළ සහ අවට ගංවතුර ඇතිවීම වර්ෂ ගණනාවක සිදු සිදු වෙමින් පවතින අතර එමඟින් සැළකිය යුතු ආර්ථික පසුබෑමක් සහ මහජනතාවගෙන් විශාල කොටසක් සඳහා සමාජ දුෂ්කරතා ඇති කරයි.

කොළඹ ජල ද්‍රෝණියෙහි ගංවතුර පාලනය, යටිතලවසුහ සහ අපවහන කළමනාකරණ පද්ධති වැඩි දියුණු කිරීම මෙන්ම යටිතලවසුහ නඩත්තු කිරීම සඳහා සහ සේවාවන් ලබාදීම සඳහා කොළඹ පුරවර ප්‍රදේශයේ මධ්‍යම සහ පළාත් පාලන ආයතනවල හැකියාවන් ඉහළ නැංවීම එක්ඛෘඡ මඟින් අරමුණු කර ඇත.

MCUDP හි සංඝටක දෙකක් ඇත;

1 වැනි සංඝටකය : ගංවතුර සහ අපවහන කළමනාකරණ

2 වැනි සංඝටකය : තිරසර පුරවර සහ පළාත් යටිතලවසුහ සහ සේවාවන් සැපයීම සඳහා ආයතන ශක්තිමත් කිරීම සහ ක්‍රියාවට නැංවීමේ සහාය

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (ශ්‍රීලඉගොසංස) යටතේ ක්‍රියාවට නංවන ලද ප්‍රධාන සංඝටකය වන්නේ ගංවතුර සහ අපවහන කළමනාකරණයයි. කොළඹ පුරවර කලාපයේ අපවහන පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා තීරණාත්මක යැයි හඳුනාගෙන ඇති ප්‍රමුඛතා ගංවතුර සහ අපවහන කළමනාකරණ යටිතලවසුහ පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා මෙමඟින් සහාය ලබා දෙනු ඇත. පවතින අපවහන පද්ධතියේ පිටවාන ධාරිතාවය වැඩිදියුණු කිරීම, නව හැරවුම් ඇළ මාර්ග සහ වැසි ජල පොම්පාගාර හඳුන්වාදීම සඳහා මෙමඟින් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ඇත.

මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් ව්‍යාපෘතිය කළමනාකරණය කරනු ලැබේ.

ශ්‍රීලඉගොසංස විසින් MCUDP යටතේ සිදු කරන ලද කාර්යයන්වල ලැයිස්තුවක් පහත දක්වා ඇත.

2018 දෙසැම්බර් 31 දිනය ප්‍රගතිය

අංකය	උප ව්‍යාපෘති අංකය	උප ව්‍යාපෘතිය
සම්පූර්ණ කරන ලද		
I	W/01	දෙහිවල ඇළ මාර්ගය
II	W/02	ප්‍රධාන අපවාන සහ මෝදර උමඟ
III	W/03/A	ශාන්ත සෙබස්තියන් දකුණු ඇළ මාර්ගය
IV		තලංගම වැව හැරීම
V	W/07/A	වැල්ලවත්ත ඇළ මාර්ගය
VI	W/11	MED - II සඳහා වැඩිදියුණු කිරීම්
සිදු කරමින් පවතින		
VII	W/05	MED - I සඳහා වැඩිදියුණු කිරීම්
VIII	W/19	MED - III සඳහා වැඩිදියුණු කිරීම්
IX	W/09	ශාන්ත සෙබස්තියන් උතුරු ඇළ මාර්ගය
X	W/12	ශාන්ත සෙබස්තියන් උතුරු දියගුළු සහ පොම්පාගාරය සැලසුම් කිරීම සහ ඉදිකිරීම
XI	W/14	නව මෝදර සහ ටොරින්ටන් උමං මාර්ගය
XII	W/13	ශාන්ත සෙබස්තියන් දකුණු පොම්පාගාරය ඉදිකිරීම
XIII	W/24	අඹතලේ පොම්පාගාරය
XIV	W/16/B	කොළොන්නාව ඇළ මාර්ග හැරවුම් - II යෝජනා ක්‍රමය
XV	W/16/C	කොළොන්නාව ඇළ මාර්ග හැරවුම් - යෝජනා ක්‍රමය III
XVI	W/18	තත්‍යකාල ඒකාබද්ධ ගංවතුර කළමනාකරණ පද්ධතියක් (සෘඔක) සැපයීම සහ සවිකිරීම
ප්‍රදානය කිරීමට ආසන්න අවධියේ පසුවන		
XVII	W/16/A	කොළොන්නාව ඇළ මාර්ග හැරවුම් - යෝජනා ක්‍රමය I
XVIII	W/16/D	කොළොන්නාව ඇළ මාර්ග හැරවුම් - යෝජනා ක්‍රමය IV
XVIX	W/20	ජලයේ තත්ත්වය ඉහළ නැංවීම සඳහා දෝර ගේට්ටු සැලසුම් කිරීම සහ ස්ථාපිත කිරීම්

සම්පූර්ණ කරල ලද ව්‍යාපෘති

I. දෙහිවල ඇළ මාර්ගයේ ඇළ ඉවුරු ආරක්ෂණ ඉදිකිරීම් සම්පූර්ණ කිරීම

කොන්ත්‍රාත් අංකය : MCUDP/SLLRDC/W/01
කොන්ත්‍රාත්කරු : ස්කොයාර් මෙක් ඉංජිනියරින් (පුද්.) සමාගම
කොන්ත්‍රාත් වටිනාකම : රු. 128,205,449.45 (වැට් බදු හැර)
ආරම්භ කළ දිනය : 20.05.2013
සම්පූර්ණ කළ දිනය : 27.02.2015



II. අලුත් මාවත බෝක්කුව, මෝදර සතරැස් අපවාන, මෝදර උමං මාර්ගය, මනු බිල ඉදිකිරීම සම්පූර්ණ කිරීම, මෝදර මෝය අසල ඇළ ඉවුරු වැඩිදියුණු කිරීම සහ ප්‍රධාන ඇළ මාර්ගයේ ඇළ ඉවුරු ආරක්ෂණ කාර්යයන්

කොන්ත්‍රාත් අංකය : MCUDP S/LLRDC/W/02
කොන්ත්‍රාත්කරු : එඩ්වර්ඩ් සහ ක්‍රිස්ටින්
කොන්ත්‍රාත් වටිනාකම: රු. 342,438,294.31 (වැට් බදු හැර)
ආරම්භ කළ දිනය : 27.11.2012
සම්පූර්ණ කළ දිනය : 31.10.2014



III. ශාන්ත සෙබස්තියන් දකුණු ඇළ මාර්ගයේ ඇළ ඉවුරු ආරක්ෂණ කාර්යයන්

කොළඹ අපවහන ද්‍රෝණියේ උතුරෙන් පිහිටි ශාන්ත සෙබස්තියන් දකුණු ඇළ ඔස්සේ වර්ග කි.මී. 2.4 ක අතිශයින් නාගරීකරණය වූ පෝෂක ප්‍රදේශයක වැසි ජලය බැස යෑම සිදු වේ. මරදාන කාර්මික විද්‍යාලය ආසන්නයේ දකුණු දියගුළු ගේට්ටුවෙන් ආරම්භ වන ශාන්ත සෙබස්තියන් දකුණු ඇළ මාර්ගය ගොඩනැගිලිවලින් ගහන ප්‍රදේශයක් ඔස්සේ මාලිගා වත්ත ප්‍රදේශයේදී ශ්‍රී සංඝරාජ මාවත සහ ඉන් පසුව ග්‍රෑන්ඩ්පාස්හි වෛද්‍ය බ්‍රිටෝ බාබපුල්ලේ පෙදෙස හරහා වයඹ දිශාවට ගලා බසී. ඉන් පසුව ශාන්ත සෙබස්තියන් උතුරු ඇළ මාර්ගය ආරම්භ වන දෙමටගොඩ ඇළ මාර්ග දෙමෝයෙන් අවසන් වේ.

<u>ව්‍යාපෘති අරමුණු</u>

- අවහිරතා ඉවත් කිරීම සඳහා හඳුනාගත් කොටස්වලදී ඇළ මාර්ගය පුළුල් කිරීම.
- ඇළ ඉවුරු ස්ථිරව නියම කිරීම සහ එමඟින්;
- ඇළ මාර්ගය නවීකරණය කිරීම සහ ගලා බැසීමේ ධාරිතාවය වැඩි කිරීම.
- ඇළ ඉවුරු බාදනය වැළැක්වීම
- 1.0 ප ඊබ දක්වා ඇළ මාර්ග පත්ල පිහිටුවීම (සැලසුම් කළ පරිදි)

කොන්ත්‍රාත් අංකය : MCUDP /SLLRDC/W/03A
කොන්ත්‍රාත්කරු : ඇක්සස් ඉංජිනියරින් පීඑල්සී
කොන්ත්‍රාත් වටිනාකම: රු. 194,965,674.59 (වැට් බදු හැර)
ආරම්භ කළ දිනය : 27.10.2014
සම්පූර්ණ කළ දිනය : 20.06.2016



IV. තලංගම වැව හැරීමේ කාර්යයන්

අක්කර 20ක විශාලත්වයකින් යුත් මධ්‍යම ප්‍රමාණයේ ජලාශයක් වන තලංගම ජලාශය මාදිවෙල නැගෙනහිර හැරවුම් ජලධාරයෙහි ඉහළ කොටසෙහි පිහිටා ඇති අතර වර්තමානයේදී වාරි කටයුතු සඳහා මෙන්ම ගංවතුර අවම කිරීම සඳහා ද්විකාර්ය ජලාශයක් ලෙස ක්‍රියාකාරී වේ. මුලින් මෙම ජලාශය වාරි කටයුතු සඳහා පමණක් භාවිතා කරන ලද අතර 90 දශකයේ අග භාගයේදී "මහ කොළඹ ගංවතුර අවම කිරීමේ ව්‍යාපෘතිය - අදියර I" යටතේ ගංවතුර අවම කිරීම සඳහා නවීකරණය කරන ලදී.

තලංගම ජලාශය, පාර්ලිමේන්තු ජලාශය දෙසට මෙන්ම කැළණි ගඟ දිශාවට ජලය වාන් දැමීමට හැකි වන අයුරින්

වෙනස් උස මට්ටම්වල පිහිටි වාන් දොරටු දෙකකින් සමන්විත වේ. ගංවතුර අවම කිරීම සඳහා තලංගම ජලාශය වාන් දැමිය යුත්තේ කැළණි ගඟ දිශාවට වුවද දැඩි ගංවතුර තත්ත්වකදී ජලාශය වාන් දමන්නේ පාර්ලිමේන්තු ජලාශය දෙසට වේ. දැඩි ගංවතුර තත්ත්වයන් යටතේ පාර්ලිමේන්තු ජලාශය දෙසට මෙම ජලාශය වාන් දැමීම වැළැක්වීම සහතික කිරීම සඳහා වැඩිදුර වෙනස්කම් සැලසුම් කිරීම මේ වන විට සිදු කරමින් පවතී. ඊට අමතරව, වැඩි ජෛව විවිධත්වයක් සහිත ප්‍රදේශයක තලංගම ජලාශය පිහිටා ඇති අතර එබැවින් මෙම ප්‍රදේශය මධ්‍යම පරිසර අධිකාරිය යටතේ විශේෂ ආරක්ෂිත කලාපයක් ලෙස නම් කර ඇත. එබැවින්, මෙම ප්‍රදේශයේ කවර හෝ සංවර්ධන කාර්යයක් මධ්‍යම පරිසර අධිකාරියේ නියාමනයන් අනුව සිදු කළ යුතුය.

අරමුණ

වාරි ඉල්ලුම සපුරාලීම පිණිස ජලාශයේ ධාරිතාවය අක්කර අඩි 32 සිට අක්කර අඩි 50 දක්වා ඉහළ නැංවීම. මෙම ව්‍යාපෘතිය බල ගිණුම යටතේ සිදු කර ඇති අතර ව්‍යාපෘති පිරිවැය රු.117,477,606.00කි.



V. ගාලු පාර පාලම අසලදී වැල්ලවත්ත ඇළ මාර්ගයේ ජලය ගලා බැසීම වැඩිදියුණු කිරීම

වැල්ලවත්ත ඇළ මාර්ගය කොළඹ ඇළ මාර්ග පද්ධතියේ ප්‍රධාන ඇළ මාර්ගයක් වන අතර මුහුදට සම්බන්ධ වන එක් මෝයකින් සමන්විත වේ. ගාලු පාර පාලම අසල සිට මැරයින් ඩ්‍රයිව් පාලම දක්වා වූ කොටස (මීටර් 400ක දිගින් යුත්) මහ කොළඹ ගංවතුර පාලන සහ පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති අදියර I යටතේ පුනරුත්ථාපනය කර නොමැති අතර මෙම ඇළ මාර්ග කොටසෙහි ඉවුරු දෙකම පසුගිය දශක දෙකක කාලය තුළ සංවර්ධනයට ලක් වී ඇත. ගාලු පාර පාලම අසල ඇළ මාර්ගයේ පටුම හරස්කඩ දක්නට ලැබෙන අතර එය ඇළ මාර්ගයේ ජලය ගලා බැසීමේ ධාරිතාවයට බාධා ඇති කරනු ලැබේ. මෙයට අමතරව මුහුදෙහි වඩ දිය බා දිය ඇති වීමද ඇළෙහි ජලය ගලා බැසීමේ ධාරිතාවය පාලනය කරනු ලැබේ.

කොන්ත්‍රාත් අංකය : MCUDP/SLLRDC/W/07A
කොන්ත්‍රාත්කරු : එඩ්වර්ඩ් සහ ක්‍රිස්ටි
මුල් කොන්ත්‍රාත් වටිනාකම: රු.111,570,072.22 (වැට් බදු හැර)
ආරම්භ කළ දිනය : 21.07.2016
ව්‍යාපෘති කාල සීමාව : මාස 07
මුල් සම්පූර්ණ කරන දිනය : 22.02.2017
ලබා දුන් කාලය දීර්ඝ කිරීම: 27.11.2017
ප්‍රතිශෝධිත කොන්ත්‍රාත් වටිනාකම : රු.128,801,722.70



VI. මාදිවෙල නැගෙනහිර හැරවුම සඳහා වැඩිදියුණු කිරීම් ආරම්භ කිරීම, අදියර II.

කොන්ත්‍රාත් අංකය : MCUDP/SLLRDC/W/11
කොන්ත්‍රාත්කරු : ගාමිණී කන්ස්ට්‍රක්ෂන්
කොන්ත්‍රාත් වටිනාකම : රු.106,798,220.87
(වැට් බදු හැර)
ආරම්භ කළ දිනය : 16.12.2016
ව්‍යාපෘති කාලසීමාව : මාස 12
මුල් සම්පූර්ණ කිරීමේ දිනය : 16.12.2017
ලබා දුන් කාලය දීර්ඝ කිරීම: 04.12.2018







සිදු කෙරෙමින් පවතින ව්‍යාපෘති

VII.මාදිවෙල නැගෙනහිර හැරවුම් ඇළ මාර්ගය සඳහා වැඩිදියුණු කිරීම් - අදියර I

කොන්ත්‍රාත් අංකය : MCUDP/SLLRDC/W/05
කොන්ත්‍රාත්කරු : රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව
කොන්ත්‍රාත් වටිනාකම : රු. 228,665,371.06 (වැට් බදු හැර)
ආරම්භ කළ දිනය : 10.10.2016
ව්‍යාපෘති කාලසීමාව : මාස 12
මුල් සම්පූර්ණ කරන දිනය : 10.10.2017
ලබා දුන් කාලය දීර්ඝ කිරීම : 03.11.2017
ප්‍රතිශෝධිත කොන්ත්‍රාත් වටිනාකම : රු.167,873,795.03
භෞතික ප්‍රගතිය : රු.158,976,069.14 (94.7%)
මූල්‍ය ප්‍රගතිය : රු. 30,090,019.13 (77.5%)

ව්‍යාපෘති ප්‍රදේශය



කාර්යයන් සිදු කරමින්



VIII. මාදිවෙල නැගෙනහිර හැරවුම් ඇළ මාර්ගය සඳහා වැඩිදියුණු කිරීම් - අදියර III ආරම්භ කිරීම

කොන්ත්‍රාත් අංකය : MCUDP/SLLRDC/W/19
කොන්ත්‍රාත්කරු : එඩ්වර්ඩ් ඇන්ඩ් ක්‍රිස්ටීන්, කොමුති JV
කොන්ත්‍රාත් වටිනාකම : රු.344,577,482.70(වැට් බදු හැර)
ව්‍යාපෘති කාලසීමාව : මාස 12
මුල් සම්පූර්ණ කරන දිනය : 11.01.2017
ලබා දුන් කාලය දීර්ඝ කිරීම : 22.12.2018
ප්‍රතිශෝධිත කොන්ත්‍රාත් වටිනාකම: රු. 348,830,598.07
භෞතික ප්‍රගතිය : රු.166,906,007.56 (47.85%)
මූල්‍ය ප්‍රගතිය : රු.151,466,914.89 (43.42%)

ව්‍යාපෘති ප්‍රදේශය



කාර්යයන් සිදු කරමින්



IX. ශාන්ත සෙබස්තියන් උතුරු ඇළ මාර්ගය

කොළඹ අපවහන ද්‍රෝණියේ උතුරු ප්‍රදේශයේ පිහිටි ශාන්ත සෙබස්තියන් උතුරු ඇළ මාර්ගය ඔස්සේ අධික වශයෙන් නාගරීකරණය වූ වර්ග කි.මී. 1.5ක ජලාධාර ප්‍රදේශයක වැසි ජලය ගලා බැසීම සිදු වේ. දෙමටගොඩ ඇළ මාර්ගය සහ ශාන්ත සෙබස්තියන් දකුණු ඇළ මාර්ග දෙබෙදුමෙන් ආරම්භ වන එය අධික ගොඩනැගිලි පවතින ප්‍රදේශ හරහා වයඹ දිශාවෙන් කැළණි ගඟ දක්වා ගලා බසී. උතුරු කොළඹ ඇළ මාර්ග පද්ධතියේ වැසි ජලය ගලා බසින ප්‍රධාන පිටවාන එය වන අතර කි.මී.1.9ක් දිගින් සහ මීටර් 15ක සාමාන්‍ය පළලින් යුක්ත

වේ. ඉඟුරු කඩේ පාලම අසල සිට කැළණි ගඟේ මෝය දක්වා ශාන්ත සෙබස්තියන් උතුරු ඇළ මාර්ගයේ ඇළ ඉවුරු ආරක්ෂා කර නොමැත. එබැවින් පොම්ප කිරීමේ පිරිවිතර හා ගැලපෙන පරිදි ජලය ගලා බැසීමේ වේගය ඉහළ නැංවීම සඳහා ඇළ මාර්ගය නවීකරණය කිරීම, ඇළ මාර්ගයෙහි පවත්වාගත හැකි උපරිම පළල පවත්වා ගැනීම සහ ඇළ ඉවුරු ආරක්ෂා කිරීම සිදු කළ යුතුය.

අරමුණු:

ඇළ ඉවුරු මායිම් විධිමත්ව නියම කිරීම සහ එමඟින්;

- ඇළ මාර්ගය නවීකරණය කිරීම සහ ගලා බැසීමේ ධාරිතාවය ඉහළ නැංවීම
- ඇළ ඉවුරු බාදනය වැළැක්වීම
- ඇළ ඉවුරු බලහත්කාරයෙන් අත්පත් කර ගැනීම වැළැක්වීම සහ ඇළ මාර්ග නඩත්තු කිරීමට පහසුකම් සැපයීම

කොන්ත්‍රාත් අංකය : MCUDP/SLLRDC/W/09
කොන්ත්‍රාත්කරු : ආර්ආර් කන්ස්ට්‍රක්ෂන්ස් (පෞද්.) සමාගම
කොන්ත්‍රාත් වටිනාකම : රු. 322,500,102.88 (වැට් බදු හැර)
ව්‍යාපෘති කාලසීමාව : මාස 15
මුල් සම්පූර්ණ කරන දිනය : 27.08.2018
ලබා දුන් කාලය දීර්ඝ කිරීම : 22.02.2019
භෞතික ප්‍රගතිය : රු. 260,003,191.11 (91.45%)
මූල්‍ය ප්‍රගතිය : රු.234,662,647.72 (82.54%)

කාර්යයන් සිදු කරමින්



X. උතුරු දියගුළු පොම්පාගාරය

ශාන්ත සෙබස්තියන් ඇළ මාර්ගයේ උතුරු දියගුල් ගේට්ටුව කොළඹ ඇළ මාර්ග පද්ධතියේ එක් ප්‍රධානතම පිටවානකි. කෙසේවෙතත්, මීටර් 17-20ක් පමණ පළල ශාන්ත සෙබස්තියන් උතුරු ඇළ මාර්ගය ගලා බැසීම සඳහා මෙම ස්ථානයේ පවතින විවරයේ පළල මීටර් 5ක් පමණ වේ. කැළණි ගඟේ ගංවතුර පිටාර ගැලීමෙන් කොළඹ නගරය ගංවතුරෙන් යටවීමෙන් ආරක්ෂා කර ගැනීම සඳහා ගංවතුර ගේට්ටු වසා තබන ස්ථානය මෙය වන බැවින් උතුරු දියඟුල පිහිටා ඇති ස්ථානය කොළඹ ඇළ මාර්ග පද්ධතියේ ඉතා තීරණාත්මක ස්ථානයකි. පවතින උතුරු දියඟුල ප්‍රමාණවත් නොවන බැවින් උතුරු දියඟුල ගුරුත්ව ගැලීම ඉහළ නැංවීම සඳහා ඒකාබද්ධ පළල මීටර් 15ක් වූ නව සිරස් ගේට්ටුවක් (මෝටරයක් සවි කරන ලද) සවි කරනු ඇත. ගංගා පිටවානක් වන බැවින්, කැළණි ගඟෙහි ජල මට්ටම ඉහළ ගිය අවස්ථාවල උතුර දියඟුලට ක්‍රියාකාරී විය නොහැක. කොළඹ ගංවතුර ඇතිවීම සහ කැළණි ගඟේ ජල මට්ටම ඉහළ යෑම වඩාත් සුලබ වෙමින් පවතින බැවින්, කැළණි ගඟෙහි ජල මට්ටම ඉහළ ගොස් ඇති අවස්ථාවලද උතුරු දියඟුලෙහි පැවතීම සහතික කර ගැනීම අවශ්‍ය වේ. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා නව ගුරුත්ව ගේට්ටුවට යාබදව ඝන මීටර 30ක ධාරිතාවයකින් යුත් පොම්පාගාරයක් ඉදි කරනු ඇත.

අරමුණු

කැළණි ගඟෙහි ජල මට්ටම ඉහළ ගොස් ඇති අවස්ථාවලදී වැසි ජලය ශාන්ත සෙබස්තියන් උතුරු ඇළ මාර්ගය හරහා ගලා යෑමට සැලැස්වීමේ හැකියාව සාක්ෂාත් කර ගැනීම. වර්තමානයේදී මෙය සිදු කිරීමේ හැකියාවක් නොමැත.

කොන්ත්‍රාත් අංකය : MCUDP/SLLRDC/W/12
කොන්ත්‍රාත්කරු : චයිනා - ජියෝ ඉන්ජිනියරින් කෝපරේෂන් (ශ්‍රී ලංකාව)
කොන්ත්‍රාත් වටිනාකම : ඇ.ඩොලර් 9,766,653.08 + ශ්‍රීලරු 473,212,403.68 (වැට් බදු හැර)
ව්‍යාපෘති කාලසීමාව : මාස 24
සම්පූර්ණ කරන දිනය : 31.05.2019
භෞතික ප්‍රගතිය : 40%
මූල්‍ය ප්‍රගතිය : ඇ.ඩොලර් මිලියන 2.386 + ශ්‍රීලරු මිලියන 222.545 (30%)





XI. නව මෝදර සහ ටොරින්ටන් උමඟ

මුහුදට ජලය ගලා යන නව පිටවාන හඳුන්වාදීම මඟින් ගංවතුර අවම කිරීම සඳහා මෝදර ප්‍රදේශයේ සහ ටොරින්ටන් ප්‍රදේශයේ භූගත උමං මාර්ග දෙකක් ඉදිකිරීමට යෝජනා කර ඇත.

නව මුට්වාල් උමඟ විෂ්කම්භය මීටර් 3 ක් සහ දිග මීටර් 700 ක් වන අතර එය ප්‍රධාන කාණුවෙන් ආරම්භ වී මෝදර ප්‍රදේශයෙන් ජලය මුහුදට මුදා හරිනු ලැබේ. උමඟ හරහා ධාරිතාව 15 ප3/ වේ.

තුම්මුල්ල සහ අවට ප්‍රදේශවලින් ජලය එක්රැස් කරන ටොරින්ටන් උමං මාර්ගය බම්බලපිටියෙන් මුහුදට ජලය මුදා හරිනු ලැබේ. ප්‍රධාන උමඟෙහි විෂ්කම්භය මීටර් 3 ක් වන අතර පෘෂ්ටීය සහ පාර්ශ්වීය උමං මාර්ග (විෂ්කම්භය මීටර් 1.2 - මීටර් 2) පද්ධතියක් පවතින අතර එය අවට ප්‍රදේශයෙන් ජලය එක්රැස් කර ප්‍රධාන උමඟට එක් කරයි.

මෙම උප ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථයට ඇතුළත් වන්නේ,

- ඇතුල්වන කානුව ඉදිකිරීම
- ලැබීමේ පතුවළ ඉදිකිරීම
- පිටවන කානුව ඉදිකිරීම
- උමං හැරීම
- මනුවල ඉදිකිරීම

කොන්ත්‍රාත් අංකය : MCUDP/SLLRDC/W/14
කොන්ත්‍රාත්කරු : චයිනා පෙට්‍රෝලියම් පයිප්ලයින් ඉන්ජිනියරින් කොම්පැනි ලිමිටඩ්
කොන්ත්‍රාත් වටිනාකම : රු.මිලියන 150ක අවස්ථානුරූප වෙන්කිරීමක් සහ ඇ.ඩොලර් මිලියන 32.098 + ශ්‍රීලරු මිලියන 246.061 (වැට් බදු හැර)
ව්‍යාපෘති කාලසීමාව : මාස 24
සම්පූර්ණ කරන දිනය : 31.05.2020
භෞතික ප්‍රගතිය : 18%



මූල්‍ය ප්‍රගතිය: ඇ.ඩොලර් මිලියන 5.247 + ශ්‍රීලරු මිලියන 14.196 (16%)



XII. ශාන්ත සෙබස්තියන් දකුණු පොම්පාගාරය

ශාන්ත සෙබස්තියන් ඇළ මාර්ගයේ (උතුර සහ දකුණ) අපවහන ප්‍රදේශය ආසන්න වශයෙන් වර්ග කිලෝමීටර් 20ක් වන අතර උන්නතාංශය -2.0 සිට +6.0 mMSL අතර වෙනස්වෙමින් එම ප්‍රදේශය බොහෝවිට පහත් බිමකි. ඇළ මාර්ගයේ ජල මට්ටමට වඩා කැළණි ගඟේ ජල මට්ටම අඩු අවස්ථාවලදී ගොඩබිමෙහි සිට ජලය අපවහනය වීම සඳහා වර්තමානයේදී ගුරුත්ව පිටවාන පවතී.

කැළණි ගඟෙහි ජල මට්ටම ඉහළ ගිය විට, ගඟෙ හි ජලය ගොඩබිමට පැමිණීම වැළැක්වීම සඳහා පිටවාන දොරටු වසා තබනු ලැබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ගුරුත්ව අපවහනය සිදු විය නොහැකි බැවින් ගොඩබිම සිට ගලා යන ජලයට කැළණි ගඟට ගලා යාමට නොහැකි වේ. එබැවින්, කොළඹ ජල ද්‍රෝණියෙහි අධික වර්ෂාපතනයක් පවතින අවස්ථාවල සහ කැළණි ගඟෙ හි ඉහළ ජල මට්ටමක් පවතින අවස්ථාවල එම ජලය පොම්ප කර ඉවත් කිරීම පිණිස, ශාන්ත සෙබස්තියන් උතුරු ඇළ මාර්ගයේ පවතින උතුරු දියඟුල දොරටුව අසල සහ ශාන්ත සෙබස්තියන් දකුණු ඇළ මාර්ගයේ මරදාන පාලම අසල පොම්පාගාර දෙකක් ඉදිකිරීමට යෝජනා කර ඇත.

ශාන්ත සෙබස්තියන් දකුණු අගුළු පොම්පාගාරය සඳහා යෝජිත ස්ථානය ශ්‍රී ලංකා වරාය අධිකාරිය පරිශ්‍රය තුළ

ශාන්ත සෙබස්තියන් දකුණු ඇළ මාර්ගයෙහි ඕල්කට් මාවත පාලම සහ මරදාන පාලන අතර පිහිටා ඇති අගුළු දොරටුවලට ඉහළින් පිහිටා ඇත. පැකේජයෙහි අන්තර්ගත කර ඇති ඇළ මාර්ග කොටස මරදාන පාර පාලම සිට ඕල්කට් මාවත පාලම දක්වා ඉහළට මීටර් 80ක් පමණ දිවෙන අතර, මෙම කොටසෙහි දිග ආසන්න වශයෙන් මීටර් 240කි.

XIII. අඹතලේ පොම්පාගාරය සැලසුම් කිරීම ඉදිකිරීම

කොන්ත්‍රාත් අංකය : MCUDP/SLLRDC/W/24
කොන්ත්‍රාත්කරු : සැල්කන් ඉංජිනියරින් බර්හැඩ්
කොන්ත්‍රාත් වටිනාකම : ඇ.ඩොලර් මිලියන 5.85
+ශ්‍රීලරු මිලියන 1,181.53
ආරම්භ කළ දිනය : 03.09.2018
සම්පූර්ණ කරන දිනය : 02.06.2020

කැළණි ගඟේ ඉහළ ජල මට්ටමක් සහ කොළඹ ද්‍රෝණියේ අධික වර්ෂාපතනයක් ඇති කාලවලදී ගංවතුර ජලය කැලණි ගඟට පොම්ප කිරීමෙන් ගංවතුර අවම කිරීම සඳහා මාදිවෙල නැගෙනහිර හැරවුම් ඇළ මාර්ගය හරහා අඹතලේ ගංවතුර බැම්මෙහි වැසි ජල පොම්පාගාරයක් ඉදිකිරීමට යෝජනා කර ඇත.

මෙම පොම්පාගාරයේ ධාරිතාව 20 m^3/s ක් වන අතර එය $4m^3/s$ ක පොම්ප ගණන 5 කින් සමන්විත වේ.

XIV. කොලොන්නාව ඇළ මාර්ග හැරවුම අදියර II

යෝජිත කොලොන්නාව ඇළ මාර්ගය හැරවීමේ යෝජනා ක්‍රමය යටතේ, කොලොන්නාව ජල පෝෂක ප්‍රදේශය හරහා දිවෙන කිත්තම්පහුව ඇළ වැඩිදියුණු කිරීමටත්, දොරටු ව්‍යුහයක් සමඟින් කොළඹ ජල පෝෂක ප්‍රදේශයට සම්බන්ධ කිරීමටත් යෝජනා කෙරේ.

මෙම යෝජනා ක්‍රමයේ අදියර II (ගොතටුව බැම්මේ සිට ලෝලෙවල් මාර්ගයේ වැල්ලම්පිටිය පාලම දක්වා ඇළ මාර්ග කොටස) බොහෝ දුරට වගුරු බිම් හරහා වැටී තිබේ. මෙහෙයුම් හා නඩත්තු (O&M) මාර්ගය සහ දකුණු ඉවුරේ පැති කාණු සහිතව පස් සහ ගේබියන් බැම්මි යොදා ඇළ මාර්ගය වැඩි දියුණු කිරීමට යෝජනා කෙරේ. මීටර් 1230 ක මෙම ඇළ කොටසෙහි පත්ල මීටර් 20 ක (අවම) පළලින් යුක්ත වන අතර බෑවුම් සහිත ත්‍රපීසියම් ආකාර පස්වලින් සැදුම්ලත් කොටස් මෙන්ම දෙපස ගැබියන් බැමි ආරක්ෂාව සහිත සෘජුකෝණාස්‍රාකාර කොටස්වලින්ද යුක්ත වේ. අදියර II හි මුළු ඇළ මාර්ග කොටස සඳහා, පත්ල මට්ටම -1.0ප වීඛ වේ. එසේම, ජල පෝෂක ප්‍රදේශයෙන් ඇළ මාර්ගයට ජලය බැසයාම සඳහා තෝරාගත් ස්ථානවල O & M මාර්ගය පාර හරහා කුඹහ බෝක්කු ඉදිකිරීමට යෝජනා කර ඇත.

කොන්ත්‍රාත් අංකය : MCUDP/SLLRDC/W/16-B
කොන්ත්‍රාත්කරු : එඩ්වර්ඩ් ඇන්ඩ් ක්‍රිස්ටීන්
කොන්ත්‍රාත් වටිනාකම : රු. 227,181,435.00
ව්‍යාපෘති කාලසීමාව : මාස 15
සම්පූර්ණ කරන දිනය : 27.03.2019
ප්‍රදානය කළ කාලය දීර්ඝ කිරීම : 26.04.2019
භෞතික ප්‍රගතිය : රු. 83,661,988.01 (36.83%)
මූල්‍ය ප්‍රගතිය : පෙර ගෙවීමක් සමඟ
රු. 128,635,805.67 (56.62%)



XV. කොලොන්නාව ඇළ මාර්ග හැරවුම අදියර III

මීටර 2,260 ක දිගකින් යුත් මෙම කොටස නාගරීකරණය වූ ප්‍රදේශයක් හරහා දිව යයි. කිත්තම්පහුව ඇළ මාර්ගයේ මෙම කොටස ඉතා තියුණු වංගු සහිත කොටස් කිහිපයක් ඔස්සේ ගලා බසින අතර, සමහර කොටස්වල ඇළ මාර්ග ඉතා පටු වී ඇත. මෙම කොටසේ ඇති බාධක ඉවත් කිරීම සඳහා MCUDP යටතේ සමහර නැවත පදිංචි කිරීම් සහ ඉඩම් අත්පත් කර ගැනීම සිදු කරන ලදී.

අවම වශයෙන් මීටර් 20 ක පත්ල පළලක් සහිත දෙපස ගේබියන් බිත්ති සහිත ඇළ මාර්ගයක් යෝජනා කෙරේ. ඇළේ පත්ල මට්ටම -1.5**m MSL** වේ. මෙම කොටසේ පදික මාරු (පාලම්) හතරක් ඇති අතර, ඒවා ගලායාමට බාධා ඇති කළද, පැති බැම්මේ විධිමත් ගලායෑමේ මඟ පෙන්වීමක් සමඟ මෙම පාලම් එසේම තබා ගනු ඇත.

කිත්තම්පහුව ඇළ මාර්ගයේ මෙම කොටසේ දකුණු ඉවුරේ ද්විතියික ඇළ මාර්ග සම්බන්ධතා දෙකක් ඇති අතර වම් ඉවුරේ එවැනි එක් සම්බන්ධතාවයක් ඇත. ජල පෝෂක ප්‍රදේශයෙන් ඇළ මාර්ගයට වැසි ජලය බැස යෑම සඳහා බිංදු ව්‍යුහයන් හරහා මෙම ඇළ මාර්ග ප්‍රධාන ඇළ මාර්ගයට සම්බන්ධ කිරීමට සහ කුඩා කාණු සඳහා කුඹහ පදික මාරු කිහිපයක් යෝජනා කෙරේ.

කොන්ත්‍රාත් අංකය : MCUDP/SLLRDC/W/16-C
කොන්ත්‍රාත්කරු : එඩ්වර්ඩ් ඇන්ඩ් ක්‍රිස්ටීන් RR JV
කොන්ත්‍රාත් වටිනාකම : රු. 1,004,412,480.78 (වැට් බදු හැර)
ව්‍යාපෘති කාලසීමාව : මාස 15

ආරම්භ කළ දිනය : 23.10.2018
සම්පූර්ණ කරන දිනය : 24.01.2020
භෞතික ප්‍රගතිය : රු.මිලියන 23,415,982.00 (2.6%)
මූල්‍ය ප්‍රගතිය : පෙර ගෙවීමක් සමඟ රු. 202,973,795.93 (22.23%)





XVI. තත්‍යකාල ඒකාබද්ධ ගංවතුර කළමනාකරණ පද්ධතියක් (RTC) සැපයීම සහ ස්ථාපිත කිරීම

ඇතිවිය හැකි ගංවතුර තත්ත්වයන් කලින් දැන ගැනීම පිණිස සහ සිදුවිය හැකි ගංවතුර හානි අඩු කිරීම පිණිස පවතින පාලන ව්‍යුහ (ගේට්ටු/පොම්පාගාර) කළමනාකරණය කිරීම සහ ජලපෝෂක ප්‍රදේශයෙහි කාලගුණික තත්ත්වයන් සහ පද්ධතියේ පවතින ගංගා/ඇළ මාර්ගවල ගලා බැසීමේ තත්ත්වයන් අධීක්ෂණය කිරීම තත්‍යකාල පාලන පද්ධතියෙහි අරමුණ වේ. කොළඹ ප්‍රදේශය සඳහා RTC වන පද්ධතියක තිබිය හැකි සංරචක වන්නේ,

- පවතින කාලගුණික පුරෝකථන පද්ධති (උදා. වර්ෂාපතන රේඩාර්, දේශීය හෝ අන්තර්ජාතික) භාවිතා කරමින් වර්ෂාපතන දත්ත එක්රැස් කිරීමේ පද්ධතිය;
- ඇති කළ හැකි අමතර වර්ෂාපතන අධීක්ෂණ ස්ථාන;
- ඇළ මාර්ග/ගංගා/පොකුණුවල ජල මට්ටම් අධීක්ෂණය කිරීමේ මිනුම් උපකරණ;
- ගංගා/ඇළ මාර්ගවල ජලය ගලා බැසීමේ මාපක;
- සන්නිවේදන සම්බන්ධතා;
- ජලය ගලා බැසීම පුරෝකථනය කිරීමේ පද්ධතිය (පවතින වර්ෂාපතනය-ගලායෑමේ ආකෘති);
- ගේට්ටු සහ පොම්පවල මනා ක්‍රියාකාරීත්වය ගණනය කිරීම සඳහා සියලු ආදාන භාවිතා කරමින් තීරණ ගැනීමට සහාය දක්වන පද්ධතියක්;
- විවිධ සංඝටකවල ක්‍රියාකාරීත්වය ඒකාබද්ධ කිරීම සඳහා සහ මෙහෙයුම් කළමනාකරණය මෙහෙයවීම සඳහා මෘදුකාංග සහ දෘඩාංග ඇතුළුව (SCADA වැනි) ප්‍රධාන පාලන ස්ථානයක්/පද්ධතියක්.

ඇස්තමේන්තු ව්‍යාපෘති පිරිවැය : ශ්‍රීලරු මිලියන 200



භාර දීමේ අදියරට ආසන්නව පවතින ව්‍යාපෘති

XVII. කොලොන්නාව ඇළ මාර්ග හැරවුම අදියර I

කොන්ත්‍රාත් අංකය : MCUDP/SLLRDC/W/16A
ඉංජිනේරු ඇස්තමේන්තුව : ශ්‍රීලරු මිලියන 630
අපේක්ෂිත ආරම්භක දිනය: ජනවාරි 2019
අපේක්ෂිත සම්පූර්ණ කරන දිනය: 2020 මාර්තු

මෙම යෝජනා ක්‍රමයේ පළමු අදියර ගොතටුව ගංවතුර බැම්මට සමාන්තර ඇළ මාර්ග කොටස වන අතර එහි දිග මීටර් 270 කි. දැනට පවතින ඇළ මාර්ගය පත්ල පළල මීටර් 10 ක් සහ පත්ල මට්ටම මීටර් -1.0 MSL දක්වා වැඩි කිරීමට යෝජනා කෙරේ. යෝජිත වම් ඉවුර (ගොතටුව බැම්ම පැත්ත) 1: 1.5 පැති බෑවුමක් සහිතව පස් කොටසකින්ද මීටර් 2.0 MSL දක්වා වූ ඉහළ මට්ටමකින්ද සමන්විත වනු ඇත. දකුණු ඉවුරේ + 2.0m MSL ඉහළ මට්ටමක් සහිත ගේබියන් තාප්පයක් ඉදිකිරීමට යෝජනා කෙරේ. මීට අමතරව, දකුණු ඉවුරේ ගේබියන් තාප්පයට යාබදව පැති කාණු සහිත මීටර් 4.5 ක පළල මෙහෙයුම් සහ නඩත්තු (O&M) මාර්ගයක් + 2.0 MSL මට්ටමින් ඉදිකිරීමට යෝජනා කර ඇත. මෙම මාර්ගය කොලොන්නාව-ගොතටුව පාර සහ ලෝලෙවල් මාර්ගය සම්බන්ධ කරන දැනට පවතින අතුරු මාර්ග යෙන් ආරම්භ වනු ඇත.

මීටර 15 පළල මීටර -1.0 MSL පත්ල මට්ටමක් සහිත සම්බන්ධතා සතරැස් කාණුවක් ගොතටුව බැම්ම හරහා සහ දැනට පවතින කොලොන්නාව-ගොතටුව ප්‍රධාන මාර්ගයට යටින් ඉදිකිරීමට යෝජනා කෙරේ. කිත්තම්පහුව ඇළ මාර්ගය පැත්තේ එකක් මීටර් 5.0 x 3.5ක් වූ සිරස්

ගේට්ටු තුනක් ස්ථාපිත කිරීම යෝජනා කෙරේ. සාමාන්‍ය තත්ත්ව යටතේ, ගංවතුර දොරටු වසා තබනු ඇත, එම හේතුවෙන් ජල පෝෂක ප්‍රදේශ වෙන් කර තැබෙනු ඇති අතර ද්‍රෝණි අතර ගලනයට අවස්ථාවක් නොලැබෙනු ඇත. ගංවතුර තත්ත්වයන් යටතේ, ගේට්ටු විවෘත කරනු ලබන අතර, ගංවතුර තත්ත්වයන් මත පදනම්ව අතිරික්ත ගංවතුර ජලය එක් පැත්තකින් අනෙක් පැත්තට ගලා යාමට ඉඩ සැලසේ. කොළඹ ගංවතුර අවම කිරීම සඳහා මෙම ගංවතුර ගේට්ටු ඉදිරියේදී ස්ථාපිත කිරීමට නියමිත තත්‍ය කාල පාලන (RTC) පද්ධතියේ කොටසක් ලෙස ක්‍රියාත්මක කිරීමට විධිවිධාන සැලසීමටද යෝජනා කෙරේ.

XVIII. කොලොන්නාව ඇළ මාර්ග හැරවුම අදියර IV

කොන්ත්‍රාත් අංකය : MCUDP/SLLRDC/W/16D
ඉංජිනේරුවරයාගේ ඇස්තමේන්තුව : ශ්‍රීලරු මිලියන 1150
අපේක්ෂිත ආරම්භක දිනය : 2019 ජනවාරි
අපේක්ෂිත සම්පූර්ණ කරන දිනය : 2020 ජූනි

මෙම යෝජනා ක්‍රමයේ IV වන අදියර දුම්රිය මාර්ගයට සමාන්තරව හා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ (ඝණ) ඔරුගොඩවත්ත ගබඩා පරිශ්‍රයට ආසන්නයේ ඇති ඇළ මාර්ගය වේ. මෙම කොටසෙහි දිග මීටර් 1,080 ක් වන අතර සේදවත්ත-අඹතලේ මාර්ගයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගේට්ටු ව්‍යුහය තරණය කරමින් කලු පාලම අසලදී කැළණි ගඟට සම්බන්ධ වේ.

මෙම කොටසේ දැනට පවතින කිත්තම්පහුව ඇළ මාර්ගය මීටර -2.0 MSLl අඛණ්ඩ පත්ල මට්ටමක් පවත්වා ගනිමින් මීටර් 18 ක පළලකින් යුත් ත්‍රැපීසියම් ආකාරයේ අංශයක් ලෙස වැඩිදියුණු කිරීමට යෝජනා කර ඇත. දකුණු ඉවුර වානේ පෝරු ටැඹ සහ ගේබියන් ඉවුරු ආරක්ෂණ බැම් සමඟින් මෙහෙයුම් සහ නඩත්තු මාර්ගයකින් සමන්විත වනු ඇත.

මේ වනවිට පවතින ගේට්ටු ව්‍යුහ දෙකක් ඇත, එනම්, CPC පරිශ්‍රය අසල CPC ගේට්ටුව සහ කලු පාලම අසල වාරිමාර්ග දෙපාර්තමේන්තු ගේට්ටුව ලෙසය. මෙම ව්‍යුහයන් බාධක ලෙස හඳුනාගෙන ඇති අතර ඒවා වැඩිදියුණු කිරීමට යෝජනා කර ඇත. කලු පාලම අසල සේදවත්ත - අඹතලේ පාරේ දැනට පවතින පාලම ඉවත් කර මීටර් 18 ක පළලකින් යුත් පාලමක් ප්‍රතිස්ථාපනය කිරීමට යෝජනා කෙරේ. කැළණි ගංවතුර ඇළ මාර්ගයට ඇතුළු වීම වැළැක්වීම සඳහා සිරස් ගේට්ටු තුනක් (මීටර 6.0 x මීටර් 4.5) සහිත + 5.0mMSL ක් ආරක්ෂා කරන නව ගේට්ටු ව්‍යුහයක් ඉහත සඳහන් පාලමෙන් පහළින් ඉදි කෙරේ. කිත්තම්පහුව ප්‍රධාන ඇළ ඉවුරු දෙක ඔස්සේ ප්‍රධාන ඇළට සම්බන්ධ වන ද්විතියික ඇළ මාර්ග කිහිපයක් ඇත. කාන්දු ව්‍යුහයන් හරහා ඒවා ප්‍රධාන ඇළට සම්බන්ධ කිරීමට යෝජනා කෙරේ.

XIX. ජලයෙහි තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා දෝර ගේට්ටු සැලසුම් කිරීම සහ ස්ථාපිත කිරීම

ප්‍රධාන වශයෙන් වියළි කාලයේදී උතුරු කොළඹ ප්‍රදේශයේ ඇළ මාර්ග බොහොමයක් දූෂණයට ලක් වෙයි. එබැවින්, වියළි කාලයේදී පිරිසිදු කිරීමේ ක්‍රියාවලියක් අවශ්‍ය වේ. සියලු ගේට්ටු වසා උතුරු දියඟුල ගේට්ටුවෙන් මීටර්+1.2**MSL**ක උසකට කැළණි ගඟෙන් ජලය පොම්ප කිරීමෙන් සෝදා හැරීමක් සිදු කළ යුතුය. ඇළ මාර්ග ජලයෙන් පිරුණු පසු ගේට්ටු විවෘත කිරීමෙන් ජලය මුදා හරිනු ලැබේ



2. මාදිවෙල දකුණ හැරවුම් ව්‍යාපෘතිය

අන්තර්-ද්‍රෝණි හැරවුමක් පාදක කර ගනිමින් මාදිවෙල දකුණ හැරවුම් විකල්පය මීට පෙර තීරණය කර තිබිණි. කෙසේවෙතත්, එම හැරවුමෙහි පහත සඳහන් දෝෂ කිහිපයක් පවතී.

a) පන්නිපිටියේ ද්‍රෝණි මුදුන හරහා හැරවීමේ යෝග්‍ය ඉදිකිරීමේ ක්‍රමවේදයක් පිළිබඳව පවතින දුෂ්කරතාවය සහ ඉහළ ඉදිකිරීම් පිරිවැය
b) වේරළ ගඟ ද්‍රෝණියේ කළු ඇළට ඇති වියහැකි ජලවිද්‍යාත්මක බලපෑම්
c) අහිතකර සමාජීය සහ පාරිසරික ගැටලු

ඉහත බාධාවන් හේතුවෙන්, විකල්පයන් දෙක සඳහා විකල්ප අධ්‍යයනයක් සිදු කර ඒ අනුව තීරකයන් සමඟ සහයෝගිත්වයෙන් සුදුසු විසඳුමක් පිළිබඳව අවසන් තීරණයක් ගැනීම සඳහා සඳහා ගබඩා කිරීමේ පොකුණු පද්ධතියක විකල්ප විසඳුමක් ඉදිරිපත් කර ඇත. එබැවින්, මෙම විකල්ප අධ්‍යයනය සඳහා ජල විද්‍යාත්මක ආදර්ශ අධ්‍යයනයක් පවත්වන ලදී. ප්‍රධාන වශයෙන් ගබඩා කිරීමේ පොකුණු පද්ධතිය ඉලක්ක කර ගනිමින් ගංවතුර ආදර්ශන කාර්යයන් සිදු කරන ලද අතර විකල්පයන් දෙක සඳහා ආර්ථික සසඳා බැලීම සිදු කරන ලදී. මැනුම් කාර්යයන්වලට අමතරව 2018 වර්ෂයේදී මූලික සැලසුම් කිහිපයක්ද සිදු කරන ලදී.

ඉදිකිරීම් අංශය

2018 වර්ෂයේදී ඉදිකිරීම් අංශය යටතේ වූ ව්‍යාපෘති

UDA යටතේ වන ව්‍යාපෘති

01 කෑගල්ල යෝජිත බස් නැවතුම්පොළ සඳහා ඉඩම සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය අදියර II
02 කඳුරුවෙල නගර සංවර්ධන ව්‍යාපෘතියේ ඉඩම් සංවර්ධනය කිරීමේ කාර්යයන් - අදියර I

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ වන ව්‍යාපෘති

03 හොරණ බස් නැවතුම්පොළ ඉදිකිරීම - අදියර III
04 පාදුක්ක ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමේ ඉදිකිරීම් - අදියර II
05 කළුතර දුම්රිය ස්ථානය සහ බස් නැවතුම්පොළ අතර වාණිජ සංවර්ධනය සැලසුම් කිරීම සහ ඉදිකිරීම - අදියර IV
06 කළුතර දුම්රිය ස්ථානය සහ බස් නැවතුම්පොළ අතර වාණිජ සංවර්ධනය - අදියර III
07 බුලත්සිංහල ආර්ථික මධ්‍යස්ථානය සහ පොළ අසල ඇළ මාර්ග සංවර්ධනය කිරීමේ සැලසුම් සහ ඉදිකිරීම්
08 හොරණ පොළ ප්‍රදේශයේ ජල අපවහන කාර්යයන් සැලසුම් කිරීම සහ ඉදිකිරීම
09 කිරිමණ්ඩල මාවතේ තත්‍ය කාල ගංවතුර පාලන සහ ජල කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම
10 හොරණ යෝජිත බස් නැවතුම්පොළ සැලසුම් කිරීම සහ ඉදිකිරීම අදියර I

"පිබිදෙමු පොලොන්නරුව" දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වන ව්‍යාපෘති

11 වැලිකන්ද රෝහල සඳහා යෝජිත විශේෂඥ වෛද්‍ය නිල නිවාස
12 හිඟුරක්ගොඩ රෝහලේ වෛද්‍ය නිලධාරීන් 10 දෙනෙකු සඳහා යෝජිත වෛද්‍ය නිල නිවාස
13 වැලිකන්ද ප්‍රාදේශීය රෝහල සඳහා යෝජිත මාතෘ හා ළමා සෞඛ්‍ය ඒකකය
14 මනම්පිටිය ප්‍රාදේශීය රෝහල සඳහා බාහිර රෝගී අංශය, හදිසි ප්‍රතිකාර අංශය, සායන සහ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම් සම්පූර්ණ කිරීම-අදියර II
15 මැදිරිගිරිය දිස්ත්‍රික් රෝහලේ වෛද්‍යවරුන් 30 දෙනෙකු සඳහා යෝජිත වෛද්‍ය නිලධාරී නිල නිවාස - අදියර I සහ II
16 වැලිකන්ද රෝහල සඳහා යෝජිත බාහිර රෝගී අංශය, පරිපාලන ගොඩනැගිල්ල

භාණ්ඩාගාරය අරමුදල් යටතේ වන ව්‍යාපෘති

17 කඩවත යෝජිත ශරීර අභ්‍යාස මධ්‍යස්ථානය - අදියර II
18 සරණ මාවත ඇළ මාර්ගය ඔස්සේ ස්ථිර පෝරු ටැඹ ස්ථාපිත කිරීම
19 තලවතුගොඩ ජෛව විද්‍යා අධ්‍යයන උද්‍යානයේ යෝජිත ගොඩකිරීම් - අදියර I

ස්වයං අරමුදල් යටතේ වන ව්‍යාපෘති

20 මුතුරාජවෙල යෝජිත කසල උද්‍යානය ඉදිකිරීම් - අදියර I
21 අනුරාධපුර යෝජිත සේවා පියස සහ සංචාරක බංගලාව
22 මුතුරාජවෙල අංක 3 කාණ්ඩයේ පෙර සවි කුළුණු සවිකිරීම
23 යෝජිත ශ්‍රීලඉගොසංස වැඩපොළ මුතුරාජවෙල ඉදිකිරීම
24 කිරිමණ්ඩල මාවත යෝජිත ක්‍රීඩා සංකීර්ණය
25 රාජගිරිය ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කිරීමේ කාර්යයන්.
26 රාජගිරිය ශ්‍රීලඉගොසංස ප්‍රධාන කාර්යාල ගොඩනැගිලි පරිශ්‍රයේ යෝජිත පිරිසැකසූ වානේ ගොඩනැගිල්ල සඳහා වැඩපොළ ස්ථානයේදී ශක්තිමත් කරන ලද කොන්ක්‍රීට් කුළුණු යෙදීමේ කාර්යය

REDECO යටතේ වන ව්‍යාපෘති

27 කෙරවලපිටියේ මුහුදු වැලි ඇසිරීමේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම.

UDA යටතේ වන ව්‍යාපෘති

1. කෑගල්ල යෝජිත බස් නැවතුම්පොළ සඳහා ඉඩම සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය අදියර II

ඉහත ව්‍යාපෘතිය නගර සංවර්ධන වැඩසටහන යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රදානය කර ඇත. ඉඩම් ගොඩකිරීම (අක්කර 5) සහ සතරැස් බොක්කු 3ක් ඇතුළුව මීටර් 280ක් වටා අපවහනය වැඩිදියුණු කිරීමේ කාර්යයන් ඇතුලත් වන ව්‍යාපෘති අදියර I සහ II හි මුළු ව්‍යාපෘති පිරිවැය රු.මි. 178.04කි. (වැට් බදු හැර)

ව්‍යාපෘතියේ I අදියර 2014 වර්ෂයේ සැප්තැම්බර් මස 20 වැනි දින ආරම්භ කර ඇති අතර මූල්‍ය ගැටලු හේතුවෙන් 2015 ජනවාරි මස සිට 2015 අගෝස්තු මාසය දක්වා

තාවකාලිකව අත්හිටුවා ඇත. ව්‍යාපෘතියෙහි අදියර I, 2015 වර්ෂයේ අගෝස්තු මස25 වැනි දින නැවත ආරම්භ කර ඔක්තෝබර් මස සම්පූර්ණ කර ඇත. ව්‍යාපෘතියේ අදියර IIහි කාර්යයන් 2016 අගෝස්තු මස ආරම්භ කර ඇත.

2018 ජනවාරි මස අවසානය වනවිට අදියර II නිම කරන ලද අතර 2018 වර්ෂය තුළදී සිදු කර ඇති කාර්යයන්හි වටිනාකම රු.මි. 9.90ක්ද සිදු කර ඇති කාර්යයන්වල සමුච්චිත වටිනාකම රු.මි. 80.41ක්ද වේ.



2. කඳුරුවෙල නගර සංවර්ධන ව්‍යාපෘතියේ ඉඩම් සංවර්ධනය කිරීමේ කාර්යයන් - අදියර I

ඉහත ව්‍යාපෘතිය නගර සංවර්ධන වැඩසටහන යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රදානය කර ඇත. ඉඩම් ගොඩකිරීම (අක්කර 8.7) සහ අපවහනය වැඩි දියුණු කිරීමේ කාර්යයන් (මීටර් 1000ක් වටා) ව්‍යාපෘතියට ඇතුලත් වේ. මුළු ව්‍යාපෘති පිරිවැය රු.මි. 448.28කි. (වැට් බදු හැර)

ව්‍යාපෘතිය 2016 වර්ෂයේ නොවැම්බර් මස ආරම්භ කර ඇති අතර 2018 වර්ෂයේ අගෝස්තු මස සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය.

2018 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු.මි. 227.82ක් වූ අතර සිදු කර ඇති සමුච්චිත කාර්යයන්හි වටිනාකම රු.මි. 374.17කි.



<u>මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ වන ව්‍යාපෘති</u>

3. හොරණ බස් නැවතුම්පොළ ඉදිකිරීම - අදියර III

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් සුබිතපුරවර ප්‍රාදේශීය නගර සංවර්ධන වැඩසටහන යටතේ ඉහත ව්‍යාපෘතිය ප්‍රදානය කරන ලදී. වැට් බදු හැර ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 55.81 ක් වන අතර, එයට බස් නැවතුම්පොළේ නිම කිරීමේ කටයුතු, විදුලි කාර්යයන්, වහළ සකස් කිරීමේ කාර්යයන් සහ වැසිකිලි ඉදිකිරීමේ කාර්යයන් ඇතුළත් වේ.

මෙම ව්‍යාපෘතිය 2017 සැප්තැම්බර් මස ආරම්භ වූ අතර 2019 පෙබරවාරි මස අවසන් වන විට නිම කිරීමට සැලසුම් කර ඇත. 2018 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු.මිලියන 37.64 ක් වූ අතර සිදු කරන ලද කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු.මිලියන 54.76 කි.



4. පාදුක්ක ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමේ ඉදිකිරීම් - අදියර II

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් සුබිත පුරවර ප්‍රාදේශීය නගර සංවර්ධන වැඩසටහන යටතේ ඉහත ව්‍යාපෘතිය ප්‍රදානය කර ඇත. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 41.57 ක් වන අතර එයට ක්‍රීඩා පිටිය වැඩිදියුණු කිරීම, රථගාල්, පදික වේදිකා, භූමි අලංකරණ කටයුතු, ජාල මනුකරණ පද්ධති සහ ඇඳුම් මාරු කිරීමේ කාමර ඉදිකිරීම ඇතුළත් වේ.

ව්‍යාපෘතියේ III වන අදියර 2018 ජුනි මස ආරම්භ වූ අතර 2019 ජනවාරි මස අවසන් වන විට නිම කිරීමට සැලසුම් කර ඇත. 2018 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම රු.මිලියන 37.64 ක් වන අතර සිදු කරන ලද සමුච්චිත කාර්යන්වල වටිනාකම රු. මිලියන 37.64කි.



5. **කළුතර දුම්රිය ස්ථානය සහ බස් නැවතුම්පොළ අතර වාණිජ සංවර්ධනය සැලසුම් කිරීම සහ ඉදිකිරීම - අදියර II සහ IV**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් සුබිතපුරවර ප්‍රාදේශීය නගර සංවර්ධන වැඩසටහන යටතේ ඉහත ව්‍යාපෘතිය ප්‍රදානය කරන ලදී. අදියර II සහ IV හි ඇස්තමේන්තුගත පිරිවැය වැට් බදු හැර රු. මිලියන 171.06 කි.

ව්‍යාපෘතියේ II වන අදියර 2018 මාර්තු මස අවසානය වන විටත්, IV වන අදියර 2018 සැප්තැම්බර් මස අවසන් වන විටත් අවසන් කර ඇත. 2018 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම රු. මිලියන 62.54 ක් වූ අතර II සහ IV අදියර යටතේ සිදු කරන ලද කාර්යයන්වල සමුච්චිත වටිනාකම පිළිවෙලින් රු.මිලියන 73.23 ක් සහ රු.මිලියන 62.54 ක් විය.



6. **කලුතර පවතින තැපැල් දෙපාර්තමේන්තු නිල නිවාස වෙනත් ස්ථානයකට ගෙන යෑම සඳහා පලාතොට යෝජිත නිල නිවස - අදියර III**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් සුබිතපුරවර ප්‍රාදේශීය නගර සංවර්ධන වැඩසටහන යටතේ ඉහත ව්‍යාපෘතිය ප්‍රදානය කරන ලදී. වැට් බදු හැර ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 17.18 ක් වන අතර, එයට ව්‍යුහාත්මක සහ නිම කිරීමේ කාර්යයන් ඇතුළුව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම ඇතුළත් වේ.

මෙම ව්‍යාපෘතිය 2017 නොවැම්බර් මස ආරම්භ වූ අතර එය 2019 මාර්තු මස අවසන් වන විට නිම කිරීමට සැලසුම් කර ඇත. 2018 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම රු. මිලියන 16.20 ක් වූ අතර සිදු කරන ලද කාර්යයන්වල සමුච්චිත වටිනාකම රු. මිලියන16.20 ක් විය.



7. **බුලත්සිංහල ආර්ථික මධ්‍යස්ථානය සහ පොළ අසල ඇළ මාර්ග සංවර්ධනය කිරීමේ සැලසුම් සහ ඉදිකිරීම්**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් සුබිත පුරවර ප්‍රාදේශීය නගර සංවර්ධන වැඩසටහන යටතේ ඉහත ව්‍යාපෘතිය ප්‍රදානය කරන ලදී. වැට් බදු හැර ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 30.82 ක් වන අතර, එයට ඇළ මාර්ග සංවර්ධනය කිරීම සහ ගේබියන් ඉදිකිරීම් ඇතුළත් වේ

ව්‍යාපෘති කටයුතු 2017 දෙසැම්බර් මස ආරම්භ කරන ලද අතර 2018 මැයි මස අවසානය වන විට නිම කරන ලදී. 2018 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු. මිලියන 27.93 ක් වූ අතර සිදු කරන ලද කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු. මිලියන 28.93 කි.



8. **හොරණ පොළ ප්‍රදේශයේ ජල අපවහන කාර්යයන් සැලසුම් කිරීම සහ ඉදිකිරීම**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් සුබිතපුරවර ප්‍රාදේශීය නගර සංවර්ධන වැඩසටහන යටතේ ඉහත ව්‍යාපෘතිය ප්‍රදානය කරන ලදී. වැට් බදු හැර ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 44.67 ක් වන අතර, එයට පොළව කොන්ක්‍රීට් කිරීම,

ඉන්ටර්ලොක් පදික වේදිකා සකස් කිරීම සහ RCC කානු ඉදිකිරීමේ කාර්යයන් ඇතුළත් වේ.

මෙම ව්‍යාපෘතිය 2017 නොවැම්බර් මස ආරම්භ වී 2018 අප්‍රේල් මාසය වන විට නිම කරන ලදී. 2018 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම රු. මිලියන 37.09 ක් වූ අතර සිදු කරන ලද කාර්යයන්වල සමුච්චිත වටිනාකම මිලියන 40.32 කි.



9. කිරිමණ්ඩල මාවතේ තත්‍ය කාල ගංවතුර පාලන සහ ජල කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් සුබිත පුරවර ප්‍රාදේශීය නගර සංවර්ධන වැඩසටහන යටතේ ඉහත ව්‍යාපෘතිය ප්‍රදානය කරන ලදී. වැටි බදු හැර ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 682.82 කි. මෙම ව්‍යාපෘතිය 2017 දෙසැම්බර් මස ආරම්භ කරන ලද අතර එය 2019 දෙසැම්බර් වනවිට නිම කිරීමට නියමිතය.

2018 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු. මිලියන 106.30 කි.



10. හොරණ යෝජිත බස් නැවතුම්පොළ සැලසුම් කිරීම සහ ඉදිකිරීම් අදියර IV

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් සුබිත පුරවර ප්‍රාදේශීය නගර සංවර්ධන වැඩසටහන යටතේ ඉහත ව්‍යාපෘතිය ප්‍රදානය කරන ලදී. වැටි බදු හැර ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 62.50 44.67 ක් වන අතර, එයට හොරණ බස් නැවතුම්පොළේ කාණු සහ තාප්ප ඉදිකිරීමේ කාර්යයන් ඇතුළත් වේ.

මෙම ව්‍යාපෘතිය 2018 අප්‍රේල් මාසයේ ආරම්භ කරන ලද අතර එය 2019 මාර්තු වන විට නිම කරන ලදී. 2018 වසර අවසානයේ සිදු කරන ලද කාර්යයේ වටිනාකම රු. මිලියන 34.08 කි.



<u>"පිබිදෙමු පොලොන්නරුව" දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වන ව්‍යාපෘති</u>

ඉහත වැඩසටහන යටතේ, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා ව්‍යාපෘති 15 ක් අප වෙත ප්‍රදානය කර ඇත. ව්‍යාපෘතිවල මුළු පිරිවැය රු. මිලියන 1,011.10 කි. (වැටි බදු හැර)

1. වැලිකන්ද රෝහල සඳහා යෝජිත විශේෂඥ වෛද්‍ය නිල නිවාස
2. හිඟුරක්ගොඩ දිස්ත්‍රික් රෝහල සඳහා යෝජිත දන්තාරෝග්‍ය ඒකකය
3. හතරැස්කොටුව රෝහල සඳහා යෝජිත වෛද්‍ය නිලධාරි නිල නිවාස
4. හිඟුරක්ගොඩ රෝහලේ වෛද්‍ය නිලධාරීන් 10 දෙනෙකු සඳහා යෝජිත වෛද්‍ය නිල නිවාස
5. බකමූණ ප්‍රාදේශීය රෝහල සඳහා යෝජිත මෘත ශරීරාගාර ගොඩනැගිල්ල
6. හතරැස්කොටුව රෝහල සඳහා යෝජිත ඖෂධ සහ වෙනත් කාර්ය මණ්ඩල ද්විත්ව නිවාස
7. හතරැස්කොටුව රෝහල සඳහා යෝජිත ප්‍රාථමික සෞඛ්‍ය ආරක්ෂණ ඒකකය
8. මැදිරිගිරිය දිස්ත්‍රික් රෝහලේ වෛද්‍යවරුන් 30 දෙනෙකු සඳහා යෝජිත වෛද්‍ය නිලධාරි නිල නිවාස - අදියර I සහ II
9. වැලිකන්ද ප්‍රාදේශීය රෝහල සඳහා යෝජිත මාතෘ හා ළමා සෞඛ්‍ය ඒකකය
10. වැලිකන්ද රෝහල සඳහා යෝජිත බාහිර රෝගී අංශය, සායන සහ පරිපාලන ගොඩනැගිල්ල
11. මනම්පිටිය ආයුර්වේද රෝහල් ගොඩනැගිල්ලේ ඉතිරි කාර්යයන් සහ නවීකරණය කිරීමේ කාර්යයන්
12. අත්තනකඩවල රෝහල් වාට්ටුවේ සනීපාරක්ෂක පහසුකම් ඉදිකිරීම
13. පිහිටිවැව සායන මධ්‍යස්ථානයේ ඉතිරි කාර්යයන්

14. මනම්පිටිය ප්‍රාදේශීය රෝහල සඳහා බාහිර රෝගී අංශය, හදිසි ප්‍රතිකාර අංශය, සායන සහ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම් සම්පූර්ණ කිරීම-අදියර II
15. කඳුරුවෙල, යෝජිත ත්‍රිභාෂා පාසල සඳහා ඉඩම් සහ අපවහන වැඩි දියුණු කිරීමේ කාර්යයන්

ව්‍යාපෘති 2016 අගෝස්තු මාසයේදී ආරම්භ කරන ලද අතර ව්‍යාපෘති පහළොව අතුරින් ව්‍යාපෘති 9 ක් 2017 වර්ෂය තුළ නිම කර ඇත. 2018 වර්ෂය තුළ ව්‍යාපෘති හතරක් නිම කරන ලද අතර ව්‍යාපෘති දෙකක් නිම කිරීමට ආසන්නව ඇත. 2018 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු. මිලියන 426.75 ක් වූ අතර සිදු කරන ලද සමුච්චිත කාර්යයන්හි වටිනාකම රු. මිලියන 935.22 කි.

2018 වර්ෂය තුළ නිම කරන ලද ව්‍යාපෘති වන්නේ;

- **වැලිකන්ද රෝහල සඳහා යෝජිත විශේෂඥ වෛද්‍ය නිල නිවාස**
- **හිඟුරක්ගොඩ රෝහලේ වෛද්‍ය නිලධාරීන් 10 දෙනෙකු සඳහා යෝජිත වෛද්‍ය නිල නිවාස**
- **වැලිකන්ද ප්‍රාදේශීය රෝහල සඳහා යෝජිත මාතෘ හා ළමා සෞඛ්‍ය ඒකකය**
- **මනම්පිටිය ප්‍රාදේශීය රෝහල සඳහා බාහිර රෝගී අංශය, හදිසි ප්‍රතිකාර අංශය, සායන සහ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම් සම්පූර්ණ කිරීම-අදියර II**



වැලිකන්ද රෝහල සඳහා යෝජිත විශේෂඥ වෛද්‍ය නිල නිවාස



හිඟුරක්ගොඩ දිස්ත්‍රික් රෝහල සඳහා යෝජිත දන්තාරෝග්‍ය ඒකකය



හතරැස්කොටුව රෝහල සඳහා යෝජිත PHM සහ වෙනත් කාර්ය මණ්ඩල ද්විත්ව නිවාස



පිහිටිවැව සායන මධ්‍යස්ථානයේ ඉතිරි කාර්යයන්



බකමූණ ප්‍රාදේශීය රෝහල සඳහා යෝජිත මෘත ශරීරාගාර ගොඩනැගිල්ල



අත්තනකඩවල රෝහල් වාට්ටුවේ සනීපාරක්ෂක පහසුකම් ඉදිකිරීම



මනම්පිටිය ආයුර්වේද රෝහල් ගොඩනැගිල්ලේ ඉතිරි කාර්යයන් සහ නවීකරණය කිරීමේ කාර්යයන්



වැලිකන්ද රෝහල සඳහා යෝජිත විශේෂඥ වෛද්‍ය නිල නිවාස



වැලිකන්ද ප්‍රාදේශීය රෝහල සඳහා යෝජිත මාතෘ හා ළමා සෞඛ්‍ය ඒකකය



හිඟුරක්ගොඩ රෝහලේ වෛද්‍ය නිලධාරීන් 10 දෙනෙකු සඳහා යෝජිත වෛද්‍ය නිල නිවාස



හතරැස්කොටුව රෝහල සඳහා යෝජිත වෛද්‍ය නිලධාරී නිල නිවාස සහ පරිපාලන ගොඩනැගිල්ල



මනම්පිටිය ප්‍රාදේශීය රෝහල සඳහා බාහිර රෝගී අංශය, හදිසි ප්‍රතිකාර අංශය, සායන සහ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම් සම්පූර්ණ කිරීම

15. මැදිරිගිරිය දිස්ත්‍රික් රෝහලේ වෛද්‍යවරුන් 30 දෙනෙකු සඳහා යෝජිත වෛද්‍ය නිලධාරී නිල නිවාස - අදියර I සහ II

ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය වැට් බදු හැර රු. මිලියන 260.67 කි. මෙම ව්‍යාපෘතිය 2016 අගෝස්තු මාසයේදී ආරම්භ වූ අතර එය 2019 ජනවාරි මාසයේදී නිම කරන ලදී.

2018 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු.මිලියන 165.04 ක් වන අතර 2018 වර්ෂය අවසානයේදී සිදු කරන ලද කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු.මිලියන 230.34 කි.



16. වැලිකන්ද රෝහල සඳහා යෝජිත බාහිර රෝගී අංශය, සායන සහ පරිපාලන ගොඩනැගිල්ල

වැලිකන්ද රෝහල සඳහා පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම ඇතුළුව ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 168.59 ක් විය. (වැටි බදු හැර)

මෙම ව්‍යාපෘතිය 2016 අගෝස්තු මාසයේදී ආරම්භ කරන ලද අතර එය 2019 ජනවාරි මාසයේදී නිම කරන ලදී. 2018 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම රු.මිලියන 126. 42 ක් වූ අතර 2018 වර්ෂය අවසානයේදී සිදු කරන ලද සමුච්චිත කාර්යයන්වල විටිනාකම රු. මිලියන 160.00 ක් විය.



භාණ්ඩාගාර අරමුදල් යටතේ වන ව්‍යාපෘති

17. කඩවත යෝජිත ශරීර අභ්‍යාස මධ්‍යස්ථානය - අදියර II

ව්‍යාපෘතිය මේ වනවිට අවසන් කර ඇති අතර නඩත්තු කටයුතු සිදු කර ඇත. 2018 වර්ෂය සඳහා වෙන් කරන ලද මුළු භාණ්ඩාගාර ප්‍රතිපාදනය රු.මිලියන 47.00කි. 2018 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම රු.මිලියන 47.03 කි.



18. සරණ මාවත ඇළ මාර්ගය ඔස්සේ ස්ථිර පෝරු ටැඹ යෙදීම

2017 වර්ෂයේදී සරණ මාවත ඔස්සේ පෝරු ටැඹ යෙදීමේ කාර්යයන් ආරම්භ කරන ලදී. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 79.05කි. (වැටි බදු හැර). 2018 වර්ෂය සඳහා මුළු භාණ්ඩාගාර ප්‍රතිපාදන වෙන් කිරීම රු.මිලියන 75.00 කි.

මෙම ව්‍යාපෘතිය 2018 ඔක්තෝම්බර් මාසයේදී නිම කරන ලදී. 2018 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම රු.මිලියන 34.78 ක් වූ අතර 2018 වර්ෂය අවසානයේදී සිදු කරන ලද කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු.මිලියන 75.00 කි.



19. තලවතුගොඩ ජෛව විද්‍යා අධ්‍යයන උද්‍යානයේ යෝජිත ගොඩකිරීම් - අදියර I

තලවතුගොඩ ජෛව විවිධත්ව උද්‍යානයේ ඉඩම් වැඩිදියුණු කිරීමේ කටයුතු මෙම ව්‍යාපෘතියට ඇතුළත් වේ. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 94.56 කි. (වැටි බදු හැර). 2018 වර්ෂය සඳහා මුළු භාණ්ඩාගාර ප්‍රතිපාදනය රු.මිලියන 57.50 කි.

2018 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු. මිලියන 57.07 ක් වන අතර 2018 වර්ෂය අවසානයේදී සිදු කර ඇති සමුච්චිත කාර්යයන්වල වටිනාකම රු.මිලියන 69.85කි.



ශ්‍රීලඟොසංස වේ ස්වයං ව්‍යාපෘති

20. කෙරවලපිටිය යෝජිත කසල උද්‍යානය ඉදිකිරීම

ඉහත ව්‍යාපෘතිය 2017 ජූනි මස අගදී ආරම්භ කරන ලද අතර එය 2019 දෙසැම්බර් වන විට අවසන් කිරීමට නියමිතය. මෙම ව්‍යාපෘතිය වානේ ගොඩනැගිලි, ලීචේට් ප්‍රතිකාර යන්ත්‍රාගාරයක්, ලීචේට් තටාකයේ පෙරසවි

පයිල් කිරීමේ කාර්යයන් සහ වින්ඩ්‍රෝ පැඩ් ඉදිකිරීමෙන් සමන්විත වේ.

2018 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම රු. මිලියන 27.47 ක් වූ අතර සිදු කරන ලද සමුච්චිත කාර්යයන්වල වටිනාකම රු.මිලියන 137.73 කි.



21. අනුරාධපුර යෝජිත සේවා පියස සහ සංචාරක බංගලාව

ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 108.90 කි. (වැට් බදු හැර). සේවා පියස ඉදිකිරීම 2018 දෙසැම්බර් මස වනවිට අවසන් කරන ලදී.

2018 වර්ෂය තුළ සේවා පියසෙහි සිදු කර ඇති කාර්යයන්වල වටිනාකම රු. මිලියන 4.30 ක් වන අතර 2018 වර්ෂය අවසන් වනවිට සිදු කර ඇති සමුච්චිත කාර්යයන්වල වටිනාකම රු. මිලියන 26.23 කි.

2018 වර්ෂය තුළ සංචාරක බංගලාවේ සිදු කර ඇති කාර්යයන්වල වටිනාකම රු. මිලියන 32.70 ක් වන අතර 2018 වර්ෂය අවසන් වනවිට සිදු කර ඇති සමුච්චිත කාර්යයන්වල වටිනාකම රු. මිලියන 37.70 කි.



22. මුතුරාජවෙල අංක 3 කොටසේ පෙර සවි කුළුණු සවිකිරීම

යෝජිත ගොඩනැගිලි අංක 03 සඳහා පෙර සවි කුළුණු ස්ථාපිත කිරීමෙන් ඉහත ව්‍යාපෘතිය සමන්විත වේ. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 101.46 කි. (වැට් බදු හැර)

මෙම ව්‍යාපෘතිය 2018 පෙබරවාරි මාසයේදී ආරම්භ කරන ලද අතර 2019 ජනවාරි වනවිට අවසන් කිරීමට සැලසුම් කර ඇත. 2018 දී සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම රු. මිලියන 79.78 ක් වූ අතර 2018 වර්ෂය අවසන් වන විට සිදු කරන ලද සමුච්චිත කාර්යයන්වල වටිනාකම රු. මිලියන 79.78 කි.



23. යෝජිත ශ්‍රීලඉගොසංස වැඩපොළ මුතුරාජවෙල ඉදිකිරීම

ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය ඩොලර් රු.මිලියන 234.91 කි. ව්‍යාපෘති කාර්යයන් 2017 ජූලි මාසයේදී ආරම්භ වූ අතර 2019 මාර්තු වනවිට අවසන් කිරීමට නියමිතය.



24. කිරිමණ්ඩල මාවත යෝජිත ක්‍රීඩා සංකීර්ණය

මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 70.39 කි. මෙම ව්‍යාපෘතිය 2018 ජුනි මාසයේදී ආරම්භ වූ අතර එය 2019 ජුනි මාසය වන විට අවසන් කිරීමට නියමිතය.

2018 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම රු.මිලියන 12.67 කි



25. රාජගිරිය ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කිරීමේ කාර්යයන්

ඉදිකිරීම් අංශය, මාධ්‍ය ඒකකය, ඉඩම් අංශය වෛද්‍ය ඒකකය, තොරතුරු තාක්ෂණ ඒකකය සහ විශේෂ ව්‍යාපෘති අංශය ප්‍රතිසංවිධානය කිරීමේ කටයුතු 2018 දී අවසන් කර ඇත.

2018 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු. මිලියන 14.70 කි.

26. රාජගිරිය ශ්‍රීලඉගොසංස ප්‍රධාන කාර්යාල ගොඩනැඟිලි පරිශ්‍රයේ යෝජිත පිරිසැකසූ වානේ ගොඩනැගිල්ල සඳහා වැඩපොළ ස්ථානයේදී ශක්තිමත් කරන ලද කොන්ක්‍රීට් කුළුණු යෙදීමේ කාර්යය

ඇස්තෙම්න්තුගත මුළු ව්‍යාපෘති පිරිවැය රු. මිලියන 79.36 කි. (වැට් බදු හැර). මෙම ව්‍යාපෘතිය 2018 ඔක්තෝම්බර් මාසයේ ආරම්භ වූ අතර 2019 පෙබරවාරි මාසයේදී නිම කිරීමට සැලසුම් කර ඇත.

2018 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු. මිලියන 6.90 කි.



<u>REDECO</u> යටතේ වන ව්‍යාපෘති

27. කෙරලවපිටිය මුහුදු වැලි ඇසිරීමේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම

ඇස්තෙම්න්තුගත මුළු ව්‍යාපෘතිය පිරිවැය රු. මිලියන 66.96 ක් (වැට් බදු හැර) විය.

මෙම ව්‍යාපෘතිය 2018 අගෝස්තු මාසයේදී ආරම්භ කරන ලදී. 2018 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්වල වටිනාකම රු.මිලියන 39.11 කි.

ඉඩම් හා අලෙවිකරණ අංශය

පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම කෙරෙහි අවධානය යොමු කරන සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරී අංශවලින් එකක් වන්නේ ඉඩම් සහ අලෙවිකරණ අංශයයි; එනම් සංවර්ධන කටයුතු සඳහා සුදුසු ඉඩම් අත්පත් කර ගැනීම, ජලය රඳවා තබා ගැනීමේ කාර්යයන් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම, එම ඉඩම්වල භාරකරු ලෙස මහ කොළඹ ගංවතුර පාලන හා පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (GCFC & EIP) සඳහා අත්පත් කර ගත් ඉඩම් කළමනාකරණය කිරීම, ඉඩම් බැහැර කිරීම, ඉඩම් අන්සතු කිරීමේ මාර්ගෝපදේශ අනුව ඉඩම් බැහැර කිරීම, 2006 අංක 35 දරණ සංශෝධිත පනතට අනුව තෙත්බිම් ප්‍රකාශයට පත් කිරීම, එවැනි සංවර්ධනයන්හි බලපෑමට ලක්වූ අනවසර පදිංචිකරුවන් නැවත පදිංචි කිරීම සහ ඔප්පු නිකුත් කිරීම.

2016 වර්ෂයේදී මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් රජයේ නව මහානගර සැලැස්ම දියත් කරන ලදී. මෙම සැලැස්මට අනුකූලව ලොජිස්ටික් සිටි, ඒරෝ සිටි, ටෙක්නෝ සිටි වැනි නව නගර සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර ඇත. කොළඹ වරාය සහ කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළට ආසන්නව පිහිටා තිබීම හේතුවෙන්, මුතුරාජවෙල ප්‍රදේශය බස්නාහිර කලාපයේ ලොජිස්ටික් කලාපයේ කොටසක් ලෙස හඳුනාගෙන තිබේ. කෙරවලපිටිය පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘතියේ ආරම්භයත් සමඟ භාණ්ඩ ප්‍රවාහන සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා මුතුරාජවෙල ප්‍රදේශයේ ඉඩම්වල ඉල්ලුම සැලකිය යුතු ලෙස වැඩි විය. ලොජිස්ටික් නගර සංකල්පයට අනුකූලව සංස්ථාව මුතුරාජවෙල ප්‍රදේශයේ බොහෝ සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර ඇත.

ලංසු තැබීමේ ක්‍රියාවලිය හරහා තරඟකාරී මිලක් ලබා ගැනීමෙන් පසු බහුකාර්ය ඒකාබද්ධ භාණ්ඩ ප්‍රවාහන කටයුතු ආරම්භ කිරීම සඳහා අක්කර 34 ක පමණ විශාලත්වයකින් යුත් බිම් කැබලි කිහිපයක් හේමාස් ලොජිස්ටික්ස් (පෞද්) සමාගම, පිරමිඩ් ලංකා (පෞද්) සමාගම, ඊස්ට් වෙස්ට් ක්ලියරින් ඇන්ඩ් ෆෝවර්ඩින් ලිමිටඩ්, ඩාර්ට් ග්ලෝබල් ලොජිස්ටික්ස් (පුද්) සමාගම සහ ජෝන් කීල්ස් ලොජිස්ටික්ස් (පුද්ගලික) සමාගම යන සමාගම් සඳහා වෙන් කර ඇත.

මුතුරාජවෙල කාර්මික කලාපයේ ඉඩම් බොහොමයක් කර්මාන්ත කිහිපයක් සහ ජාතික වශයෙන් වැදගත් ව්‍යාපෘති සඳහා බැහැර කර ඇත. බනිජ තෙල් ටැංකි උද්‍යානය, ලිට්‍රෝ ගෑස්, ලංවිම බලාගාරය කලාපය තුළ පිහිටා ඇති වැදගත් ව්‍යාපෘති සමහරකි.

මීට අමතරව, අදාළ ප්‍රදේශ තවදුරටත් සංවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් සංචාරක බංගලා සහ ප්‍රාදේශීය කාර්යාල අවශ්‍යතා ඉදිකිරීම සඳහා අනුරාධපුර, ත්‍රිකුණාමලය සහ අම්පාර යන ප්‍රදේශවල ඉඩම් කැබලි කිහිපයක් අත්පත් කර ගැනීමට ඉඩම් හා අලෙවිකරණ අංශය කටයුතු කරමින් සිටී.

දිවයිනේ සංවර්ධනයේ නව මානයන් සමඟ සංස්ථාවේ විෂය පථය වඩාත් සංවර්ධන අරමුණු හා පරිසර සංරක්ෂණය උදෙසා වෙනස් කර ඇත. ගංවතුර පාලනය, තෙත්බිම් සංරක්ෂණය, අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමෙන් ඇළ ඉවුර අලංකාර කිරීම සහ ඇළ ඉවුර ඔස්සේ ඇවිදීමේ මංතීරු ඇති කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු වෙමින් පවතී.

ඉහත කාර්යයන් සඳහා සහාය වීම සඳහා ඉඩම් හා අලෙවිකරණ අංශය රටේ තෙත්බිම් අදියර වශයෙන් ප්‍රකාශයට පත් කිරීමේ නිරත වේ. සංස්ථාවේ අනෙකුත් අදාළ අංශ සමඟ සහයෝගිත්වයෙන් ඇළ මාර්ග සඳහා රක්ෂිත ගැසට් මඟින් ප්‍රකාශයට පත් කරමින් පවතී.

ප්‍රකාශයට පත් කිරීමේ කාර්යයන් යටතේ බස්නාහිර, දකුණ සහ ඌව, මධ්‍යම සහ සබරගමුව පළාත්වල තෙත්බිම් ප්‍රකාශයට පත් කිරීම මේ වන විට සම්පූර්ණ කර ඇත. නැගෙනහිර, උතුර, උතුරු මැද සහ වයඹ පළාත් වල ප්‍රකාශයට පත් කිරීමේ ක්‍රියාකාරකම් මේ වනවිට සිදු කරමින් පවතී. බොහොමයක් පළාත් පාලන ආයතනවලින් සහ මධ්‍යම රාජ්‍ය ආයතනවලින් නිරවුල් කිරීම් ලබා ගත යුතු වන බැවින් ප්‍රකාශයට පත් කිරීමේ ක්‍රියාවලියට කල් ගත වේ.

සංරක්ෂණ කලාපයේ ඉඩම් අනවසරයෙන් අත්පත් කර ගැනීම වැළැක්වීම සහ ප්‍රදේශය අවට ජලාපවහන පද්ධතිය වැඩිදියුණු කිරීම මඟින් මුතුරාජවෙල ප්‍රදේශයේ තෙත්බිම් සංරක්ෂණය සඳහා මුතුරාජවෙල ප්‍රදේශයේ ඉඩම් අත්පත් කර ගැනීම මෑතකදී ආරම්භ කර තිබේ.



මුතුරාජවෙල තෙත්බිම් සංරක්ෂණ කලාපය

සංස්ථාව ජලය රඳවා ගැනීමේ අරමුණු සඳහා GCFC & EI ව්‍යාපෘතිය සඳහා අත්පත් කරගත් වගුරු බිම් නඩත්තු කරයි. වර්තමානයේ මෙම ඉඩම්, ඉඩම් හා අලෙවිකරණ අංශය විසින් සංස්ථාවේ නීති අංශයේ සහ ආරක්ෂක ඒකකයේ සහාය ඇතිව කළමනාකරණය කරනු ලැබේ.

අදාළ ප්‍රදේශවල ගංවතුර අවම කිරීම සහ ජල අපවහන වැඩිදියුණු කිරීමට පහසුකම් සැලසීම පිණිස ඇළ මාර්ග සංවර්ධනය කිරීම සඳහා රාගම, කොලොන්නාව සහ ඔලියමුල්ල යන ප්‍රදේශවල ඉඩම් අත්පත් කර ගැනීමට සංස්ථාව මූලික පියවර ගෙන තිබේ.



කොලොන්නාව පස්සන්න ඇළ සංවර්ධනය

ඉඩම් හා අලෙවිකරණ අංශය දිගු කාලීන කල්බදු, කෙටිකාලීන කල්බදු, සෘජු විකුණුම් සහ තනි නිවාස සඳහා විකුණුම් මඟින් ඉඩම් බැහැර කිරීමේ නිරත වේ. ඉඩම් හා අලෙවිකරණ අංශය 2018 වර්ෂය තුළ විකුණුම් / කල්බදු වලින් දළ වශයෙන් රු.බිලියන 1ක මුදල් ප්‍රවාහයක් අත්කර ගෙන ඇත. මෙය 2017 වර්ෂයට වඩා රු.මිලියන 540 ක වැඩිවීමකි.

සංස්ථාව විසින් අත්පත් කර ගත් වගුරු බිම්වල අනවසර පදිංචිකරුවන් වෙනත් ස්ථානයක පදිංචි කිරීමට ඉඩම් හා අලෙවිකරණ අංශය කටයුතු යොදා ඇත. එවැනි ව්‍යාපෘති මුතුරාජවෙල, වෙදමුල්ල, පොකුණ පාර, දෙහිවල ප්‍රදේශවල පිහිටා ඇත. එවැනි පවුල්වලට මාරුවීම් ඔප්පු නිකුත් කිරීමට කටයුතු යොදා ඇත.

කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල අපද්‍රව්‍ය කළමනාකරණ ගැටලුව සම්බන්ධයෙන් රජය දරන උත්සාහයට සහය පළ කරමින්, සංස්ථාව විසින් මුතුරාජවෙල අක්කර 10 ක ඉඩමක් වෙන් කර ඇති අතර, වෙස්ටර්න් පවර් කම්පැනි (පෞද්) සමාගම විසින් අපද්‍රව්‍ය කළමනාකරණ කම්හලක් ඉදිකිරීම සඳහා මේ වනවිට කටයුතු කරමින් සිටී.



වෙස්ටර්න් පවර් කම්පැනි (පෞද්) සමාගම විසින් අපද්‍රව්‍ය කළමනාකරණ කම්හලක් ඉදිකිරීම

සැලසුම් සහ ව්‍යාපාර සංවර්ධන අංශය

1. මුතුරාජවෙල, කෙරවලපිටිය ප්‍රදේශය පිරවීම සඳහා සහ තොග සංචිත කර තැබීම සඳහා වෙරළට ඔබ්බෙන් මුහුදු වැලි හෑරීම සහ පොම්ප කිරීම

කොන්ක්‍රීට් නිෂ්පාදනයේ අත්‍යවශ්‍යම අංග වන බැවින් සිමෙන්ති, වැලි සහ සමස්තයෙහි සැපයුම කෙරෙහි ප්‍රධාන අවධානයක් යොමු වන අතර ඉදිකිරීම් කර්මාන්තයේ ඉදිකිරීම් ද්‍රව්‍ය සැපයුම් කර්මාන්තය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. මෑත අතීතයේ ඉදිකිරීම් කර්මාන්තයේ විශාල වැඩිවීමත් සමඟ වැලි සඳහා ඇති ඉල්ලුම විශාල ලෙස වැඩි වී ඇති අතර වැලි සැපයුම අඛණ්ඩව සහතික කිරීම ප්‍රධාන ගැටලුවක් වී තිබේ. වැලි සැපයුමේ ප්‍රධාන ප්‍රභවය ගංගා වැලි කැණීම හරහා වුවද, ගංගා වැලි නිස්සාරණය කිරීමෙන් ඇති වන අහිතකර බලපෑම් සැලකිල්ලට ගනිමින් රජය නීති රීති පනවා ඇත.



මෙම දීර්ඝකාලීන සැලකිය යුතු පාරිසරික බලපෑම් සැලකිල්ලට ගනිමින් රජය ගංගා වැලි කැණීම් සඳහා දැඩි තහංචි පැනවූවා පමණක් නොව ඒ සඳහා විකල්ප විසඳුමක් සෙවීමද ආරම්භ කළේය. තවද හිඟකම හේතුවෙන් ගංගා වැලි මිල ඉහළ ගොස් ඇති අතර අඩු වියදම් විකල්පයක් සොයා ගැනීම විශාල අවශ්‍යතාවයක් විය.

මුහුදු වැලි යනු ගංගා වැලි සඳහා හොඳම ආදේශකයක් වන අතර එය අවශ්‍ය ප්‍රමාණයක් ඉතා සාධාරණ මිලකට ලබා ගත හැකි අතර වඩාත් පරිසර හිතකාමී ආකාරයෙන් ලබා ගත හැකිය.

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (ශ්‍රීලඉගොසංස) 1993 වර්ෂයේ සිට මුහුදු වැලි කැණීම් හා පොම්ප කිරීමේ කටයුතුවල නිරතව සිටී. ආරම්භයේ දී ගොඩකිරීම් කටයුතු සඳහා මුහුදු වැලි පොම්ප කරන ලද අතර වැලි සඳහා ඇති ඉල්ලුමේ පරතරය පියවා ගැනීම සඳහා ශ්‍රීලඉගොසංස පමණක් 2013 වර්ෂයේ සිට ඉදිකිරීම් කර්මාන්තයට මුහුදු වැලි සපයා ඇත.

වර්ෂය	කොන්ත්‍රාත්කරු	පොම්ප කරන ලද ප්‍රමාණය
1994/95	බොස්කලිස් ඉන්ටර්නැෂනල්, නෙදර්ලන්තය	ඝ.මී.මිලියන 5
2005/07	රෝඩ් නීල්සන් ඒ / එස්, ඩෙන්මාර්කය	ඝ.මී.මිලියන 3
2011/13	ඩ්‍රජෙන් ඉන්ටර්නැෂනල්, බෙල්ජියම	ඝ.මී.මිලියන 3.8

ශ්‍රීලඉගොසංස විසින් කෙරවලපිටියේ වෙන් කරන වැලි ලබා ගැනීමේ ඉඩමක් ඇත. වෙරළේ සිට ආසන්න වශයෙන් කි.මී. 15ක් ඔබ්බෙන් පිහිටි වැලි ලබා ගැනීමේ ඉඩමෙන් හාරනු ලබන වැලි කෙරවලපිටිය පිහිටි විශේෂිත සංචිතයට පොම්ප කරනු ලැබේ. මේ වනවිටත් ඉදිකිරීම් කර්මාන්තයට වැලි ඝන මීටර් මිලියන 2.5 කට වැඩි ප්‍රමාණයක් සැපයීමේ හෑරීමේ සහ කැණීම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙමින් පවතී.

- ව්‍යාපෘතියේ විෂයපථය
  - ඉඩම් ගොඩකිරීම සඳහා මුහුදු වැලි හෑරීම සහ පොම්ප කිරීම - ඝන මීටර් මිලියන 1.5
  - ඉදිකිරීම් කර්මාන්තය සඳහා වැලි සැපයීමට මුහුදු වැලි හෑරීම සහ පොම්ප කිරීම - ඝන මීටර් මිලියන 2.5
- කොන්ත්‍රාත් වටිනාකම- ඇ.ඩො. මිලියන 19.975
- කොන්ත්‍රාත්කරු - රෝඩ් නීල්සන් ඒ / එස් (පෞද්.) සමාගම
- වැඩසටහන
- අදියර I - ඝ.මී.1,000,000 (2018.01.20 - 2018.05.04)
  අදියර II - ඝ.මී. 3,000,000 (2018.10.15 - 2019.06.30)
- ප්‍රගතිය
  - 2018.12.31 දිනට ඝ.මී.1,736,965 ක් හාරා ඇත.

කෙරවලපිටියෙන් ලබාගත් මුහුදු වැලි, කෙරවලපිටියේ පිහිටි සේදීමේ හා හැළීමේ කම්හලේ සෝදා හළනු ලැබේ. වර්තමානයේ සේදීමේ හා හැළීමේ යන්ත්‍රාගාරය දිනකට කියුබ 500 කට වඩා සපයයි. මෙම වෙරළබඩ වැලි " සංස්ථා වැලි" වෙළඳ නාමය යටතේ විකුණනු ලැබේ.

එහි මිල සහ ඉදිකිරීම් කටයුතු සඳහා වැලි වල යෝග්‍යතාවය පිළිබඳව මහජනයා අතර පවතින මතය වෙනස් වීම හේතුවෙන් පසුගිය වසර කිහිපය තුළ මුහුදු වැලි සඳහා ඇති ඉල්ලුම විශාල ලෙස ඉහළ ගොස් ඇත.

පහත දැක්වෙන ප්‍රස්ථාරයෙන් 2013 සිට වාර්ෂික මුහුදු වැලි අළෙවිය නිරූපණය වන අතර ඉල්ලුම විශාල ලෙස වැඩි වී ඇති බව ඉන් පැහැදිලි වේ.



අපගේ ඉදිරි ගමන

අඛණ්ඩ සැපයුමක් සහතික කිරීම සහ "සංස්ථා වැලි" දිවයිනේ සියලු පළාත්වල පැවතීම ඉහළ නැංවීම සඳහා, ශ්‍රීලඉගොසංස විසින් පහත සඳහන් පියවර ගෙන ඇති අතර එය ඉදිරි වර්ෂවලදී ක්‍රියාත්මක වනු ඇත.

- <u>සේදීමේ සහ හැළීමේ නව යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීම</u>
  සේදූ හා හළන ලද වැලි සඳහා ඇති ඉල්ලුම සපුරාලීම සඳහා දිනකට කියුබ 1000 ක නිෂ්පාදන ධාරිතාවක් සහිත සේදීමේ සහ හැළීමේ යන්ත්‍රාගා රයක් ස්ථාපනය කිරීමට සැලසුම් කර ඇත. මෙය 2019 පළමු කාර්තුව වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත.

- <u>වැසි ඇසුරුම් කිරීමේ යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීම</u>
  නව නිෂ්පාදනයක් වෙළඳපොළට හඳුන්වාදීම සඳහා වැලි ඇසුරුම් කම්හලක් පිහිටුවීම ආරම්භ කිරීමටද තවදුරටත් පියවර ගෙන ඇත. මෙමඟින් කුඩා පරිමාණ ඉදිකිරීම්කරුවන්ට සහ නිවාස ඉදිකරන්නන්ට කිලෝ 50 ක බෑග් ලෙස වැලි ලබා ගැනීමට හැකි වේ. මෙම බලාගාරය මුතුරාජවෙල ස්ථාපිත කෙරේ.

2. කිරිමණ්ඩල මාවත යෝජිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ වාණිජ අගනුවර වන කොළඹ නාගරික සංවර්ධනයේ ඉහළම මට්ටම සහ නාගරීකරණය හා සම්බන්ධ අභියෝගයන් නිදර්ශනය කරයි. දිගු කාලීන තිරසර බව සැලකිල්ලට ගනිමින් මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය නාගරීකරණයේ මෙම අභියෝග යන්ට මුහුණ දීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරයි.

කිරිමණ්ඩල මාවත යනු කොළඹ නගර සීමාව තුළ ඉහළ උපායමාර්ගික වැදගත්කමක් ඇති ප්‍රධාන ස්ථානයක් වන අතර මෙම ප්‍රදේශය හොඳින් සැලසුම් කළ හරිත නගරයක් ලෙස සංවර්ධනය කිරීම "මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ" ප්‍රධාන අවධානයක් යොමු කර ඇත. ජලය රඳවා තබා ගන්නා ප්‍රදේශ සංරක්ෂණය කරමින් හරිත නගරවල හොඳම භාවිතයන් අනුගමනය කරමින් නිවාස, හෝටල්, රෝහල්, පාසල්, විනෝදාත්මක ප්‍රදේශ වැනි යටිතල පහසුකම් සැපයීම සඳහා විශාල ව්‍යාපෘති කිහිපයක් සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘති අදියර දෙකකින් ක්‍රියාත්මක කෙරෙන අතර පළමු අදියරේදී නිවාස සංවර්ධනය ක්‍රියාත්මක කෙරෙන අතර දෙවන අදියරේදී පාසල්, වාණිජ ස්ථාන, විනෝදාත්මක ප්‍රදේශ සහ අනෙකුත් මිශ්‍ර සංවර්ධනයන් සිදු කෙරේ.

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව ("ශ්‍රීලඉගොසංස") සතුව මේ වනවිට අක්කර 05 ක සින්නක්කර ඉඩම් කැබැල්ලක් නාවල, කිරිමණ්ඩල මාවතෙහි ඇත. නාරාහෙන්පිට සහ නාවල වැනි උපායමාර්ගික නගර වලට ආසන්නව පිහිටා ඇති බැවින් මෙම ස්ථානය මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා බෙහෙවින් ගැලපේ.

- ව්‍යාපෘති කාලසීමාව: 2019 ජනවාරි - 2027 දෙසැම්බර්
- ඉඩම සඳහා මූලික වටිනාකම: ආසන්න වශයෙන් රු.බිලියන 4.073
- අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහ නාගරික සංවර්ධන අධිකාරියේ මූලික සැලසුම් නිෂ්කාශනය ලැබී ඇත.
- විභවයක් සහිත අනාගත ආයෝජකයන්ගෙන් RFP කැඳවා 2018 නොවැම්බර් 27 දින අවසන් කර ඇත.
- ලංසු කිසිවක් ලැබී නොමැත.



3. රජයේ සේවකයින් සඳහා යෝජිත රාගම මධ්‍යම ආදායම් නිවාස සංවර්ධන ව්‍යාපෘතිය

පසුගිය දශක දෙක තුළ විශේෂයෙන් අගනගරයට ආසන්නයෙන් මධ්‍යම ආදායම් නිවාස සැපයීම නොවිසඳී ඇති ගැටලුවක් බව ප්‍රකට කරුණකි

මධ්‍යම ආදායම් ලබන සේවකයින්ගෙන් බහුතරය රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයට අයත් වන අතර ශ්‍රී ලංකාවේ මුළු රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව මිලියන 1.4 ක් වන අතර මුළු රැකියා ප්‍රමාණයෙන් 14.6% ක් නියෝජනය කරයි. රාජ්‍ය

හා අර්ධ රාජ්‍ය ආයතනවලින් 77.4% ක් වයස අවුරුදු 30-55 අතර වන බවද අනාවරණය වී ඇත.

රාජ්‍ය අංශයේ නිවාස වෙන් කර ඇති රාගම පිහිටි අක්කර 03 ක සින්නක්කර ඉඩමක් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව ("ශ්‍රීලඉගොසංස") සතුව මේ වනවිට ඇත. නගරයට ආසන්නව පිහිටා ඇති බැවින් නිවාස සංවර්ධන ව්‍යාපෘතිය සඳහා මෙම ස්ථානය බෙහෙවින් ගැලපේ.

ඉහත සඳහන් ඉඩම ශ්‍රීලඉගොසංස පනතේ 3 (අ) වගන්තිය යටතේ සංවර්ධන කටයුතු සඳහා අත්පත් කර ගත් ඉඩමක් වන අතර ශ්‍රීලඉගොසංස 4 වන වගන්තිය යටතේ සංවර්ධන කිරීමෙන් පසු ඕනෑම කාර්මික, වාණිජ හා නිවාස හෝ කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් වෙන් කිරීමට ශ්‍රීලඉගොසංස වෙත බලය ඇත. බස්නාහිර කලාපයේ මහානගර ප්‍රධාන සැලැස්මට අනුව රාගම ප්‍රදේශයේ බහු-මහල් මධ්‍යම ආදායම් නිවාස සංකීර්ණයක් ඉදිකිරීමට ද යෝජනා කර ඇත.

- ශ්‍රීලඉගොසංස ඉල්ලුම පිළිබඳ සමීක්ෂණය සම්පූර්ණ කර ඇත.
- නිවාස වර්ග හඳුනාගෙන ඇත.
- ගෘහ නිර්මාණාත්මත ඇඳීම් සකස් කරමින් පවතී.

➢ **ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්**

1. **මුහුදු වැලි විකිණීම**

සංස්ථාවට වැඩිම ආදායමක් ලැබෙන්නේ මුහුදු වැලි අලෙවියෙනි. පසුගිය වසර කිහිපය හා සසඳන විට 2018 වර්ෂයේදී සංස්ථාව කියුබ් 237,406.36 ක විශිෂ්ට විකුණුම් පරිමාවක් ලබා ගැනීමට සමත් වූ අතර ආදායම අනුව එය රු.මිලියන 1,873 කි.

මුළු ආදායම (2018) : රු.මිලියන 1,873

පහත දැක්වෙන ප්‍රස්තාර මඟින් පසුගිය අඛණ්ඩ වර්ෂ තුනක විකුණුම් රටාව නිරූපණය කෙරේ.





2. **දියත උයන**

දියවන්නා ඔය ඉවුරේ ඉදිකරන ලද දියත උයන උද්‍යානය 2012 සැප්තැම්බර් මාසයේදී විවෘත කරන ලදී. ආරම්භයේ සිටම දිවයින පුරා විසිරී සිටින සෑම තරාතිරමකම පුද්ගලයින් ආකර්ෂණය කර ගැනීමට එය සමත් වී තිබේ. වගුරු බිමක ඉදිකර ඇති මෙම උද්‍යානයට වාණිජ අගනගරයෙන් පහසුවෙන් ළඟා විය හැකිය. නගරයේ කඩිමුඩියෙන් මිදී යම් සහනදායී වටපිටාවක විවේකයෙන් ගත කිරීමට පවුල්වලට මෙය කදිම ස්ථානයකි. සංගීත ජල මලෙන් විහිදෙන වර්ණවත් ජල ධාරාවන් සමස්ත පසුබිමට විචිත්‍රත්වයක් එක් කරයි.



ප්‍රදේශයේ ප්‍රධාන ලක්ෂණ වන්නේ;

- දියවන්නා ඔය ගං ඉවුරේ පිහිටි අලංකාර මල් වෙළඳසැල්
- ගං ඉවුරේ ඇවිද යෑමට හැකි වීම.
- ගංගා බෝට්ටු හෝ රුවල් බෝට්ටු සහ පදින බෝට්ටු සවාරියක් යෑමට හැකි වීම
- ශාක පත්‍රයක හැඩයෙන් යුත් බස් නැවතුම්පොළ
- සිමෙන්තු බංකු සහ මේස
- මධ්‍යයේ පිහිටි ජල මල
- වෙනස්වන වර්ණවලින් යුත් ජල මල
- ළමයින් සඳහා සෙල්ලම් කිරීමේ ප්‍රදේශය
- නිස්කලංක පරිසරය - ශිෂ්‍යයන්ට අධ්‍යයන කටයුතු වුවද සිදු කළ හැක
- ආහාර වෙළඳසැල් -දේශීය සහ විදේශීය කෙටි කෑම වර්ග සහ බීම වර්ග ලබා ගත හැකි වීම

- බිම්ගල් ඇල්ලූ මංතීරු ඔස්සේ ඇවිදීම, දිව යෑම සහ බයිසිකල් පැදීම සිදු කළ හැකි වීම
- ත්‍රිමාණ ඡායාරූප ලබා ගැනීමේ හැකියාව
- වක්‍රාකාර මින් මැදුර

සමාලෝචිත වර්ෂයේදී දියත උයනෙන් උපයන ලද ආදායම පහත පරිදි වේ:

ආහාර අළෙවිසැල්	: රු.මිලියන 42.18
මල් අළෙවිසැල්	: රු.මිලියන 34.86
ප්‍රවර්ධන ක්‍රියාකාරකම්	: රු.මිලියන 10.13
මුළු ආදායම	: රු.මිලියන 87.17

3. බෙල්ලන්විල

කොළඹ වැසියන් මෙම ස්ථානය පිළිබඳව හොඳින් දනිති. සෑම දිනකම සිය ගණනක් හෝ දහස් ගණනක් දිවීම, ඇවිදීම සහ බයිසිකල් පැදීම සඳහා මෙහි පැමිණේ. මෙම ස්ථානයට පැමිණීම රාත්‍රියේදී කොළඹදී කළ හැකි රසවත් දෙයකි.



කොළඹ බොරලැස්ගමුවෙහි පිහිටා ඇති බෙල්ලන්විල උද්‍යානය, ශ්‍රී ලංකාවේ මේ දක්වා අප කතා කළ අනෙක් උද්‍යානවලට වඩා මදක් වෙනස් වේ.

ගංවතුර තර්ජනය පාලනය කිරීමේ අරමුණින් බෙලන්විල උද්‍යානය 2014 දී "වේරස් ගඟ" ව්‍යාපෘතියේ පළමු පියවර ලෙස ඉදිකරන ලදී. මෙම උද්‍යානයේ ප්‍රධාන ලක්ෂණ වන්නේ ඇවිදීමේ මාර්ගය, බයිසිකල් ධාවන පථය සහ ආහාර අළෙවි සැලයි. පවුලේ සාමාජිකයන් හෝ මිතුරන් සමඟ සන්ධ්‍යාව ගත කිරීමට ඇත්තෙන්ම කදිම ස්ථානයකි.

ආහාර අළෙවි සැල්	: රු.මිලියන 15.66
ප්‍රවර්ධන ක්‍රියාකාරකම්	: රු.මිලියන 0.49

මුළු ආදායම (2018): රු.මිලියන 16.15



4. කිඹුලාවල ව්‍යායාම ශාලාව

සාමාජිකයන් 103 දෙනෙකුගෙන් 2015.01.12 දින ආරම්භ කරන ලද ව්‍යායාම ක්‍රියාකාරකම් මේ වනවිට පුද්ගලයින් 483 ක් දක්වා වී ඇති අතර එමඟින් පොදු ජනතාවගේ සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවට අමතර වටිනාකමක් ලබා දේ.

එලදායී, කාර්යක්ෂම හා අභිප්‍රේරණය වන ව්‍යායාම වැඩසටහන් සැලසුම් කිරීමෙන් මෙම තත්ත්වය අත්පත් කරගෙන ඇත. අපගේ පුහුණුකරුවන් මනා සුදුසුකම්වලින් යුක්ත වන අතර කර්මාන්තයේ නව ප්‍රවණතා සමඟ කටයුතු කරයි.



වැදගත්ම දෙය නම්, ඔවුන් අලුතින් සම්බන්ධ වූ අත්දැකීම් අඩු සාමාජිකයන් පිළිබඳව ඉතා සැලකිලිමත් වීම සහ ඔවුන්ට සහාය වීමයි.



කිඹුලාවල ව්‍යායාම් ශාලාව වෙතින් සමාලෝචිත වර්ෂයේ ලැබූ ආදායම පහත පරිදි වේ:

කායවර්ධන මධ්‍යස්ථානය : රු.මිලියන 12.76
ප්‍රවර්ධන ක්‍රියාකාරකම් : රු.මිලියන 0.49
මුළු ආදායම (2018): රු.මිලියන 13.25

5. කෙලිමඬළ

"බොරලැස්ගමුව - කෙලිමඬළ ළමා උද්‍යානය" කොළඹ - හොරණ පාරේ පිහිටා ඇත. කෙලිමඬළ උද්‍යානය 2018 දී "චේරස් ගංගා" ව්‍යාපෘතිය යටතේ ඉදිකර ඇත. විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා ශ්‍රී ලංකාවේ පළමු ළමා උද්‍යානය මෙයයි. මෙම උද්‍යානයේ ප්‍රධාන ලක්ෂණ වන්නේ ඇවිදීමේ මාර්ගය, ආහාර අළෙවි සැල සහ ළමා උද්‍යානයයි. එය සැබවින්ම පවුලේ අය හෝ මිතුරන් සමඟ සන්ධ්‍යාව ගත කිරීමට කදිම ස්ථානයකි.

ආබාධිත ළමුන් සඳහා නිර්මාණය කර ඇති විවිධ ආකාරයේ ක්‍රියාකාරකම් 21 ක් මෙහි ඇත. විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට විශේෂ ආරක්ෂාව යටතේ හැකි තාක් දුරට සාමූහික ක්‍රියාකාරකම් වලට සහභාගී වීමට හැක. සමාලෝචිත වර්ෂයේදී කෙලිමඬළ උද්‍යානයෙන් උපයන ලද ආදායම පහත පරිදි වේ.

ආහාර අළෙවි සැල් : රු.මිලියන1.12
ප්‍රවර්ධන ක්‍රියාකාරකම් : රු.මිලියන 0.24
මුළු ආදායම (2018) : රු.මිලියන 1.36



6. ඇළ මාර්ග රක්ෂිතවල ඇති වෙළඳ ප්‍රචාරක පුවරු

සමාගමේ එළිමහන් සලකුණ බොහෝ විට අනාගත ගනුදෙනුකරුවෙකු දකින පළමු දෙයයි. සමාගම් ලාංඡනය අවධානය ආකර්ෂණය කර ගැනීම සඳහා ප්‍රමාණවත් තරම් දීප්තිමත් හා කැපී පෙනෙන්නක් විය යුතු (අතිශය දීප්තිමත් නොවිය යුතුය) වන අතර අනාගත ගනුදෙනුකරුවන්ට එහි විකුණනු ලබන දේ පිළිබඳව දැන ගැනීමට ප්‍රමාණවත් තොරතුරු සහිත විය යුතුය. ශ්‍රීලඉගොසංස වේ පාලනය යටතේ ඇති ඇළ ඉවුරුවල සහ වෙනත් ස්ථානවල ඇති ඉඩ ප්‍රමාණය පෞද්ගලික පාර්ශ්වයන්ට ඔවුන්ගේ නිෂ්පාදනය, සේවාව හෝ සමාගම ප්‍රදේශයේ මහ නගර සභාවේ අවසරය ඇතිව ප්‍රචාරය කිරීම සඳහා ලබා දී ඇත.



මුළු ආදායම (2018) : රු.මිලියන 8.95

7. ගාටන්ස් ආර්ක් අවන්හල

ගාර්ටන්ස් ආර්ක් යනු නාවල නාගරික තෙත්බිම් උද්‍යානයට යාබදව පිහිටි දියවන්නා ඔයේ නිශ්චල ජලයේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකාවේ විශාලතම යාත්‍රා අවන්හලයි. එය 2014 නොවැම්බර් මාසයේදී දියත් කරන ලදී.



8. තොටුපල බෝට්ටු සේවය

ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහය ඇතිව පාර්ලිමේන්තු මාර්ගයෙන් ඇති වන වාහන තදබදය හේතුවෙන් සිසුන්ට කාලය අහිමිවීම මඟහරවා ගැනීම සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීමට ශ්‍රීලඉගොසංස විසින් දියත උයනේ සිට රාජගිරියේ පාසල දක්වා තොටුපළ සේවාවක් ආරම්භ කර තිබේ. අවබෝධතා ගිවිසුමට අනුව ශ්‍රීලඉගොසංස සහ ශ්‍රී ලංකා නාවික හමුදාව ගාස්තුවක් අයකර බෝට්ටු සේවාව කළමනාකරණය කර ක්‍රියාත්මක කරනු ඇත. රාජගිරියේ ගේට්වේ විද්‍යාලයට මායිම්ව පිහිටි චෝටර්ස් එජ් සමඟ සම්බන්ධ වන අලංකාර ජල මාර්ගය හේතුවෙන් මෙම අනන්‍ය පියවර ගැනීමට හැකි වී ඇත.



මෙම සේවාව ආයතනයට අමතර ආදායමක් ලබා දෙනවා පමණක් නොව, කාර්යබහුල වේලාවන්හිදී රථවාහන තදබදයට හොඳ විසඳුමක් ලබා දීමට උපකාරී වන අතර එමඟින් ඇළ මාර්ග නඩත්තු පිරිවැය අඩු කරනු ඇත.

මුළු ආදායම (2018): රු.මිලියන 0.52



9. හංස බෝට්ටු සේවය

විවේකය සහ සන්සුන්භාවය දියවන්නා ඔයේ දායාදයන් වේ. පදින හංස බෝට්ටු මඟින් විනෝදාත්මක අත්දැකීමක් ලබා දෙන අතරම එහි වගුරුබිම් ඉවුර දිගේ බෝට්ටු සවාරිය නගර වැසියන්ට සොබාදහම සමඟ නැවත සම්බන්ධ වීමට උපකාරී වේ. මෙම පහසුකම මහජනයාට ලබා දීම සඳහා පෞද්ගලික අංශයට භාර දී ඇත.

මුළු ආදායම (2018) : රු.මිලියන 0.32



10. මිහිලිය පොහොර ව්‍යාපෘතිය

2017 අප්‍රේල් මාසයේ මීතොටමුල්ල කසළ කන්දෙහි ඇති වූ ඛේදවාචකයෙන් පසු කසළ අර්බුදය විසඳීමේ වගකීම මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයට පැවරුනු අතර ඒ අනුව කොළඹ කසළ අර්බුදයට ස්ථිර විසඳුමක් ලබා දීම සඳහා කෙරවලපිටියේ විද්‍යාත්මක කොම්පෝස්ට් කම්හලක් ස්ථාපිත කිරීමට අමාත්‍යාංශ පියවර ගන්නා ලදී. මෙහිදී දිනකට කසළ ටොන් 450-500 ක් පමණ කාබනික් පොහොර බවට පරිවර්තනය වේ. කෙරවලපිටියේ නිෂ්පාදනය කරන ලද පළමු පොහොර බාණ්ඩය 2017 සැප්තැම්බර් මාසයේදී වෙළඳපොළට නිකුත් කරන ලදී.

මුළු ආදායම (2018) : රු.මිලියන 0.51



නීති අංශය

1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථා (ශ්‍රීලඉගොසංස) පනත හා එහි තදනන්තර සංශෝධනයන් මඟින් පවරා ඇති බලතල ප්‍රකාරව නීති අංශය ක්‍රියාත්මක වේ.

නීතිමය කාර්යයන්:

1. ඉඩම් සංවර්ධනය කිරීම් සහ නැවත පදිංචි කිරීම් සඳහා අදාළ නීති කෙටුම්පත් ලියවිලි සකස් කිරීම, අඩු ආදායම්ලාභී පවුල් පදිංචි ප්‍රදේශවල ජනතාව සඳහා ප්‍රජා උපදේශන හා නීතිමය ආධාර සැපයීම.

2. සංස්ථාව මගින් හා සංස්ථාවට විරුද්ධ නඩු හබ ආදියේදී අධිකරණයේදී සංස්ථාව වෙනුවෙන් පෙනී සිටීම හා ආරක්ෂා කිරීම.

3. සංස්ථාවේ එදිනෙදා කටයුතු සම්බන්ධයෙන් වූ සියලු කාරණා සම්බන්ධයෙන් උපදෙස් සැපයීම.

4. සියලු ආකාරයේ අනවසර ගොඩ කිරීම්වලට එරෙහිව, ජල අපවහන සැලසුම්වල සඳහන් කොන්දේසි කඩකරන්නන්ට එරෙහිව, ඇළ මාර්ග රක්ෂිතයන්හි අනවසර පදිංචිකරුවන් සහ 2006 අංක 35 දරණ ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථා පනත හා එහි සංශෝධනයන් මගින් ප්‍රකාශිත ප්‍රදේශයන්හි පිහිටි ඇළ මාර්ග දූෂණය කරන්නන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම සඳහා සංස්ථාව බලාත්මක වී ඇත.

5. සියලු අවබෝධතා ගිවිසුම් සැකසීම හා සහතික කිරීම, අළෙවි ගිවිසුම්, කොන්ත්‍රාත්/ උපදේශන ගිවිසුම්, දිගු කාලීන බදු දීම්, වාර්ෂික බදු දීම්, කෙටි කාලීන බදු දීම්, ඔප්පු පවරා දීම්, අදාළ නීතිමය ලියකියවිලි, විදේශ රැකියා පොරොන්දු පත්‍ර (වැටුප් සහිත/ රහිත), මෝටර් රථ ණය ගිවිසුම්, ඇටෝර්නි බලපත්‍ර සහ ඉඩම් නිරවුල් සහතික පත් සඳහා ඉඩම් හිමිකම් වාර්තාවන්හි අයිතිය.

6. සංශෝධන සහිත වර්තමාන පනත ප්‍රමාණවත් නොමැති බව පෙනී ගොස් ඇති බැවින් වර්තමාන පනත නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත සංශෝධනය කිරීම අවශ්‍යයෙන් කළ යුතුව ඇත. සංශෝධන සඳහා වන යෝජනාවලට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලැබී ඇත. අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රීලඉගොසංස පනත් කෙටුම්පත සකස් කර ඇති අතර එය මේ වනවිට නිරීක්ෂණ සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.

මානව සම්පත් සංවර්ධන අංශය

බඳවා ගැනීම සහ තෝරා ගැනීම

2018.01.01 සිට 2018.12.31 දක්වා සිදු කර ඇති බඳවාගැනීම් සංඛ්‍යාව	
සේවක වර්ගය	2018
ස්ථිර	51
කොන්ත්‍රාත් පදනම	17
පුහුණු EMT සහකාර	02
පැවරුම් පදනම	03
එකතුව	73
2018.12.31 දිනය මුළු සේවක සංඛ්‍යාව	
ස්ථිර	1393
කොන්ත්‍රාත් පදනම	39
එකතුව	1432

ISO තත්ත්ව කළමනාකරණ පද්ධතිය සහ සෞඛ්‍යය සහ ආරක්ෂාව

- **ISO 9001: 2015** තත්ත්ව කළමනාකරණ පද්ධතිය

  2020.04.05 දින දක්වා 2017.04.06 දින නිකුත් කර ඇති සහතික අංක QSC 05194 මඟින් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන කිරීමේ සංස්ථාව විසින් තත්ත්ව කළමනාකරණ පද්ධතිය ISO 9001: 2008 සිට ISO 9001: 2015 දක්වා පරිවර්තනය කරනු ලැබේ.

- **OHSAS 18001: 2007** වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය

  2014.06.24 දින සිට 2018.06.25 දින දක්වා නිකුත් කර ඇති සහතික අංක OHSAS 00701

- **ISO 14001:2015** ISO 14001: 2015 පාරිසරික කළමනාකරණ පද්ධතිය

  2019.06.24 දින සිට 25.06.2018 දින දක්වා නිකුත් කර ඇති සහතික අංක ESC 01553

ප්‍රවර්ධනය

වෘත්තීය හා සලකා බැලීමේදී උසස්වීමක් යනු ධූරාවලි ව්‍යුහයේ සේවකයාගේ ශ්‍රේණිය හෝ තනතුර උසස් වීමයි. උසස් වීම යනු වෙනස් සන්දර්භයන් තුළ භාවිතා වන යෙදුමකි, වඩාත් ජනප්‍රිය යෙදුම වන්නේ රැකියා උසස් වීම යන්නයි. කැපී පෙනෙන කාර්ය සාධනයක් ප්‍රදර්ශනය කර ඇති හෝ ඉහළ රැකියා වගකීමක් දැරීම සඳහා අවශ්‍ය සුදුසු කුසලතා සහ දැනුම දියුණු කර ඇති සේවකයෙකු සඳහා සාමාන්‍යයෙන් රැකියා උසස් වීමක් ප්‍රදානය කරනු ලැබේ. දෙවනුවට සඳහන් කර ඇති කාරණය යටතේ උසස් වීම සඳහා සුදුසුකම් ලැබීමට නම් අදාළ සේවකයා කිසියම් අවශ්‍ය කාල පරිච්ඡේදයක් සංස්ථාවේ සේවය කර තිබිය යුතු වේ, ඒ අනුව

ශ්‍රේණි උසස්වීම් - 114
තනතුරු උසස්වීම් - 07

පුහුණු සහ සංවර්ධන

සේවකයින් අතර තරගකාරී වාතාවරණය පවත්වා ගැනීම සඳහා සංස්ථාවේ සේවකයින් සඳහා පුහුණුව හා සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම අවශ්‍ය වේ. අපගේ සේවකයින්ගේ වර්තමාන රැකියා සඳහා සහ ඔවුන්ගේ අනාගත කාර්යභාරයන් හා වගකීම් සඳහා කුසලතා වර්ධනය කිරීම පිණිස දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා මානව සම්පත් සංවර්ධනය (HRD) අංශය අවධානය යොමු කර ඇත.

තවද, රු. 5,547,792.93/-ක පිරිවැයක් යටතේ දේශීය පුහුණු වැඩසටහන් 98 ක් පවත්වා සේවකයින් 1100 කට පමණ ප්‍රතිලාභ ලබා දී ඇති අතර රු. 9,796,493/-ක පිරිවැයකට විදේශ පුහුණු වැඩසටහන් 19ක් පවත්වා සේවකයින් 39 ක් සඳහා ප්‍රතිලාභ ලබා දී ඇත. ඒ අනුව 2018 වර්ෂය සඳහා පුහුණු සහ සංවර්ධන වෙනුවෙන් දරන ලද මුළු වියදම රු.මිලියන 15.75කි.

තවද, 2018 වර්ෂය සඳහා එක් තාක්ෂණික විධායකයෙකු සහ එක් තාක්ෂණික නොවන විධායකයෙකු සඳහා උසස් අධ්‍යාපන කටයුතු වෙනුවෙන් රු.මි. 408,537/- මූල්‍යාධාර ලබා දී ඇත.

මූල්‍ය සමාලෝචනය

මූල්‍ය කාර්ය සාධනය

අබණ්ඩව තුන්වන වතාවටත්, වත්මන් මූල්‍ය වර්ෂය තුළ ද, රුපියල් බිලියන හතකට වඩා වැඩි ආදායමක් වාර්තා කිරීමට සංස්ථාවට හැකි විය. කෙසේවෙතත්, 2017 වර්ෂය හා සසඳන විට ආදායම 3% කින් සුළු වශයෙන් පහත වැටී ඇත. මුහුදු වැලි විකිණීම, වේරැස් ගංගා ව්‍යාපෘතිය ඇතුළු භාණ්ඩාගාරයෙන් අරමුදල් සපයන ව්‍යාපෘතිවලින් ලැබෙන ආදායම සහ කෙරවලපිටියේ කොම්පෝස්ට් නිෂ්පාදන කර්මාන්තයෙන් ලැබෙන ආදායම ප්‍රධාන වශයෙන් මේ සඳහා දායකත්වය ලබා දී ඇත.





2017 වර්ෂය හා සැසඳීමේදී විට පොදු කාර්ය වියදම් 11% කින් ඉහළ ගොස් තිබේ. 2018 දෙසැම්බර් 31 දිනට, සම්පූර්ණයෙන්ම ක්ෂය වූ මෝටර් වාහන සහ පිරියත සහ යන්ත්‍රෝපකරණවල ඉතිරි ප්‍රයෝජ්‍ය ජීව කාලය නැවත අගය කරන ලදී. මෙම ක්‍රියාකාරකම සිදු කිරීමෙන්, මිලියන 162ක වැඩිපුර අගය ක්ෂය කිරීම 2018 ආදායම් ප්‍රකාශයට ප්‍රතිවර්ත කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2018 වර්ෂයේදී දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ සඳහා සැලකිය යුතු එකතු කිරීමක් සිදු කළද මුළු ක්ෂය වියදම පෙර වර්ෂයට සාපේක්ෂව අඩු වී ඇත.

පරිපාලන වියදම් වැඩිවීමට ප්‍රධාන හේතුව පෞද්ගලික පිරිවැය සහ සංස්ථාවේ කලින් සේවයේ යොදවා ඇති අනියම් ශ්‍රමිකයින් සඳහා EPF සහ ETF ගෙවීම සඳහා ලබා දී ඇති සහ ප්‍රතිපාදනය. මේ සම්බන්ධයෙන් ලබා දී ඇති ප්‍රතිපාදන රු. මිලියන 60.9 කි. පසුගිය වර්ෂයේ ණයගැතියන්ගෙන් හිඟව පැවති බොල් ණය සහ අවිනිශ්චිත ණය සඳහා ප්‍රතිපාදන සැලසීමේ ප්‍රතිඵලයක් ලෙස විකිණීම සහ ප්‍රවර්ධන වියදම් ඉහළ ගොස් ඇත.

තවද, පෙර වසරට සාපේක්ෂව සංස්ථාව විසින් පිළිවෙළින් 42% සහ 73% ක වර්ධන අනුපාතයන් සමඟ රු.මිලියන 541 ක පොලී ආදායමක් සහ රු.මිලියන 96 ක අනෙකුත් මෙහෙයුම් ආදායමක් වාර්තා කර ඇත. වර්ෂය අවසාන විනිමය අනුපාතයට ඇ.ඩො. ඉතිරිකිරීමේ තැන්පතු ප්‍රත්‍යාගණනය කිරීම හේතුවෙන් අනෙකුත් මෙහෙයුම් ආදායම වැඩි වී තිබේ.



මූල්‍ය තත්ත්වය

පසුගිය වර්ෂය අවසානයේ රු.බිලියන 14.7ක් වූ සංස්ථාවේ සමස්ත වත්කම් පදනම 2018 දෙසැම්බර් 31 වන විට රු.බිලියන 17.5 දක්වා ඉහළ ගොස් තිබේ. තවද, සංස්ථාවේ ශුද්ධ වටිනාකම 2018 දෙසැම්බර් 31 වන විට රු.බිලියන 5.8 ක් විය.

සමූහයේ කාර්ය සාධනය

2018 වර්ෂයේදී සංස්ථාවේ අනුබද්ධ සමාගම් දෙකම ලාභ වාර්තා කර ඇත. ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම රු.මිලියන 2 ක ශුද්ධ ලාභයක් වාර්තා කර ඇති අතර LRDC සර්විසස් (පෞද්.) සමාගම රු.මිලියන 40 ක ශුද්ධ ලාභය වාර්තා කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

2018 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ වාර්තාව හා සංස්ථාවේ ගිණුම් සතුටින් ඉදිරිපත් කරයි.

ප්‍රධාන කාර්යයන්

සංස්ථාවේ ප්‍රධාන කාර්යයන්, මෙහෙයුම් සමාලෝචනයේ (පිටු අංක 7 සිට 74 දක්වා) සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක1 හි විස්තර කර ඇත.

වර්ෂය පිළිබඳ මෙහෙයුම් සමාලෝචනය

වර්ෂය තුළ සංස්ථාවේ කටයුතු සම්බන්ධයෙන් සවිස්තරාත්මක සමාලෝචනයක් මේ යටතේ දක්වා ඇත.

පිරිවැටුම

2018 වර්ෂය තුළ සංස්ථාවේ පිරිවැටුම රුපියල් මිලියන 7,097කි. (2017: රු.මිලියන 7,342කි)

ලාභය

2017 වර්ෂයේ ලාභය වන රුපියල් මිලියන 1,118 හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ ලාභය රුපියල් මිලියන 1,150කි.

කටයුතුවල තත්ත්වය

සංස්ථාවේ කටයුතුවල තත්ත්වය මූල්‍ය තත්ත්ව වාර්තාවේ පෙන්නුම් කර ඇති පරිදි වේ. (පිටුව 98)

දේපළ, පිරියත හා යන්ත්‍රෝපකරණ

වර්ෂය තුළ දේපළ, පිරියත හා උපකරණ පිළබඳ සිදු වූ සංසරණය ගිණුම් හා සම්බන්ධ සටහන් අංක 9හි දක්වා ඇත.

බදුකරණය

2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනත සහ එකී පනතෙහි තදනන්තර සංශෝධන ප්‍රකාර බදු ගෙවීම් සඳහා කරන ගැළපුම් අනුව වර්ෂයේ ලාභය පදනම් කර ගෙන ආදායම් බදු ගෙවීම සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ.

කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව

මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 22 හි අනාවරණය කර ඇති පරිදි හැර සංස්ථාවේ පවතින හෝ යෝජිත කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ට සෘජු හෝ වක්‍ර බැඳියාවක් නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

සෑම මසකම අවම වශයෙන් එක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පවත්වනු ලැබේ. 2018 වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 19ක් පවත්වා ඇත. එක් එක් අධ්‍යක්ෂවරයාගේ සහභාගී වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව පහත පරිදි වේ.

අධ්‍යක්ෂවරයාගේ නම්	පත්වීමේ දිනය	සහභාගී වීම සඳහා සුදුසුකම් ලැබූ රැස්වීම් සංඛ්‍යාව	සහභාගී වූ රැස්වීම් සංඛ්‍යාව
ඩබ්ලිව්.එම්.ඒ.එස්. ඉද්දවෙල මයා	28.10.2015	3	3
රොෂාන් ගුණවර්ධන මයා	30.10.2015 01.03.2018 සභාපතිවරයා ලෙස	19	19
පී.ඒ.කේ ගුණවර්ධන මයා	05.03.2018	16	13
ජේ.සී. වැලිගමගේ මිය	02.04.2015 03.05.2018 (නැවත පත්කළ)	19	16
ඉංජි.එස්. මොහාන්රාජා මයා	02.11.2017	19	10
ආචාර්ය ජගත් මුණසිංහ මයා	30.03.2016	19	15
එස්.සී. දිද්දෙණිය මයා	28.10.2015	19	18
එස්.එල්. රණවීර මයා	02.12.2015	12	11
ඉංජි. ඩී.සජ්ජන ද සිල්වා මයා	17.01.2017	19	16
රවී ජයවර්ධන මයා	22.06.2018	09	05
ඉංජි.ජී.එම්.බී.ඩී. බෝගම්මන මයා	16.08.2018	05	04

අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් ලෙසින් ඉදිරියටත් පැවතීමේ හැකියාව සංස්ථාව සතු වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සිය විශ්වාසය පළ කර සිටී.

ව්‍යවස්ථාපිත ගෙවීම්

ඔවුන්ගේ දැනුවත් වීම සහ විශ්වාසය අනුව රජය සහ සේවකයින් සම්බන්ධයෙන් සිදු කළ සියලු විමධ්‍යගත ගෙවීම් නියමිත කලට වේලාවට සිදු කළ බවට අධ්‍යක්ෂවරුන් සෑහීමට පත් වේ.

සේවක මණ්ඩලය

2018 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනට පුද්ගලයින් 1,432 දෙනෙකු සංස්ථාවේ සේවයේ නියුතුව ඇත. (2017: 1448)

ශේෂ පත්‍රයේ දිනයට පසු සිදුවීම්

ශේෂ පත්‍රයේ දිනට පසු සිදු වී ඇති වැදගත් සිදුවීම් සැලකිල්ලට ගෙන ඇති අතර අවශ්‍ය අවස්ථාවලදී ගිණුම්වල ගැළපීම් සිදු කර ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

අත්සන් කළේ

එච්.කේ.කේ.ඩබ්. ඒකනායක
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2019 අප්‍රේල් මස 04 වැනි දින

අති විශේෂිත අයිතමයන්

වෙනම අනාවරණය කළ යුතු අසාමාන්‍ය/අති විශේෂිත ස්වභාවයේ ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ සටහන් මඟින් වාර්තා කර ඇත.

විගණකවරු

2018 වර්ෂය සඳහා සංස්ථාවේ ගිණුම් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කරනු ලබනවා ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HUD/C/SLLRDC/1/18/18 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2019 ඔක්තෝබර් 29 දින

සභාපති

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ හා එහි පරිපාලිත සමාගම්වල 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ හා එහි පරිපාලිත සමාගම්වල 2018 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ඒකාබද්ධ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබේවි.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ සහ සමූහයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 1 අනුව මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වත්කම්, වගකීම්, ආදායම්, වියදම් සාධාරණ අගය (Fair Value) මත ඉදිරිපත් කල යුතු වුවද සංස්ථාව විසින් පිරිවැය රු.මිලියන 2,671.81 ක දේපල පිරියක උපකරණ වල සාධාරණ අගය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ආ) සංස්ථාවේ වත්කම්වල ඵලදායී ජීවිත කාලය නැවත තක්සේරු කිරීමේ ක මිටුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට තවදුරටත් ප්‍රයෝජනයට ගත නොහැකි බව හඳුනාගත් රු.මිලියන10.79 ක් පිරිවැය වූ යන්ත්‍ර උපකරණ හා මෝටර් රථ ශ්‍රී ලංකා මුල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 05 ට පටහැනිව තවදුරටත් ජංගම නොවන වත්කම් ලෙස මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 40 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් පිරිවැය රු.මිලියන 92.48 ක ආයෝජන දේපලක සාධාරණ අගය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. එමෙන්ම සංස්ථාව කුලී පදනම මත බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබුණු ඉඩම්, ආයෝජිත දේපළ ලෙස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබූ අතර එම ඉඩම්වල වටිනාකම පිළිබඳ කොරතුරුද විගණනයට පැහැදිලි නොකෙරුණි.

(ඈ) සංස්ථාවේ තොග පොත් යාවත්කාලීනව පත්වාගෙනයාමට කටයුතු කර නොතිබුණු අතර මේ හේතුවෙන් ඉකුත් වර්ෂය අවසානයට රු. මිලියන 267.32 ක් ව පැවති සෙමින් සංචලනය වන තොගයේ (Slow Moving Stock) සමාලෝචිත වර්ෂය අවසානයට වූ තත්‍ය ශේෂය හා එහි විචලනයන් විගණනයේදී හඳුනාගත නොහැකි විය.

(ඉ) වත්තල මා බෝල නගර සභාව විසින් කෙරවලපිටිය කසළ කළමනාකරණ අංගනය වෙත බැහැර කරන ලද කසල වෙනුවෙන් මුදල් අය නොකිරීමට සංස්ථාව ගෙන තිබුණු තීරණයට අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ආයතනයෙන් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති මුදල රු.මිලියන 13.04 ක් හා ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අඩමාන ණය වෙන් කිරීම රු.මිලියන 6.69 ක් ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී කෙරවල පිටිය කසළ කළමනාකරණ අංගනය වෙත කසළ බැහැර කරනු ලබන පාරිසරික සේවා ආයතනයක් විසින් රු.100,000 ක ආපසු ගෙවනු ලබන තැන්පතුවක් සංස්ථාවට ලබාදී තිබුණද එම තැන්පතුව මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(උ) සංස්ථාව විසින් පිරිවැය රු.මිලියන 587.49 ක් වූ සහ ලියාහල අගය රු. 304 ක් වූ වර්ග කීපයකට අයත් වත්කම්වල ඵලදායී ජීවිත කාලය සමාලෝචිත වර්ෂයේදී නැවත තක්සේරු කර තිබුණි. එලෙස ඵලදායී ජීවිත කාලය නැවත තක්සේරු කරන ලද වත්කම්වලට අදාළ සමුච්චිත ක්ෂය වෙන් කිරීමේ ගිණුමේ ශේෂයන් රු. මිලියන 160.34 ක් රදවාගත් ලාභයට ගැලපීම් නොකර සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදමෙන් අඩු කර දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින්ම අධිගණනය වී තිබුණි. එමෙන්ම වත්කම්වල ඵලදායී ජීවිත කාලය

නැවත තක්සේරු කිරීම හාහිර විශේෂඥ දැනුම ඇති පාර්ශවයන් සම්බන්ධ කර ගැනීමකින් තොරව සංස්ථාවේ නිලධාරීන් තිදෙනෙකු විසින් සිදුකර තිබූ බැවින් අදාල තක්සේරු කිරීම්වල නිවැරදිතාවය පිළිබඳ විගණනයේදී ප්‍රශ්නකාරී විය.

(උ) පිරිවැය රු. මිලියන 1.30 ක් වූ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයෙහි පැවති ආපනශාලාව වසර 9 කට පෙර කඩා ඉවත් කර ඇතත් එම වටිනාකම ගිණුම්වලින් ඉවත් නොකර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලද දක්වා තිබුණි.

(එ) ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2.5.1 (ඉ) පරිදි සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ කොන්ත්‍රාත් ආදායම කොන්ත්‍රාත්වල කාර්ය සාධනය මත හඳුනාගන්නා බව දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයට කොන්ත්‍රාත් 21 ක කළ වැඩ, ඉංජිනේරුවරයකුගේ සහතික කිරීමකින් තොරව ඉදිරිපත් කළ බිල්පත්වල කළ වැඩ වටිනාකම පදනම් කරගෙන කොන්ත්‍රාත් ආදායම ලෙස රු.මිලියන 951.05 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙම අගය මුළු කොන්ත්‍රාත් ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට 75 ක් විය.

(ඒ) දැදුරුඔය ජලාශයේ ජලය පවිත්‍රකිරීමේ කොන්ත්‍රාත්තුට අදාළව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සහනික කරන ලද වැඩ වටිනාකම රු.මිලියන 26.41 ක් වුවද, එම වටිනකාම රු.මිලියන 27.96 ක ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් කොන්ත්‍රාත් ආදායම රු.මිලියන 1.55 කින් අධිගණනය වී තිබුණි.

(ඔ) කෙරවලපිටිය කසළ අංගනය ඉදිකිරීම සඳහා ජනාධිපති අරමුදලින් සංස්ථාවට ලැබුණු රු. මිලියන 123.84 ක ප්‍රදාන මූල්‍ය ප්‍රකාශනවල විලම්භිත ආදායම් යටතේ (Differed Income) දක්වනු වෙනුවට එම වටිනාකම අත්තිකාරම් යටතේ දක්වා තිබුණි

(ඕ) සංස්ථාව සතු ඔරුගොඩවත්ත, ප්‍රදේශයේ පිහිටි ඉඩම් කැබලි 05 ක් වාර්ෂික බදු කුලී පදනම මත බදු දී තිබුණද, ඒ සඳහා බදු ගැනුම්කරුවන් සමඟ 2012 වර්ෂයේ සිට බදු ගිවිසුම් අත්සන් කර නොතිබුණි. එමෙන්ම 2018 මැයි 15 දින ඉඩම් කැබලි 05 හි නව බදු කුලී වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා දී තිබුණු බැවින් 2017 පෙබරවාරි 24 දින සිට නව තක්සේරුව මත බදු කුලී අයකර ගත යුතුව තිබුණි. එම මුදල් අයකර ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණු අතර ලැබිය යුතු ආදායම ගිණුම්ගත කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ක) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාව ඉටුකළ මහා භාණ්ඩාගාර ව්‍යාපෘති 64 ක් වෙනුවෙන් දරන ලද වියදම් රු. මිලියන 1,559.62 ක් වුවද, උපලේඛණ අනුව එම වටිනාකම රු. මිලියන 1,432.55 ක් වූයෙන් ඒ අතර රු. මිලියන 127.07 ක වෙනසක් නිරීක්ෂණය විය. එසේම සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු දිගු කාලීන ණය ලෙස මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 118.75 ක් දක්වා

නිබුණද ලෙජර් ගිණුම් අනුව එම ශේෂය රු. මිලියන 121.97 ක් වීමෙන් ඒ අතර රු. මිලියන 3.22 ක වෙනසක් විය.

(ච) සංස්ථාව විසින් 2012 වර්ෂයේ සිට භාවිතයට ගනු ලබන එක්ස්කැවේටර් යන්ත්‍රයක සහ බෝට්ටු 02 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර 2010 වර්ෂයේදී සංස්ථාව සතු ට්‍රැක්ටර් වේලර 04 ක්, බවුසර් රථ ලෙස නවීකරණය කළද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඡ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් වැඩ අවසන් කරන ලද කුරුණෑගල ජල සම්පාදන ව්‍යාපෘතියේ ලැබිය යුතු සියලුම මුදල් සේවාදායකයාගෙන් අය වී නිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයට එම ව්‍යාපෘතියෙන් තවදුරටත් අයවිය යුතු මුදලක් ලෙස රු. මිලියන 1.54 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ණය ගැති වටිනාකම එම ප්‍රමාණයෙන් අධිඟණය වී තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාර්ත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහඟරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මහහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව නිගමනය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (ඉ) නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව **පහත සඳහන් නිරීක්ෂණ** හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/ විධානයට යොමුව	විස්තරය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ)	• චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 67 කදී රු.100,000 ඉක්මවා රු.14,297,500 ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබුණි. එසේම මූල්‍ය සීමාවන් ඉක්මවා ගෙවීම් කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගන්නා බවට ඉකුත් වර්ෂයේදී දන්වා තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එවැනි අනුමැතියක් ලබාගෙන නොතිබුණි.
	• තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදිය යුත්තේ කිසියම් විශේෂිත කාර්යයක් සඳහා වුවද, සංස්ථාවේ සාමාන්‍ය කටයුතු වන ඉදිකිරීම් සහ ප්‍රසම්පාදන ක්‍රියාපරිපාටිය අනුගමනය කරමින් සිදුකළ යුතු කාර්යයන් සඳහා ද සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 57 ක දී රු.12,731,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබුණි.

(ii) සංශෝධිත මුදල් රෙගුලාසි 371(5)	සමාලෝචිත වර්ෂයේ ලබාදුන් තත්කාර්ය අතුරු අග්‍රිමවලින් වියදම් නොවී ඉතිරිව පැවති අග්‍රිම 03 කට අදාල රු.270,000 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි. තවද අදාල කාර්යය අවසන් වී දින 10 ක් ඇතුළත එම අතුරු අග්‍රිම පියවිය යුතු වුවද නියැදි විගණන පරීක්ෂාවට ලක්වූ අවස්ථා 26 කදී රු.5,749,000 ක අතුරු අග්‍රිම පියවීම සඳහා දින 31 සිට දින 94 ක් දක්වා කාලයක් ගතකර තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය තුළ ලබාදී තිබූ අග්‍රිම 14 කට අදාල රු.776,000 ක් නියමිත කාර්යය සඳහා වැය නොකර දින 01 සිට දින 59 ක් දක්වා වූ කාලයක් නිලධාරියා ලහ තබාගෙන මුළු මුදලම නැවත බැංකු ගතකර තිබුණි.
(ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය	පොදු ආකෘති 287 අනුව අධිකාරිය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.
(ඇ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 (බී) වගන්තිය	මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් ස්ථාවර හා කෙටිකාලීන තැන්පත්වල රු.මිලියන 3,737.85 ක් ආයෝජනය කර තිබුණි.
(ඇ) 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරිය(සංශෝධන) පනතේ 8 ඒ වගන්තිය	අදාළ පළාත් පාලන ආයතනය වෙතින් අනුමැතිය ලබාගැනීමකින් තොරව සංස්ථාව විසින් නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිලි සංකීර්ණය ඉදිකර තිබුණි. මෙම නිසා ඉදිරි වර්ෂ වලදී අනුමැතිය ලබාගැනීම වෙනුවෙන් රු.මිලියන 12.04 ක පමණ බැරකමක් උද්ගතව තිබුණි.

(ඉ)	1995 ජූලි 12 දිනැති අංක එස්ථි1/එ/4/34 දරන රජයේ ඉඩම් අන්සතු කිරීමේ මාර්ගෝපදේශය	(i) චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව සංස්ථාව ඉඩම් කල්බදු දීමේදී රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරු කරන ලද කල්බදු වටිනාකම, විශේෂ කමිටුවක් මගින් නැවත ඇගයීමට ලක්කර නොතිබුණි. (ii) එමෙන්ම සංස්ථාව විසින් 2007 වර්ෂයේදී නිවාස ව්‍යාපෘතියක් ඉදිකිරීම වෙනුවෙන් සංස්ථාව සතු ඉඩමක් විකුණුම් ගිවිසුමක් මත පෞද්ගලික සමාගමකට ලබාදී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සමාගම එම නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. එසේ වුවත් එම ඉඩම නැවත සංස්ථාවට අත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඊ)	2003 ජූනි 02 දිනැති අංක පිරිඩි/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7 වගන්තිය	භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් සමාලෝචිත වර්ෂයේදී කාර්ය මණ්ඩලය වෙත රු.මිලියන 41.10 ක් දීමනා ගෙවා තිබුණි.
(උ)	2015 මැයි 25 දිනැති අංක පිරිඩි1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ	චක්‍රලේඛයේ සඳහන් අනුමත ඉන්ධන සීමාව ඉක්මවා සහ අදාල අනුමැතීන් ලබා ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ නිලධාරීන් 12දෙනෙකු වෙනුවෙන් රු. 1,173,051 ක් වටිනා ඉන්ධන ලීටර 9,537 ක් වැඩිපුර ලබා දී තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව **පහත සඳහන් නිරීක්ෂණය** හැර සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

  - සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව රු. මිලියන 1,533 ක ස්ථාවර තැන්පත් නැවත ආයෝජනය කිරීම සඳහා නිදහස් කර තිබුණද ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව **පහත සඳහන් නිරීක්ෂණ** හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

  (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව ඉදිරි වර්ෂ 03 කට අදාල (2017-2020) ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ඇතුලත් වන පරිදි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සංස්ථාව විසින් පිළියෙල කර නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක්ද පිළියෙල නොකර උප ක්‍රියාකාරකම්වලට අදාල සැලැස්මක් පිළියෙල කර තිබුණි. එම ක්‍රියාකාරකම්වලට අදාල ඇස්තමේන්තුගත වටිනාකම් හා එම වටිනාකම්වලට අදාලව පත්කල යුතු ප්‍රසම්පාදන කමිටුව කුමක්ද යන්න හා ප්‍රසම්පාදනයන්ට අදාල නිවැරදි කාල රාමුවක් සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. තවද රජයේ ප්‍රදාන සඳහා පමණක් එම සැලැස්ම සකස්කර තිබූ අතර සංස්ථාවේ ව්‍යාපෘති හා සේවාදායක ව්‍යාපෘතිවලට අදාළ ප්‍රසම්පාදන කටයුතු එහි ඇතුළත් කර නොතිබුණි.

  (ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්ති අනුව, කොන්ත්‍රාත්කරුට ප්‍රතිග්‍රහණ ලිපිය නිකුත් කළ විගස පාර්ශවකරුවන් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් රු.මිලියන 19.52 ක් වටිනා කොන්ත්‍රාත් 03 ක් පිරිනැමීමෙදී එලෙස ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

  (ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 වගන්තිය අනුව වෙළඳපල මිල සැදුම් ක්‍රමය යටතේ (Shopping) භාණ්ඩ මිලදී ගැනීමේදී අවම වශයෙන් ලංසු මිල ගණන් 03 ක් ඇගයීමට ලක් කර මිලදී ගැනීම සිදු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ සංස්ථාව සිදු කළ රු. මිලියන 11.09 ක් වටිනා ප්‍රසම්පාදන 06 ක් මෙම අවශ්‍යතාවයට පටහැනිව එක් ලංසුවක් පමණක් ඇගයීමට ලක් කර මිලට ගෙන තිබුණි.

  (ඈ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව ඔලියමුල්ල පොම්පාගාරය වෙනුවෙන් රු. මිලියන 82.90 ක් වටිනා ජල පොම්ප 02 ක් මිලදී ගෙන සවිකිරීමට කටයුතු කර තිබුණද, එම සැපයුම්කරුට සේවා මධ්‍යස්ථානයක් නොමැති බැවින් පොම්පවල නඩත්තු කටයුතු කිරීමේ අවධානමක් ඇති වී තිබුණි. ලංසු ලියවිලි අනුව ලංසු කැඳවීමේදී සේවා මධ්‍යස්ථානයක අවශ්‍යතාව සඳහන් කර තිබියදීත් ඒ බව නොසලකා මිලට ගැනීම් සිදුකර තිබීම ප්‍රශ්නකාරී තත්ත්වයක් විය.

(ඉ) සංස්ථාවේ සියළුම ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වෙනම සැපයුම් අංශයක් ස්ථාපිත කර තිබියදී එම අංශයේ අනුදැනුම්කින් තොරව සමාලෝචිත වර්ෂයේ වේරස් ගග වැසි ජලය අපවහනය හා පරිසර වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 523.5 ක් වටිනා ප්‍රසම්පාදන් 19 ක් සිදුකර තිබුණි.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) සංස්ථාව විසින් 2018 - 2022 වර්ෂ 05 ක කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණු නමුත් සංස්ථා පනත මඟින් පැවරී ඇති ප්‍රධාන කාර්යයන් වන දිවයින පුරා පිහිටි පහත් වහුරු බිම්, නිසරු හෝ මඩ ඉඩම් හඳුනාගෙන අනවසර ඉඩම් ගොඩකිරීම පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම, ඇල ඉවුරක ඇති යම් ඉඩම් ප්‍රදේශයක්, ඇල රක්ෂිත ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන එම රක්ෂිත ප්‍රදේශය තුල තාවකාලික හෝ වෙනත් ඉදිකිරීම් වැළකෙන පරිදි ගැසට් නිවේදන මඟින් ප්‍රසිද්ධ කිරීම එම සංයුක්ත සැලැස්ම ඇතුළත් කර නොනිබුණි.

(ආ) අංක 16/0204/724/014 හා 2016/01/22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ඇළ මාර්ග හරහා මගී ප්‍රවාහන ජාලයක් හදුන්වා දීමටත් බෝට්ටු භාවිතා කරමින් විනෝදාස්වාදය ලබා දීමට සහ පාවෙන වෙළඳ පළවල් ඉදි කිරීම සඳහා අවසර ලබා දී තිබුණි. එසේ වුවත් සමාලෝචිත වර්ෂය අවසානවන විට සංස්ථාව මහා භාණ්ඩාගාර මුදල් භාවිතා කරමින් ඡැටි 03 ක් පමණක් ඉදිකර තිබුණු නමුත් 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මගී ප්‍රවාහන සේවාවක් ආරම්භ කිරීම සංස්ථාව අපොහොසත් වී තිබුණි.

(ඇ) 1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ 2(ආ) 1 වගන්තිය අනුව සංස්ථාව විසින් 1995 වර්ෂයේදී සංවර්ධන කටයුතු සඳහා පවරාගත් මුතුරාජවෙල හා මුදුන් ඇල ප්‍රදේශවල ඉඩම් අක්කර 800ක ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 23 ක කාලයක් ගතව තිබුණද දියුණු කළ ඉඩම් ප්‍රමාණය අක්කර 522 ක් එනම්, සියයට 65 ක් පමණක් විය. එසේම 1996 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව මහ කොළඹ ගංවතුර පාලනය සහ පාරිසරික වැඩිදියුණු කිරීම ව්‍යාපෘතිය මෙහෙයවීම යටතේ පාර්ලිමේන්තු සංකීර්ණයට බටහිර මායිමේ පිහිටි අක්කර 1000 ක පමණ වූ පහත් බිම් ප්‍රදේශ ජල රැඳවුම් ප්‍රදේශ ලෙස ආරක්ෂා කර ගැනීමට සහ පාලනය කිරීමට සංස්ථාවට පවරා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් ඉඩම් අක්කර 76 ක් පමණ අනවසර පදිංචි කරුවන් විසින් අත්කරගෙන තිබීම හා තවත් අක්කර 81 ක් සංස්ථාව විසින් අවසතු කරනය (Divesting) කර තිබීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩලය විසින් සංස්ථාවෙන් අපේක්ෂා කරන ලද කාර්යය ඉටුකිරීමට සංස්ථාව අපොහොසත්ව තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 කට අදාලව ජල රැඳවුම් ප්‍රදේශ තුල සිදුකර ඇති අනවසර ඉදිකිරීම් සහ ගොඩකිරීම් 1321 ක් හඳුනාගෙන තිබුණද එම හඳුනාගත් ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) වර්තමානයේ සිදුවන අනවසර ඉඩම් ගොඩකිරීම් වලක්වාලීමට සංස්ථා පනතේ පවතින විධිවිධාන ප්‍රමාණවත් නොවන බැවින් එම වගන්ති නිවැරදි කර පනත සංශෝධනය සඳහා 2012 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පනත සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම පනතේ පවතින මෙවැනි අඩුපාඩු මත අනවසර ඉඩම් ගොඩකිරීම් සම්බන්ධව සංස්ථාවට ලැබෙන පැමිණිලි වෙනුවෙන් ප්‍රමාණවත් පියවරයන් ගෙනද නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් වෙළඳපලේ පැවති රු. මිලියන 801 ක් වටිනා ඉදිකිරීම් කොන්ත්‍රාත් 06 ක් සඳහා පමණක් තරගකාරී ලෙස ලංසු ඉදිරිපත් කර තිබුණු අතර ඉන් රු. මිලියන 296 ක කොන්ත්‍රාත්තු 03 ක් පමණක් ලබාගෙන තිබුණි. මෙම තත්ත්වය අනුව සංස්ථාව විසින් වෙළඳපලේ පවතින තරගකාරී කොන්ත්‍රාත් ලබා ගැනීමට ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොමැති බවත් මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ලැබෙන කොන්ත්‍රාත් කටයුතු පමණක් ඉටු කිරීම තුළින් සංස්ථාවට ලබා ගත හැකිව තිබූ වෙළඳපල කොටස අහිමි වී ඇති බවත් නිරීක්ෂණය විය.

(උ) සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවට ලද වැඩ පුර්ව අග්‍රිම ආරම්භ මුදල් රු.මිලියන413.80 ක් වූ අතර ඉන් වසර 4 ත් 5 ත් අතර ශේෂය රු. මිලියන 55.9 ක්ද වසර 2 – 3 ත් අතර ශේෂය රු. මිලියන 55.7 ක් විය.

(ඌ) සංස්ථාවේ කෙරවලපිටිය කසළ කළමනාකරණ අංගනය වෙත ආයතන 25 ක් විසින් බැහැර කරන ලද කසළ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අයවිය යුතුව පැවැති මුදල් රු.මිලියන 301.12 ක් වූ අතර මෙයින් රු.මිලියන 110.00 ක් වර්ෂ එකට අඩු සහ රු.මිලියන 191.06 ක් වර්ෂ එකත් දෙකක් අතර කාලයක සිට හිඟව පැවතුණි. සංස්ථාව විසින් අදාළ ආයතන සමඟ කසළ බැහැර කිරීමට අදාළ කොන්දේසි ඇතුළත් ගිවිසුම්වලට එළඹීමට කටයුතු කර නොතිබීම මෙම තත්ත්වයට හේතු වී බලපා තිබුණි.

(එ) වෝටර්ස් ඒජ් ආයතනයට සංස්ථාව ලබා දී තිබූ දුම්රිය ආපනශාලාව සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවට අයවිය යුතු රු. මිලියන 88.42 ක් සහ එයට අදාළ පොළිය රු. මිලියන 14.50 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ලැබී නොතිබුණි. එමෙන්ම මෙම ගණුදෙනුවට අදාළ දෙපාර්ශවය අතර ගිවිසුමක් ඇතිකර ගෙන නොතිබුණි. තවද මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් මහා භාණ්ඩාගාර

මුදලින් වැය කරන ලද රු. මිලියන 37.02 ක් අය කර ගැනීමටද සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(ඒ) සංස්ථා පනතේ විධි විධාන ප්‍රකාරව සංස්ථාවට වෙනත් පාර්ශවයකට ණය ලබා දීමට නොහැකි වුවද සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදී සිය පරිපාලිත සමාගම වෙත මුහුදු වැලි පැකට් කර විකිණීමේ ව්‍යාපෘතියක් වෙනුවෙන් රු. මිලියන 200 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී ඉන් රු. මිලියන 118.75 ක ණය මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලබා දී තිබුණු අතර මේ සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹ තිබුණේ 2019 අප්‍රේල් 04 දින විය. එමෙන්ම මෙම ණය මුදල නැවත ගෙවීමට සමාගමට ඇති හැකියාව පිළිබඳවද සංස්ථාව ඇගයීමටක ලක් කර නොතිබුණි. තවද මෙම තත්ත්වය 2003 ජුනි 02 දිනැති පී‍ඊඩී 12 දරණ යහපාලන පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 8.1.4 වගන්තියටද පටහැනි විය.

(ඔ) සංස්ථාව සතු ඉඩමක්, සාවද්‍ය ලෙස හා කරුණු වරදවා දක්වා 2000 අප්‍රේල් 06 දින බාහිර ගැණුම්කරුවකු වෙත රු. මිලියන 5.83 කට විකිණීම හේතුවෙන්, එම ගැණුම්කරු විසින් අධිකරණයේ නඩු පවරා තිබු අතර නඩුවේ තීන්දුව අනුව සමාලෝචිත වර්ෂයේදී එම ගැණුම්කරුවෙත රු.මිලියන 12.28 ක් ගෙවීමට සංස්ථාවට සිදුව තිබුණි. තවද මෙම කරුණුවලට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(ඕ) ශ්‍රී ජයවර්ධනපුර අභය භූමිය තුළ පිහිටි දියසරු උද්‍යානයෙහි යෝජිත ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු සඳහා අදාළ ආයතනවලින් පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව සංස්ථාව ඉදිකිරීම් කටයුතු ඇරඹීම හේතුවෙන් එම ඉදිකිරීම් නවතා දමන ලෙස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සංස්ථාවට දන්වා තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 3.48 ක් වැයකර සිදුකළ සංවර්ධන කටයුතු නවතා දමා තිබුණු අතර එම කටයුතු 2019 අගෝස්තු වන විටත් නැවත ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි.

(ක) මුහුදු වැලි ගොඩ දැමීම වෙනුවෙන් 2011 වර්ෂයේ සිට විදේශීය සමාගමක් වෙත සංස්ථාව විසින් ගෙවිය යුතුව තිබූ යුරෝ 575,000 ක් සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර වර්ෂය අවසානයට වූ විනිමය අනුපාතවල අවාසිදායක විචලනය හේතුවෙන් ගෙවිය යුතු මුදල රු. මිලියන 120.17 ක් දක්වා වර්ධනය වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 15.24 ක විනිමය අලාභයක් සංස්ථාවට සිදුව තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව නැවත මුහුදු වැලි ලබා ගැනීමට මෙම සමාගම තෝරාගත්තද මෙලෙස රදවාගත් මුදල නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ච) මුහුදු වැලි ගොඩ දැමීමේ ව්‍යාපෘතියේ ගෙවීම් කටයුතු සඳහා සංස්ථාව විසින් 2010 වර්ෂයේ ලංකා බැංකු රාජගිරිය ශාඛාවේ ආරම්භ කරන ලද එක්සත් ජනපද ඩොලර් ගිණුම 2012 පෙබරවාරි දක්වා ගණුදෙනු සඳහා භාවිතා කර ඉන් අනතුරුව එය අක්‍රිය ගිණුමක් ලෙස පවත්වාගෙන ගොස් තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ගිණුමේ ශේෂය එ.ජ. ඩොලර් මිලියන 2.05 ක් හෙවත් රු. මිලියන 375.51 ක් විය. නමුත් සමාලෝචිත වර්ෂයේ මුහුදු වැලි නැවත ගොඩ දැමීමේදි විදේශ සමාගම වෙත ගෙවීම් කිරීමේදි මෙම ගිණුම භාවිතයට නොගෙන ශ්‍රීලංකා රුපියල් ඩොලර්වලට පරිවර්ථනය කර ගෙවීම විගණනයේදි ප්‍රශ්නකාරී විය. තවද මෙම හේතුවෙන් සංස්ථාවට විනිමය අලාභයක් සහ අතිරේක බැංකු ගාස්තු ගෙවීමට සිදුවන බවද නිරීක්ෂණය විය.

(ට) සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ යන්ත්‍රෝපකරණ අංශයේ අලාභය රු. මිලියන 97 ක් වූ අතර එහි වාර්ෂික පිරිවැය වූ රු. මිලියන 568 තුළ රු. මිලියන 373 ක ශ්‍රම පිරිවැයක් ඇතුළත්ව තිබුණු අතර මුළු පිරිවැයෙන් ප්‍රතිශතයක් ලෙස එම අගය සියයට 66 ක් විය. යන්ත්‍රෝපකරණ අංශයේ අතිරික්ත සේවක පිරිසක් සිටීම මෙම තත්ත්වයට සෘජුව බලපා තිබුණි.

(ත) මුහුදු වැලි කියුබික් මීටර් මිලියන 4 ක් ඇමරිකානු ඩොලර් මිලියන 19.97 කට ලබා ගැනීමට විදේශ සමාගමක් සමඟ සංස්ථාව 2018 අප්‍රේල් 10 දින ගිවිසුම් ගතව තිබුණු අතර එයට අදාළ අවබෝධතා ගිවිසුම අනුව 2019 ජුනි 30 වන විට වැලි කියුබික් මීටර් මිලියන 4 ක් ගොඩදැමීමට එකඟ වී තිබුණි. නමුත් එදිනට සංස්ථාවට වැලි සන මීටර් 2,120,480 පමණක් ලැබී තිබුණු අතර ගිවිසුම අනුව එකඟ වූ කාලය තුළ සමාගම වැලි සැපයීමට කටයුතු නොකර තිබුණු අතර ඒ වෙනුවෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීම්ට අදාළ කොන්දේසි ඉටුසුමේඟ් ඇතුළත් කර නොතිබුණි. එමේන්ම තවදුරටත් ලබාගත යුතු වැලි කියුබ් මීටර් මිලියන 1.88 ක් ලබා ගැනීමට සංශෝධිත කාල රාමුවක් නොවුණි.

(ප) 2019 වර්ෂය තුළ සංස්ථාවේ මුහුදු වැලි අලෙවියෙහි මාසික සමාන්‍ය අගය කියුබ් 8000 ක් වූ බැවින් මේ වෙනුවෙන් ලබා ගත් බැංකු ණය රු. මිලියන 200 ක මාසික ණය වාරිකය වන රු.මිලියන 66.67 ක් සහ එයට අදාළ පොළිය ගෙවීමටද සංස්ථාවට ගැටළු මතුවී තිබුණි. සංස්ථාව අපේක්ෂා කළ ගැණුම්කරුවන් සොයා ගැනීමට නොහැකිවීම මෙම තත්ත්තවයට සෘජුව බලපා තිබුණි.

(ය) පිරිවැය රු. මිලියන 51.10 ක් වූ සංස්ථාව භාරගත් උපදේශන සේවා කොන්ත්‍රාත් 7 ක සමාලෝචිත වර්ෂය අවසානයට භෞතික ප්‍රගතිය සියයට 65 ත් 100 ත් අතර වුවද කිසිදු මූල්‍ය ප්‍රගතියක් ලබා නොතිබුණු අතර ඉකුත් වර්ෂය තුළ වැඩ ආරම්භකරන ලද

රු. මිලියන 26.76 ක උපදේශන සේවා කොන්ත්‍රාත් 10 ක වැඩ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවසන්ව නොතිබුණි.

(ශ) සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූ ව්‍යාපෘති 03 ක ඉදිකිරීම් වැඩ සඳහා රු. මිලියන 3.86 ක් සංස්ථාව වැයකර තිබුණු අතර ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ වර්ෂය තුළ ක්‍රියාත්මක කළ යුතු රු. මිලියන 34.51 ක් වටිනා ව්‍යාපෘති 04 ක ඉදිකිරීම් කිරීමට සංස්ථාව අපොහොසත්ව තිබුණි.

(ග) සමාලෝචිත වර්ෂය අවසානයට සේවාදායක ව්‍යාපෘතියක් වූ කිරි මණ්ඩල මාවත යෝජිත ගංවතුර පාලන සහ ජල සම්පත් කළමණාකරන මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ වැඩ ඉකුත් වර්ෂයේදී ආරම්භ කර සමාලෝචිත වර්ෂයේදී අවසන් වීමට නියමිතව තිබුණද එදිනට කොන්ත්‍රාත්තුවේ මූල්‍ය සහ භෞතික කාර්ය සාධනය පිළිවෙලින් සියයට 10 ක් හා සියයට 15 ක පහළ මට්ටමකට පැවතුණි. සංස්ථාවේ කොන්ත්‍රාත් කටයුතු නිසි කළමනාකරණයක් නොකිරීම මෙම තත්ත්වයට බලපා තිබුණි. තවද මෙම කොන්ත්‍රාත්තුවෙන් සංස්ථාවට අලාභයක් සිදු වීමේ අවධානම විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ඝ) සේවාදායක ව්‍යාපෘතියක් වූ පැලියගොඩ කුණු බැහැර කරන ඉඩම වැඩි දියුණු කිරීම වෙනුවෙන් වැඩ පූර්ව අත්තිකාරම් නොගෙන සංස්ථාව රු. මිලියන 4.27 ක් වැය කර තිබුණද එම ඉදිකිරීම් අතර මග නවතා දමා තිබූ අතර එම මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ලබා ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(ඞ) එමෙන්ම වැඩ පූර්ව අත්තිකාරම් ලබා නොගෙන රු. මිලියන 545.06 ක් වටිනා සේවාදායක ව්‍යාපෘති 04 ක් සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කර තිබුණු අතර මෙලෙස කොන්ත්‍රාත් ඉටු කිරීම විගණනයේදී ප්‍රශ්නකාරී විය. තවද මෙම ව්‍යාපෘති සම්බන්ධව දෙපාර්ශවය අතර විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඟ) සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාව ක්‍රියාත්මක කළ සේවාදායක ව්‍යාපෘති 7 ක කළ වැඩ සඳහා සංස්ථාව අයකර නොගත් වටිනාකම රු. මිලියන 232.21 ක් වූ අතර එය මුළු කළ වැඩ වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස සියයට 74 ක් විය. සංස්ථාව කාලීනව ඉන්වොයිස් ඉදිරිපත් නොකිරීම, අනුමැතියකින් තොරව අමතර වැඩ සිදු කිරීම, ප්‍රමාණ පත්‍ර රේටයන් අනුමත කර නොගැනීම, ඉදිකිරීම්වල ගැටළු පැවතීම මෙයට සෘජුව බලපා තිබුණි.

(ච) සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් වැඩ අවසන් කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 266.84 ක් වූ ව්‍යාපෘති 5 ක අවසාන බිල්පත ඉදිරිපත් කර මාස 05 ත් 11 ත් අතර කාලයක් ගත වුවද ඒ වෙනුවෙන් සංස්ථාව දරන ලද රු. මිලියන 73.35 ක් සංස්ථාවට අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ල) එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසාන වන විට සම්පූර්ණයෙන් වැඩ අවසන් කළ රු.මිලියන 254.92 ක කොන්ත්‍රාත් 4 ක් සඳහා රු. මිලියන 210.08 ක බිල්පත් සංස්ථාව ඉදිරිපත් කර තිබුණද ඒ වෙනුවෙන් කිසිදු මුදලක් සංස්ථාවට ලැබී නොතිබුණි. මෙයින් රු. මිලියන 165.97 ක් ඉකුත් වර්ෂයේ වැඩ අවසන් කළ කොන්ත්‍රාත් කටයුතු වෙනුවෙන් ලැබිය යුතු වටිනාකම් විය.

(ස) සමාලෝචිත වර්ෂය අවසාන වන විට සංස්ථාව විසින් ඉකුත් වර්ෂවල ඉටුකරන ලද කොන්ත්‍රාත් 12 ක් වෙනුවෙන් සංස්ථාවට අයවිය යුතු රු. මිලියන 52.90 ක් බොල් ණය ලෙස කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණු අතර සංස්ථාවේ ප්‍රමාණ පත්‍රවල සඳහන් මිල රේටයන් අනුමත නොකිරීම, කොන්ත්‍රාත් අතර මග නවතා දැමීම, රදවාගත් මුදල් කාලීනව අයදුම් නොකිරීම මෙම තත්ත්වයට සෘජුව බලපා තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසානය වන විට සේවාදායකයින්ගෙන් සංස්ථාවට අයවිය යුතු වර්ෂ 05 ඉක්මවූ වටිනාකම රු. 40.89 ක් වූ අතර වර්ෂ 05 ත් 10 ත් අතර අයවිය යුතු වටිනාකම රු. මිලියන 14.34 ක් විය. මෙම ශේෂයන්ද කඩිනමින් ලබා ගැනීමට සංස්ථාව ක්‍රියාමාර්ග නොගතහොත් එම විටනාකම්ද සංස්ථාවට අහිමි වීමේ වැඩි අවධානමක් පවතින බව වැඩි දුරටත් විගණනයේදී අනාවරණය විය.

(හ) එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාව ඉටුකරන ලද කොන්ත්‍රාත් 98 ක කළ වැඩ වටිනාකම රු.මිලියන 5,110 ක් වුවද ඉන් රු. මිලියන 1076 කළ වැඩ සහතික කිරීමට සේවා දායකයින් කටයුතු කර නොතිබුණි. එමෙන්ම සහතික කරන ලද කළ වැඩ වටිනාකමින් තව දුරටත් සංස්ථාවට අයවිය යුතු වටිනාකම රු. මිලියන 391 ක් වූ අතර සේවාදායකයින් රදවාගත් අත්තිකාරම් මුදල රු. මිලියන 258 ක් විය. සංස්ථාව කොන්ත්‍රාත් කළමණාකරණය වෙනුවෙන් වැඩි අවධානයක් යොමු නොකිරීම මෙම තත්ත්වයට ප්‍රධාන හේතුව වී තිබුණි.

(ධ) වේරස් ගහ වැසි ජල අපවහන හා පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ණය චාරික හා ණය පොළී ගෙවීම් රහිතව රු. මිලියන 1340.60 ක කාර්යයන් සමාලෝචිත වර්ෂය තුළදී ඉටු කිරීමට සංස්ථාව සැලසුම් කළද සත්‍ය ලෙස රු. මිලියන 871.97 ක කාර්යයන් පමණක් ඉටු කිරීමෙන් රු. මිලියන 468.63 ක අපේක්ෂිත කාර්යයන් එනම් ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 35 ක කාර්යයන් ඉටුකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් ලබාගත් මුදල රු.මිලියන 1,205 ක් විය.

(ඵ) සමාලෝචිත වර්ෂයේදී ධාවන කටයුතු සඳහා යොදා ගත් සංස්ථාවේ වාහන ගණන 102 ක් වූ අතර කුලී පදනම මත ලබාගත් වාහන ගණන 36 ක් විය. සංස්ථාව සතු වාහන වලින් 18 ක් නිලධාරීන්ට අනුයුක්තව පැවැති අතර වාහන 19 ක් සංචිත වාහන

ලෙස පැවතුණි. ඒ අනුව සංස්ථාවේ සංචිත වාහන ලෙස පැවැතිය යුතු වාහන 65 ක්. ප්‍රවාහන නිලධාරියාගේ අධික්ෂණයකින් තොරව සංස්ථාවේ විවිධ අංශවලට අනුයුක්ත කර තිබුණි. මෙම වාහන සංස්ථාවේ ප්‍රවාහන අංශය මඟින් පාලනය නොවන බැවින් ඒවා නිසි ධාවනයකට ලක් නොවන බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර කුලී පදනම් මත වාහන ලබාගැනීමට මෙම තත්ත්වය සෘජුව බලපා ඇති බව විගණනයේදී හෙළිදරව් විය. සංස්ථාව සතු වාහන සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 28.15 ක් ඉන්ධන වෙනුවෙන් දරා තිබූ අතර රු. මිලියන 51.54 ක් කුලී පදනම් මත ලබාගත් වාහන සඳහාද ගෙවා තිබුණි.

(එ) සංස්ථාව සතු බෙල්ලන්විල පැවැති වෙළඳ කුටි 06 ක් 2016 වර්ෂයේ සිට කුලී පදනම් මත ලබා දීමට කටයුතු නොකර වසා දමා තිබුණු අතර, එම හේතුවෙන් සංස්ථාවට අහිමි වූ ආදායම රු.මිලියන 21.60 ක් පමණ විය.

(ර) සංස්ථාව විසින් ඉකුත් වර්ෂයේ සිට දියත උයන පරිශ්‍රයේ ක්‍රියාත්මක කරනු ලබන බෝට්ටු සේවා වලින් අයකරන ගාස්තු ඒ වෙනුවෙන් දරණ වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සාමාලෝචිත වර්ෂයේ සංස්ථාවට සිදුවූ පාඩුව රු.මිලියන 16.96 ක් විය.

(ෂ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් ක්‍රියාත්මක කළ මහා භාණ්ඩාගාර ව්‍යාපෘති 64 ක් වෙනුවෙන් රු. මිලියන 1559.62 ක් වැය කළද, ඒ වෙනුවෙන් ලැබුණු මුදල් රු. මිලියන 1,348.73 ක් වූයෙන් එම ව්‍යාපෘති වලින් සංස්ථාවට සිදුවූ පාඩුව රු. මිලියන 201.89 ක් විය. මෙම ව්‍යාපෘති සේවා කටයුතු වෙනුවෙන් මහා භාණ්ඩාගාරය සංස්ථාවට සියයට 17 සා සේවා ආදායමක් ලබා දුන්නද මෙලෙස පාඩුවක් සිදු වීම විගණනයේදී ප්‍රශ්නකාරී විය.

(ස) සංස්ථා පනතේ 3අ(1) යටතේ සංස්ථාවට පවරාගෙන විකිණීම් මඟින් බැහැර කරනා ඉඩම් සඳහා අදාල නොදියුණු වටිනාකම් වෙනුවෙන් ඉඩම් කොමසාරිස්වරයා වෙත සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගෙවිය යුතු මුදල රු. මිලියන 49.62 ක් වූ අතර එම මුදල් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ධ) මහකොළඹ ගංවතුර පාලනය සහ පාරිසරික වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ජල රැඳවුම් ප්‍රදේශ ලෙස වෙන්කර තැබීමට සංස්ථාව විසින් පවරාගත් නාවල - ඕන් ඇල ජල රක්ෂිත ප්‍රදේශ තුල පැවති හෙක්ටයාර 02 ක භූමි ප්‍රමාණයක රු. මිලියන 173.70 ක් වැය කර සංස්ථාව විසින් ක්‍රිකට් ක්‍රීඩාංගනයක් ඉදිකර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙම ක්‍රීඩාංගනය භාවිතයට ගෙන නොතිබුණි.

(හ) 2018 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය 1,875 ක් වූ අතර එදිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 1,431 ක් වීමෙන් සංස්ථාවේ කාර්ය මණ්ඩලයේ 405 ක පුරප්පාඩු හා අතිරික්ත 39 ක් විය.

(ව) සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවේ පරිපාලිත සමාගම් වන ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගමෙන් හා එල් ආර් ඩී සී සේවා සමාගමෙන් වැටුප් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත සංස්ථාවට බඳවාගත් කාර්ය මණ්ඩලය පිළිවෙලින් 126 ක් සහ 800 ක් වූ අතර මෙම කාර්ය මණ්ඩලය වෙනුවෙන් සංස්ථාව සමාලෝචිත වර්ෂය අවසානයට වැටුප් වශයෙන් ගෙවන ලද වටිනාකම රු.මිලියන 173.64 ක් විය. එසේ වුවද මෙම වියදම් සඳහා වාර්ෂික අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් කරද නොතිබුණි. කෙසේ වෙතත් මෙම සේවකයින්ද ඇතුලත්ව කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. තවද උක්ත සඳහන් කාර්ය මණ්ඩලයට අමතර සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් සිය වැඩ බිමවල කටයුතු සඳහා දිනකට රු.750 ක දීමනාවක් යටතේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවෙන් සේවකයින් 175 දෙනෙකුගේ සේවයද ලබාගෙන තිබුණි.

(හ) අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමෙදී ගත් තීරණයක් මත සංස්ථාවේ හිටපු සාමාන්‍යාධිකාරිවරිය තාවකාලික පදනම මත රේඛීය අමාත්‍යාංශයට මාරු කර යවා තිබුණි. සමාන්‍යාධිකාරිවරිය වෙනුවෙන් පවත්වන අභ්‍යන්තර විනය පරීක්ෂණයක් මෙම මාරු කිරීමට හේතුවන බවද තීරණය තුළ සඳහන්ව තිබුණි. නමුත් 2019 අගෝස්තු වන විට වර්ෂ 1 ½ වැඩි කාලයක් ගතව තිබුණද එවැනි විනය පරීක්ෂණයක් සංස්ථාව විසින් සිදුකර නොතිබීම විගණනයේදී මතභේදාත්මක කරුණක් වූ අතර සංස්ථාවට කිසිදු සේවාවක් ලබානොගෙන සමාලෝචිත වර්ෂය සඳහා එම නිලධාරිනියට අනෙකුත් පහසුකම් රහිතව වැටුප් වශයෙන් රු. මිලියන 2.29 ක්ද ගෙවා තිබුණි.

(ණ) මැදමුලන ඩී.ඒ. රාජපක්ෂ අනුස්මරණ මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් රු. මිලියන 47.36 ක් ලැබිය යුතු බව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එම ආයතනයේ ශේෂ සනාථ කිරීම් අනුව සංස්ථාවට කිසිදු මුදලක් ගෙවීමට නොමැති බව දන්වා තිබුණි.

(න) හම්බන්තොට සේවා මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් 2014 වර්ෂයේදී සංස්ථාවට ලද රු. මිලියන 68 ක සවලියකරණ අත්තිකාරම් මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට මෙම ව්‍යාපෘතියේ කටයුතු අතර මහ නවතා දමා තිබුණි.

(ම) සංස්ථාව සතු කිඹුලාවෙල පැවැති ආපන ශාලාව සමාගමකට බදු දීම මත ඉකුත් වර්ෂයේ සිට සංස්ථාවට අයවිය යුතු රු. මිලියන 24.58 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට සංස්ථාවට නොහැකි වී තිබුණි.

(ළ) සංස්ථාව විසින් මූලික ශක්‍යතා අධ්‍යයනයකින් තොරව මාදින්නාගොඩ අතුරු ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 112 ක් වැය කර තිබුණද ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් පසුව ඉඩම් අත්පත් කර ගැනීමට සංස්ථාව කටයුතු කිරීම හේතුවෙන් ඇති වූ ගැටළුකාරී තත්ත්වයන් මත මෙම ඉදිකිරීම් අතර මග නවතා තිබුණි. එබැවින් මෙම ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් ලෙස නිරීක්ෂණය විය.

(හ) සංස්ථාව නිසි මූලික අධ්‍යයනයකින් හා සැලසුමකින් තොරව බොල්ගොඩ ඇලෙහි ඉවුරු සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් එම ඇල ඉවුරු කඩා වැටීම නිසා ව්‍යාපෘතිය අතර මග නවතා දමා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ඇල ඉවුරු නැවත ප්‍රතිසංස්කරණය සඳහා සංස්ථාව රු.මිලියන 15.23 ක් වැය කර තිබුණි.

(ඳ) 2013 අගෝස්තු 30 දිනැති අංක 13/1144/503/087 දරන අමාත්‍ය මණ්ඩල තීරණයක් මත වෙරස්ගහ වැසි ජලය අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කොට ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 14,227 ක ණය මුදලක් මහා භාණ්ඩාගාර ඇපකරය මත ජාතික ඉතිරිකිරීමේ බැංකුව මඟින් සංස්ථාව වෙත ලබා දී තිබුණි. ඒ අනුව සංස්ථාව විසින් 2014 ජූලි 14 දින වසර 14 ½ කින් ණය මුදල ආපසු ගෙවීමේ එකඟතාව මත ජාතික ඉතිරි කිරීමේ බැංකුව සමඟ ණය ගිවිසුමකට එළඹ තිබුණි. නුගේගොඩ, රත්තනපිටිය, බොරලැස්ගමුව, පිළියන්දල හා වෙරහැර ප්‍රදේශ වල වර්ෂා සමයේ හටගන්නා ගංවතුර පාලනය කිරීම , පවතින ඇළ මාර්ග පුළුල් කිරීම, ඇළ ඉවුරු ආරක්ෂාව, ගංවතුර රැඳවුම් ප්‍රදේශ ආරක්ෂාකරමින් වැව් ඉදිකිරීම, නව බෝක්කු හා පාලම් ඉදිකිරීමද ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු විය. එමෙන්ම 2017 දෙසැම්බර් 07 දිනැති හා අංක අමප/17/2561/724/112 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි රු. මිලියන 14,227 ක් සඳහා එකඟ වූ ණය ගිවිසුම් අහෝසි කර එදිනට ලබාගත් ණය මුදල වන රු. මිලියන 2,550 වෙනුවෙන් නව ණය ගිවිසුම් එළඹීමට සහ අදාළ ණය වාරික හා පොලී ගෙවීමට අවශ්‍ය මුදල් හා ව්‍යාපෘතිය අඛණ්ඩව කර ගෙන යාම සඳහා වන වියදම් වාර්ෂික අයවැය මඟින් ප්‍රතිපාදනය කිරීමටද යෝජනා වී තිබුණි. එසේ වුවත් ව්‍යාපෘතියේ අසාමාන්‍ය කාල ප්‍රමාදයක් වලක්වා ගෙන නියමිත කාලයට ව්‍යාපෘතිය නිම කළ හැකි නව වැඩ පිළිවෙලක් කළමනාකරණය විසින් හඳුන්වාදී නොතිබුණි. එසේම රු.මිලියන 71.60 ක කොන්ත්‍රාත්කරුවන්ට ලබාදුන් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් අසාමාන්‍ය කාලයක් කොන්ත්‍රාත්කරුවන් අත රඳවා ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

ඩබ්ලිව්.ජී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	සටහන	සමූහය 2018 රු. 000	සමූහය 2017 (ප්‍රතිප්‍රකාශිත) රු. 000	සංස්ථාව 2018 රු. 000	සංස්ථාව 2017 (ප්‍රතිප්‍රකාශිත) රු. 000
ගනුදෙනුකරුවන් සමඟ කොන්ත්‍රාත්වලින් ආදායම	1	8,872,736	9,005,753	7,097,374	7,342,589
සෘජු පිරිවැය	2	(6,059,016)	(6,461,453)	(4,499,760)	(4,966,414)
දළ ලාභය		**2,813,720**	**2,544,300**	**2,597,614**	**2,376,175**
වෙනත් මෙහෙයුම් ආදායම්	3	113,306	211,947	96,028	190,357
දළ ලාභය සමඟ වෙනත් ආදායම්		**2,927,026**	**2,756,247**	**2,693,642**	**2,566,532**
පරිපාලන වියදම්		(1,155,465)	(1,064,798)	(993,829)	(917,959)
ක්‍රමක්ෂය වියදම්		(236,522)	(235,172)	(220,145)	(226,703)
ප්‍රවර්ධන වියදම්		(91,408)	(14,906)	(91,093)	(13,778)
වෙනත් මෙහෙයුම් වියදම්		(63,659)	(72,032)	(63,659)	(70,434)
මෙහෙයුම්වලින් ලත් ලාභය	4	**1,379,972**	**1,369,339**	**1,324,916**	**1,337,658**
මූල්‍ය පිරිවැය	5	(438,286)	(399,690)	(435,467)	(397,705)
මූල්‍ය ආදායම	6	552,475	392,726	541,258	380,498
විලම්බිත ආදායම් ක්ෂය කිරීම	7	189,584	179,561	189,584	179,561
බදු පෙර ලාභය		**1,683,745**	**1,541,936**	**1,620,291**	**1,500,012**
බදුකරණය	8	(495,705)	(379,201)	(472,075)	(359,056)
වර්ෂය සඳහා ලාභය		**1,188,040**	**1,162,735**	**1,148,216**	**1,140,956**
ආරෝපණය කළ ලාභය:					
මව් සමාගමේ සමකොටස් හිමිකරුවන්		1,179,432	1,158,379	1,148,216	1,140,956
පාලනය නොකරන පොළිය		8,608	4,356	-	-
වෙනත් විස්තීර්ණ ආදායම්					
අර්ථදැක්වූ ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභය/(අලාභය)	18	1,556	(22,617)	1,556	(22,617)
PPE ප්‍රත්‍යාගණනය කිරීමේ අතිරික්තය		-	28,126	-	-
වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීර්ණ ආදායම්		**1,556**	**5,509**	**1,556**	**(22,617)**
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම		**1,189,596**	**1,168,244**	**1,149,772**	**1,118,339**
ආරෝපණය කළ හැකි මුළු විස්තීර්ණ ආදායම :					
මව් සමාගමේ සමකොටස් හිමිකරුවන්		1,180,988	1,158,263	1,149,772	1,118,339
සුළු කොටස් හිමි අයිතිය		8,608	9,981	-	-

පිටු අංක 101 සිට 116 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඒකාබද්ධ කොටසකි.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

දෙසැම්බර් 31 වැනි දිනට	සටහන	සමූහය 2018 රු. 000	සමූහය 2017 (ප්‍රතිප්‍රකාශිත) රු. 000	සංස්ථාව 2018 රු. 000	සංස්ථාව 2017 (ප්‍රතිප්‍රකාශිත) රු. 000
වත්කම්					
ජංගම නොවන වත්කම්					
දේපල,පිරියත සහ උපකරණ	9	2,760,452	2,136,164	2,671,811	2,071,406
අස්පෘශ්‍ය වත්කම්		5,031	804	4,034	-
දේපල ආයෝජන	10	1,893,358	1,361,098	1,893,358	1,361,098
අනුබද්ධිත ආයතනවල ආයෝජන	11	-	-	2,000	2,000
සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල්	12	-	-	128,250	-
විලම්බිත බදු වත්කම්		77,208	77,496	50,603	50,688
		4,736,049	**3,575,562**	**4,750,056**	**3,485,192**
ජංගම වත්කම්					
තොගය	13	2,486,950	1,450,798	2,417,199	1,374,193
වෙළඳ හා වෙනත්ලැබිය යුතු මුදල්	14	6,629,355	6,791,149	5,859,322	6,166,319
බදුකරණය		408	-	-	-
සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල්	12	-	-	78,105	87,646
කල්පිරීම සඳහා රඳවාගෙන ඇති මූල්‍ය වත්කම්		3,752,965	2,926,710	3,602,876	2,796,595
මුදල් හා මුදල්වලට සමාන දේ	15	980,606	902,794	795,025	823,053
		13,850,284	**12,071,451**	**12,752,527**	**11,247,806**
මුළු වත්කම්		**18,586,333**	**15,647,013**	**17,502,583**	**14,732,998**
සමකොටස් හා බැරකම්					
ප්‍රාග්ධන හා සංචිත					
දායක ප්‍රාග්ධනය		1,000	1,000	1,000	1,000
වත්කම් ප්‍රතිස්ථාපන සංචිත		1,471	1,471	-	-
වත්කම් ප්‍රත්‍යාගණන සංචිත		19,646	22,501	-	-
ප්‍රාග්ධන සංචිත		13,461	13,461	13,461	13,461
රඳවාගත් ඉපැයීම්		6,075,922	4,892,079	5,825,326	4,675,554
සුළු කොටස් හිමි අයිතිය		69,232	60,624	-	-
මුළු ප්‍රාග්ධන සංචිත		**6,180,732**	**4,991,136**	**5,839,787**	**4,690,015**
ජංගම නොවන බැරකම්					
වෛද්‍ය අරමුදල		56,909	44,631	56,909	44,631
අත්පත් කරගත් ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි		212,363	214,366	212,363	214,365
විලම්බිත බදුකරණ බැරකම		193,353	196,285	193,353	195,001
විලම්බිත ආදායම	16	863,205	832,735	863,205	832,735
පොළියක් දරන ණය සහ ලබා ගැනීම්	17	3,020,891	14,599	2,996,781	-
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	18	386,811	381,848	266,448	263,916
		4,733,532	**1,684,464**	**4,589,059**	**1,550,648**
ජංගම බැරකම්					
පොළියක් දරන ණය සහ ලබා ගැනීම්	17	685,452	2,810,319	678,859	2,802,020
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල්	19	2,733,193	2,328,714	2,084,279	1,772,848
සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු මුදල්	20	-	-	104,170	121,764
බදුකරණය		313,585	381,202	287,531	365,233
ඉඩම් ගොඩකිරීම් සඳහා වෙන්කිරීම්		534,805	351,126	534,805	351,127
ගෙවිය යුතු ලාභාංශ		910	1,222	-	-
අත්තිකාරම් ලැබීම්	21	3,384,093	3,047,549	3,384,093	3,047,549
බැංකු අයිරා	15	20,031	51,281	-	31,794
		7,672,069	**8,971,413**	**7,073,737**	**8,492,335**
මුළු බැරකම්		**12,405,601**	**10,655,877**	**11,662,796**	**10,042,983**
මුළු සමකොටස් සහ බැරකම්		**18,586,333**	**15,647,013**	**17,502,583**	**14,732,998**

පිටු අංක 101 සිට 116 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඒකාබද්ධ කොටසකි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇත.

අත්සන් කළේ:

ජේ.ඒ.පී.කේ. ජයසිංහ
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

ඉංජි. කේ. රාජපක්ෂ
සාමාන්‍යාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වග කියනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල සඳහා සහ වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන අනුමත කර සහ අත්සන් කරන ලද්දේ:

රොෂාන් ගුණවර්ධන
සභාපති
2019 අප්‍රේල් මස 04 වැනි දින

අනුර ගුණවර්ධන
උප සභාපති

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

සමූහය

ක්‍රමක්ෂය	දායක ප්‍රාග්ධනය රු'000	ප්‍රාග්ධන සංචිත රු'000	වත්කම් ප්‍රතිෂ්ඨාපිත සංචිත රු'000	වත්කම් ප්‍රත්‍යාගණන සංචිත රු'000	රඳවාගත් ඉපැයීම් රු'000	සුළු කොටස් හිමි අයිතිය රු'000	එකතුව රු.000
2017.01.01 දිනට ශේෂය	1,000	13,461	1,471	-	3,756,317	50,643	3,822,892
2017 වර්ෂය සඳහා ලාභය	-	-	-	-	1,158,379	4,356	1,162,735
අර්ථදැක්වූ ප්‍රතිලාභ සැලැසුම් මත ආයුගණක ලාභය	-	-	-	-	(22,617)	-	(22,617)
දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේ අතිරික්තය				22,501		5,625	28,126
2017.12.31 දිනට ශේෂය (ප්‍රතිප්‍රකාශිත)	**1,000**	**13,461**	**1,471**	**22,501**	**4,892,079**	**60,624**	**4,991,136**
2018 වර්ෂය සඳහා ලාභය	-	-	-	-	1,179,432	8,608	1,188,040
අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම මත ආයුගණක ලාභය	-	-	-	-	1,556	-	1,556
ප්‍රත්‍යාගණනය කළ වත්කම් බැහැර කිරීම	-	-	-	(2,855)	2,855	-	-
2018.12.31 දිනට ශේෂය	**1,000**	**13,461**	**1,471**	**19,646**	**6,075,922**	**69,232**	**6,180,732**

සංස්ථාව

	දායක ප්‍රාග්ධනය රු.000	ප්‍රාග්ධන සංචිත රු.000	රඳවාගත් ඉපැයීම් රු.000	එකතුව රු.000
2017.01.01 දිනට ශේෂය	1,000	13,461	3,557,215	3,571,676
2017 වර්ෂය සඳහා ලාභය	-	-	1,140,956	1,140,956
අර්ථදැක්වූ ප්‍රතිලාභ සැලැසුම් මත ආයුගණක ලාභය /(අලාභය)	-	-	(22,617)	(22,617)
2017.01.01 දිනට ශේෂය (ප්‍රතිප්‍රකාශිත)	**1,000**	**13,461**	**4,675,554**	**4,690,015**
2018 වර්ෂය සඳහා ලාභය /(අලාභය)	-	-	1,148,216	1,148,216
වෛද්‍ය අරමුදල මත ශුද්ධ බලපෑම	-	-	-	-
අර්ථදැක්වූ ප්‍රතිලාභ සැලැසුම් මත ආයුගණක ලාභය /(අලාභය)	-	-	1,556	1,556
2018.12.31 දිනට ශේෂය	**1,000**	**13,461**	**5,825,326**	**5,839,787**

පිටු අංක 101 සිට 116 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඒකාබද්ධ කොටසකි.

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	සමූහය		සංස්ථාව	
	2018	2017 (ප්‍රතිප්‍රකාශිත)	2018	2017 (ප්‍රතිප්‍රකාශිත)
	රු.000	රු. 000	රු. 000	රු. 000
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය				
බදු පෙර ශුද්ධ ලාභය/(අලාභය)	1,683,745	1,541,936	1,620,291	1,500,012
ගැලපීම් ;				
ක්‍රමක්ෂය	163,720	260,790	143,526	249,294
විලම්බිත ආදායම් ක්‍රමක්ෂය කිරීම	(189,584)	(179,561)	(189,584)	(179,561)
අවිනිශ්චිත ණය සඳහා වෙන්කිරීම්	57,815	18,893	41,216	(132,300)
විදේශ විනිමය අලාභ	15,242	-	15,242	-
කපා හල බොල් ණය සහ අලාභ	1,630	-	645	-
කපා හල හිමකම් නොපෑ රඳවාගැනීම්	(206)	-	(206)	-
මූල්‍ය පිරිවැය	437,439	398,842	434,619	395,430
මූල්‍ය ආදායම	(552,475)	(392,726)	(541,258)	(356,989)
දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ විකිණීමෙන් ලත් ලාභය	(1,721)	(171)	(1,847)	(171)
සෙමින් සංසරණය වන තොග සඳහා වෙන් කිරීම	(1,041)	(187)	(1,041)	(187)
වන්දි ගෙවීම් සඳහා වෙන්කිරීම්	847	848	847	848
කල්බදු ඉඩම් ක්‍රමක්ෂය	318	121	318	121
අර්ථදැක්වූ ප්‍රතිලාභ බැඳීම් සඳහා වෙන්කිරීම්	58,195	61,511	41,093	38,675
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය	**1,673,924**	**1,710,296**	**1,563,861**	**1,515,172**
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්				
තොගය (වැඩිවීම) / අඩුවීම	(1,385,789)	494,048	(1,392,646)	499,865
ලැබූ අත්තිකාරම් (වැඩිවීම) / අඩුවීම	336,544	(297,049)	(336,549)	(214,307)
වෙළඳ හා වෙනත්ලැබිය යුතු මුදල් - (වැඩිවීම) / අඩුවීම	102,349	(1,666,127)	368,171	(1,613,919)
සම්බන්ධිත පාර්ශවවලින් ලැබිය යුතු මුදල් - වැඩිවීම / (අඩුවීම)	-	-	2,684	(50,121)
සම්බන්ධිත පාර්ශවවලට ලැබිය යුතු මුදල් - වැඩිවීම / (අඩුවීම)	-	-	(17,594)	85,629
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල් - වැඩිවීම / (අඩුවීම)	392,201	598,396	304,324	501,483
මෙහෙයුම්වලින් ලත් මුදල්	1,119,229	839,564	1,167,349	723,802
ගෙවූ ආදායම් බදු	(565,966)	(127,863)	(551,341)	(111,973)
ගෙවූ පාරිතෝෂික	(51,676)	(45,800)	(37,006)	(32,540)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල්	**501,587**	**665,901**	**579,002**	**579,289**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය				
දේපල පිරියත හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම	(579,981)	(282,406)	(528,285)	(277,192)
ස්ථාවර තැන්පතුවල ශුද්ධ ආයෝජනය	(826,255)	(1,647,171)	806,281	(1,634,721)
ලැබූ පොළී ආදායම	545,134	265,835	435,644	265,835
දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ විකිණීමෙන් ලැබීම්	29,521	113	2,220	113
ආයෝජන ක්‍රියාකාරකම්වල යෙදවූ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**(831,581)**	**(1,663,629)**	**(896,702)**	**(1,645,965)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහය				
ගෙවූ පොළිය සහ වන්දි	(2,002)	(1,206)	(2,002)	(1,206)
ලැබුණු ණය	1,036,700	-	1,030,000	-
ණය නැවත ගෙවීම	(157,102)	-	(156,379)	-
අනුබද්ධිත සමාගම්වලට දුන් ණය	-	-	(118,750)	-
ණය සඳහා ගෙවූ පොළිය	(431,403)	(386,210)	(431,403)	(385,493)
ගෙවූ කල්බදු වාරික	(7,137)	(7,975)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වල යෙදවූ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**(439,056)**	**(395,391)**	**321,466**	**(386,699)**
මුදල් සහ මුදල් හා සමාන දෑවල වැඩිවීම/(අඩුවීම)	109,062	(1,393,119)	3,766	(1,453,375)
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ	851,513	2,244,632	791,259	2,244,634
වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ (සටහන 15)	**960,575**	**851,513**	**795,025**	**791,259**

පිටු අංක 101 සිට 116 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඒකාබද්ධ කොටසකි.

වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

1. සංයුක්ත තොරතුරු

1.1 වාර්තාකරණ ආයතනය

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව රාජ්‍ය සංස්ථාවක් වන අතර ශ්‍රී ලංකාවේ පිහිටා ඇත. සංස්ථාව, 1968 අංක 15 දරන පනතින් 1968 වර්ෂයේ සැප්තැම්බර් මස 22 දින සංස්ථාගත කර ඇත.

සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාර ස්ථානය අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය යන ස්ථානයේ පිහිටා ඇත.

1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2016 දෙසැම්බර් මස 31 වැනි දිනට සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශනවලට සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගම් දෙකෙහි (එක්ව ගත්කළ "සමූහය" ලෙසින් හඳුන්වන) ගිණුම්වලින් සමන්විත වේ. සංස්ථාව සහ එහි අනුබද්ධිත ආයතනයට දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් පවතී. ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට හඳුනාගත හැකි කිසිදු මව් සමාගමක් නොමැත. සමූහයෙහි අවසන් මව් සමාගම සංස්ථාව වේ.

1.3 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම්වල ස්වභාවය

වර්ෂය තුළදී සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගම්වල ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

ආයතනයේ නම	ව්‍යාපාරවල ස්වභාවය
ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව	අපවහන වැඩි දියුණු කිරීම්, ඉඩම් සංවර්ධනය කිරීම්, නාගරික භූමි අලංකරණ, තෙත් බිම් කළමනාකරණය, සිවිල් ඉදිකිරීම සහ සම්බන්ධිත ඉංජිනේරු සේවාවන් සැපයීම
ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සීමාසහිත සමාගම	සිමෙන්ති ගල් සහ පෙර වාත්තු අයිතම නිෂ්පාදනය කිරීම. සිවිල් ඉදිකිරීම්
LRDC සර්විසස් (පෞද්.) සමාගම	ආරක්ෂක සහ මෑන්පවර් සේවා සැපයීම

සංස්ථාවේ පරිපාලිත සමාගම් දෙකම සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇත.

2. වැදගත් ගිණුම් ප්‍රතිපත්තිවල සාරාංශය

2.1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1.1 සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA Sri Lanka) විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සමූහයේ ඒකාබද්ධ ගිණුම්කරණ ප්‍රකාශන සකස් කර ඇත.

2.1.2 අගය කිරීමේ පදනම

ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට අගය කරන ලද මූල්‍ය වත්කම් සඳහා හැර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

2.1.3 ඉදිරිපත් කිරීමේ හා ක්‍රියාකාරී මුදල් වර්ගය

සමූහයේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

2.1.4 අනුකූල වීමේ ප්‍රකාශනය

2018 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රවාහය සමඟ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ("මූල්‍ය ප්‍රකාශන") ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සකස් කර ඇත.

2.1.5 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් ලෙසින් ඉදිරියටත් පැවතීමේ හැකියාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංස්ථාව සහ එහි පරිපාලිත සමාගම් පිළිබඳව ඇගයීමක් සිදු කර ඇති අතර මෙහෙයුම් ඇවර කිරීමට හෝ අඩු කිරීමට ඔවුන්ගේ අදහසක් නොමැත.

2.1.6 සංයුක්ත තොරතුරු

"මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත- LKAS 01 ට අනුකූලව සංස්ථාව සහ සමූහය විසින් පසුගිය වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමඟ ගිණුම්කරණ ප්‍රතිපත්ති ඒකාකාරව යොදාගෙන ඇත. වර්තමාන ඉදිරිපත් කිරීම් හා අනුකූල වන පරිදි සංසන්දනාත්මක තොරතුරු අවශ්‍ය අවස්ථාවලදී නැවත වර්ගීකරණය කර ඇත.

වැදගත් ගිණුම් ප්‍රතිපත්ති (ඉදිරියට.,)

2.1.7 ද්‍රව්‍ය සමූහනය සහ හිලව් කිරීම

ගිණුම්කරණ ප්‍රමිතයකින් අවශ්‍ය කරන්නේ නම් හෝ අවසර දෙන්නේ නම් මිස වත්කම් සහ බැරකම්, ආදායම සහ වියදම් හිලව් කිරීම සිදු කරනු නොලැබේ.

එක් එක් අයිතම ද්‍රව්‍ය වර්ගය මූල්‍ය ප්‍රකාශනවල වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත. අදාල වන්නේ නම් පමණක් සමාන ස්වභාවයේ අයිතම හෝ කාර්යයන් එක් කර ඉදිරිපත් කරනු ලැබේ.

2.1.8 සැලකිය යුතු ගිණුම්කරණ තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන

සමූහයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වාර්තා කර ඇති ආදායම, වියදම්, වත්කම් සහ බැරකම් වටිනාකම් සහ අනාවරණය කිරීම් සඳහා බලපෑම් ඇති කරනු ලබන තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීමට කළමනාකාරිත්වයට සිදු වේ.

මෙම තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන හේතුවෙන් වත්කම් හා බැරකම්වල පවතින වටිනාකමට සිදුවන කවර හෝ සැලකිය යුතු ගැලපීමක් තදනන්තර මූල්‍ය වර්ෂයේදී සලකා බලනු ලැබේ.

2.2 ඒකාබද්ධ වීමේ පදනම

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, 2018 දෙසැම්බර් මස 31 වැනි දිනට සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශනවලින් සමන්විත වේ. අත්පත් කරගත් දින සිට පරිපාලිත සමාගම් ඒකාබද්ධ වන අතර එදින සිට සමූහය විසින් පාලනය ලබා ගන්නා අතර එම පාලනය අවසන් වන දින දක්වා ඒකාබද්ධ වී සිටී.

අ) පරිපාලිත සමාගම්

පරිපාලිත සමාගම් යනු මූල්‍ය සහ මෙහෙයුම් ප්‍රතිපත්ති සෘජුව පාලනය කිරීම සඳහා සමූහයට බලය පවතින සාමාන්‍යයෙන් ඡන්ද හිමිකමෙන් අඩකට වඩා වැඩි කොටස් හිමිකාරිත්වයක් දරන සියලු ආයතන වේ. සමූහය විසින් වෙනත් ආයතනයක් පාලනය කරනු ලබන්නේද යන්න ඇගයීමේදී, වර්තමානයේදී ක්‍රියාවේ යෙදවිය හැකි හෝ පරිවර්තනය කළ හැකි භව්‍ය ඡන්ද හිමිකාරිත්වයේ පැවතීම සහ බලපෑම සළකා බලනු ලැබේ. පාලනය සමූහයට මාරු කරන ලද දින සිට පරිපාලිත සමාගම් සම්පූර්ණයෙන් ඒකාබද්ධ වේ. එම පාලනය අවසන් වන දිනෙන් ඒවා ඒකාබද්ධතාවයෙන් ඉවත් වේ.

ආයතනයේ නම	ඵලදායී අයිතිය
ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සමාගම	80%
LRDC සර්විසස් (පෞද්.) සමාගම	80%

සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගම්වල මුළු ලාභ සහ අලාභ ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි ඇතුලත් කර ඇත. සංස්ථාවේ මෙන්ම එහි පරිපාලිත සමාගම්වල සියලු වත්කම් සහ බැරකම් ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඇතුලත් කර ඇත.

ආ) සුළු කොටස් හිමි අයිතිය

සමූහයේ ශුද්ධ වත්කම්වල පිටස්තර කොටස් හිමියන්ගේ බැඳියාව සහ පිටස්තර කොටස් හිමියන් සඳහා යෙදිය හැකි බදු පසු ලාභයෙහි ප්‍රමාණය "සුළු කොටස් හිමි අයිතිය" යන මාතෘකාව යටතේ ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි සහ ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි වෙන් වෙන් වශයෙන් දක්වනු ලැබේ.

ඇ) ඒකාබද්ධ වීම මත ඉවත් කරනු ලබන ගනුදෙනු

අන්තර් සමූහ ගනුදෙනුවලින් පැන නගින සියලු අන්තර් සමූහ ශේෂයන්, ආදායම සහ වියදම සහ උපලබ්ධි නොවූ ලාභ සහ අලාභ සම්පූර්ණයෙන් ඉවත් කරනු ලැබේ.

2.3 වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම

2.3.1 දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ

දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ මිලදී ගත් හෝ ඉදිකළ පිරිවැය අඩු කිරීම සමුච්චිත ක්‍රමක්ෂයට දක්වනු ලැබේ. එමඟින් අපේක්ෂිත භාවිතය සඳහා වත්කම ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීම සඳහා ආරෝපණය කළ හැකි කවර හෝ පිරිවැයක් මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැයට ඇතුලත් වේ.

ක්ෂයවීම

දේපල, පිරියත සහ උපකරණවල අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ජීව කාලය තුළ සරල රේඛීය පදනමින් ඒවායේ පිරිවැය කපා හැරීම සඳහා පහත සඳහන් කර ඇති පරිදි ක්‍රමක්ෂය සපයනු ලැබේ.

වැදගත් ගිණුම් ප්‍රතිපත්ති (ඉදිරියට.,)

කල්බදු ඉඩම්	කල්බදු කාල පරිච්ඡේදය තුළ
ගොඩනැගිලි-ස්ථිර	වර්ෂ 20 තුළ
ගොඩනැගිලි-අර්ධ ස්ථිර	වර්ෂ 10 තුළ
ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	වර්ෂ 10 තුළ
කාර්යාල උපකරණ	වර්ෂ 08 තුළ
සැහැල්ලු මගී වාහන	වර්ෂ 05 තුළ
පිරියත, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ	
- පස් ඉවත් කිරීමේ සහ හෑරීමේ උපකරණ	වර්ෂ 10 තුළ
- ද්‍රව්‍ය හැසිරවීමේ උපකරණ	වර්ෂ 10 තුළ
වෙනත් පිරියත සහ යන්ත්‍රසූත්‍ර	වර්ෂ 4 තුළ
සන්නිවේදන උපකරණ	වර්ෂ 4 තුළ
පාපැදි සහ ක්‍රීඩා වැඩපොළ උපකරණ	වර්ෂ 2 තුළ
කන්ටේනර් නිවාස	වර්ෂ 10 තුළ

සින්නක්කර ඉඩම්වල පිරිවැය කපා හැරීම සඳහා ක්ෂය කිරීම් සපයා නොමැත.

වත්කමක ක්‍රමක්ෂය, වත්කම භාවිතයට ගැනීම සඳහා පවතින දින සිට ආරම්භ වන අතර වත්කම හඳුනා නොගන්නා දිනෙන් අවසන් වේ.

2.3.2 ආයෝජන දේපල

ආයෝජන දේපලක් යනු කුලී ආදායමක් උපයා ගැනීම සඳහා තබා ගන්නා දේපල වන අතර සාමාන්‍ය ව්‍යාපාරයක ලෙස අළෙවි කිරීමට හෝ නිෂ්පාදනය සඳහා හෝ භාණ්ඩ හෝ සේවා සැපයීම හෝ පරිපාලන කාර්යයන් සඳහා හෝ භාවිතා කරනු ලබන ඒවා නොවේ. ආයෝජන දේපල අත්පත් කර පිරිවැය සහ තදනන්තර සංවර්ධන පිරිවැයට දක්වනු ලැබේ.

2.3.3 තොගය

යල් පිනු සහ සෙමින් සංසරණය වන අයිතම සඳහා ගෙවිය යුතු දීමනා වෙන් කිරීමෙන් පසු පිරිවැයට සහ ඇස්තමේන්තුගත ශුද්ධ උපලබ්ධි වටිනාකම අඩු කර තොග තක්සේරු කරනු ලැබේ. සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීම සිදු කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තුගත පිරිවැය අඩු කර සාමාන්‍ය ව්‍යාපාරික තොග විකිණිය හැකි මිල ගණන ශුද්ධ උපලබ්ධි වටිනාකම වේ.

තොග ඒවායේ වර්තමාන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය, පහත සඳහන් පිරිවැය සමීකරණය යොදා ගනිමින් ගිණුම්ගත කරනු ලැබේ:-

සාමාන්‍ය තොග - FIFO පදනම මත මිලදී ගත් පිරිවැයට

මුහුදු වැලි තොග - හෑරීමේ පිරිවැය එකතු කිරීම අපතේ යෑම සඳහා ප්‍රතිශතයට

2.3.4 සිදු කෙරෙමින් පවතින කාර්යයන්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට සිදු කෙරෙමින් පවතින දීර්ඝ කාලීන ව්‍යාපෘති හා සම්බන්ධ සිදු කෙරෙමින් පවතින වැඩ, ද්‍රව්‍ය සහ ශ්‍රමය සමන්විත වන සෘජු පිරිවැයට සහ ව්‍යාපෘති සඳහා ආරෝපණය කළ හැකි සෘජු පොදු කාර්ය පිරිවැයට තක්සේරු කරනු ලැබේ.

